වාර්ෂික කාර්යසාධන වාර්තාව 2025

வருடாந்த செயலாற்றுகை அறிக்கை 2025

Annual Performance Report 2025

පරිසර අමාත්‍යාංශය

சுற்றாடல் அமைச்சு

Ministry of Environment

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2025

පරිසර අමාත්‍යාංශය

පරිසර අමාත්‍යාංශය

වෛද්‍ය දම්මික පටබැඳි මැතිතුමා

පරිසර අමාත්‍ය

ඇන්ටන් ජයකොඩි මැතිතුමා

පරිසර නියෝජ්‍ය අමාත්‍ය

අමාත්‍යාංශයේ ප්‍රධාන නිලධාරීන්

කේ. ආර්. උඩුවාවල මහතා
ලේකම්

සුධීර ජයරත්න මහතා
අතිරේක ලේකම් - පාලන

එච් එම් බී වී හේරත් මහතා
අතිරේක ලේකම් - පාලන

ආර් එච් එම් පී අබේකෝන් මිය
අතිරේක ලේකම් - පරිසර , ප්‍රතිපත්ති හා සැලසුම්

ඩී පී සී උදය කුමාර මහතා
අතිරේක ලේකම්- සංවර්ධන

ඩබ් ඩී එස් සී වැලිවත්ත මහතා
අතිරේක ලේකම් - ස්වභාවික සම්පත්

චාන්දනී විජයවර්ධන මිය
අධ්‍යක්ෂ ජනරාල් - ක්‍රමසම්පාදන

ඩබ්.ජී. කුමාරගම මිය
අතිරේක ලේකම් - පරිසර ව්‍යාපෘති හා අධ්‍යාපන පුහුණු

යූ පී එල් ඩී පතිරණ මිය
අධ්‍යක්ෂ ජනරාල් - විමර්ශන

ආර් ඩී එස් ජයතුංග මහතා
අතිරේක ලේකම් - පරිසර සංවර්ධන

අයි එල් සෝමසිරි මහතා
ප්‍රධාන මුල්‍ය නිලධාරී

සුනේත්‍රා පතිරත්න මිය
ප්‍රධාන මුල්‍ය නිලධාරී

අමාත්‍යාංශයට අයත් රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව

- මහාචාර්ය ටර්නි ප්‍රදීප් කුමාර මහතා, අධ්‍යක්ෂ ජනරාල්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

- එස් සී පාලම්කුඹුර මහතා, වන සංරක්ෂක ජනරාල්

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

- එම් එස් එල් ආර් පී මාරසිංහ මහතා, අධ්‍යක්ෂ ජනරාල්

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

- ආචාර්ය චන්දන රාජපක්ෂ මහතා, අධ්‍යක්ෂ ජනරාල්

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

- එච් සී පී ජයවීර මිය, අධ්‍යක්ෂ ජනරාල්

මධ්‍යම පරිසර අධිකාරිය

- තිලක් හේවාවසම් මහතා, සභාපති
- ආර් එස් පී කපිල රාජපක්ෂ මහතා , අධ්‍යක්ෂ ජනරාල්

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

- කේ වී ආර් එස් ගුණසේකර මහතා - සභාපති
- ඒ ජේ එම් ගුණසේකර මහතා, සාමාන්‍යාධිකාරී

රාජ්‍ය දැව සංස්ථාව

- කේ පී එල් නිශාන්ත පටබැඳි මහතා - සභාපති
- ඩබ්ලිව් ඩී සමන්ත මහතා, සාමාන්‍යාධිකාරී (වැ.බ)

ජල සම්පත් මණ්ඩලය

- ආර් එම් එස් බණ්ඩාර මහතා, සභාපති
- ආර් එම් බී සෝමරත්න මහතා, සාමාන්‍යාධිකාරී

ශ්‍රී ලංකා ක්ලයිමෙට් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්

- කේ එච් එම් එච් එච් අබේරත්න මිය, ප්‍රධාන විධායක නිලධාරී (වැ.බ)

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය /සිමාසහිත GSMB තාක්ෂණික සේවා (පුද්ගලික) සමාගම (2025.10.18 දිනැති අංක 2458/65 දරන ගැසට් පත්‍රය අනුව කර්මාන්ත අමාත්‍යාංශය යටතට ගැනේ)

		පටුන	පිටු අංක
1.		**1 පරිච්ඡේදය**	01
	1.1	හැඳින්වීම	01
	1.2	අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර	02
	1.3	ප්‍රධාන කාර්යයන්	03
	1.4	සංවිධාන සටහන	04
	1.5	අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ආයතන	06
	1.6	අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු/ආයතන යටතේ පවතින අරමුදල්	06
	1.7	විදේශ අධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු	06
2.		**2 පරිච්ඡේදය - ප්‍රගතිය**	09
	2.1	පරිසර අමාත්‍යාංශයේ එක් එක් අංශ මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන්වල ප්‍රගතිය	09
	2.1.1	පාරිසරික ප්‍රතිපත්ති විශ්ලේෂණය හා ක්‍රියාකාරී සැලසුම්	09
	2.1.2	ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්ව සංරක්ෂණය	10
	2.1.3	දේශගුණික විපර්යාස අභියෝග ජයගැනීම	11
	2.1.4	වායු සම්පත් කළමනාකරණය	12
	2.1.5	පරිසර සැලසුම් හා ආර්ථික	14
	2.1.6	පරිසර දූෂණ පාලන හා රසායන ද්‍රව්‍ය කළමනාකරණය	16
	2.1.7	ස්වභාවික සම්පත් සංරක්ෂණය	16
	2.1.8	පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම්	17
	2.1.9	අන්තර්ජාතික පාරිසරික සබඳතා	18
	2.1.10	පාරිසරික දින සැමරීම	19
	2.1.11	ආයතනික කටයුතු	21
	2.1.12	මානව සම්පත් සංවර්ධන	21
	2.1.13	අභ්‍යන්තර විගණන	22
	2.1.14	පරිසර ගැටළු පිළිබඳ මහජන පැමිණිලි, අභියාචනා හා මාධ්‍ය වාර්තා	22
	2.1.15	නෛතික කටයුතු	22
	2.1.16	අමාත්‍යාංශයේ අභ්‍යන්තර පද්ධති වෙනස්කම් හා ප්‍රතිසංස්කරණ	22
	2.1.17	වනස්පති වැඩසටහන	24
	2.2	වනජීවී හා වන සම්පත් අංශය	25
	2.3	අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති වල ප්‍රගතිය	28
	2.3.1	එක්ව කළමනාකරණය කිරීම: වන විද්‍යාව, කෘෂිකර්මාන්තය සහ සංචාරක අංශ වෙත ප්‍රජාව කේන්ද්‍ර කරගත් පරිසර පද්ධති මත පදනම් වූ ප්‍රවේශයන් ඒකාබද්ධ කිරීම	28
	2.3.2	ශ්‍රී ලංකාව තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම	30
	2.3.3	ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ POPs පළිබෝධනාශක සහ සෞඛ්‍ය සේවා අංශයේ රසදිය හා අපද්‍රව්‍ය සඳහා වූ ඒකාබද්ධ කළමනාකරණය හා පාරිසරිකව සුදුසු බැහැරලීම	31
	2.3.4	කෘෂිකර්ම, වනාන්තර හා වෙනත් ඉඩම් පරිහරණ ක්ෂේත්‍ර සඳහා විනිවිදභාවය වැඩිදියුණු කළ රාමුවක් සකස් කිරීමේ ව්‍යාපෘතිය	31
	2.3.5	එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැළක්වීමේ සම්මුතියේ වාර්තාකරණය පිළිබඳ දත්ත රැස්කිරීම සඳහා ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩසටහන	32
	2.3 6	දේශගුණික විපර්යාස වල තීව්‍ර වන බලපෑම් මගින් අවදානමට ලක්විය හැකි ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ප්‍රජාවන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම" සඳහා වන කලාපීය ව්‍යාපෘතිය	32
	2.3.7	හවුල්කාරිත්ව සහ නව මුල්‍ය ක්‍රමවේද මගින් ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ ජෛවවිවිධත්වය අනුප්‍රවාහගත කිරීම සහ තිරසර භූමි කළමනාකරණය කිරීමේ	33

		පිටු අංක
	මිනමාටා සම්මුතියට අයත් විශේෂිත ජාත්‍යන්තර වැඩසටහන යටතේ ක්‍රියාත්මක	34
2.3.8	රසදිය අඩංගු හා රසදිය මිශ්‍ර වූ අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ජාතික ධාරිතා වර්ධන ව්‍යාපෘතිය	
2.3.9	ශ්‍රී ලංකාවේ පළමු සහ දෙවන ද්වි වාර්ෂික විනිවිදභාවය පිලිබඳ වාර්තා හා ජාතික සන්නිවේදන වාර්තා එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිලිබඳ රාමුගත සම්මුතියට ඉදිරිපත් කිරීම	34
2.4	අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනවල ප්‍රගතිය	35
2.4.1	මධ්‍යම පරිසර අධිකාරිය	35
2.4.2	ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (ප්‍රයිවට්) ලිමිටඩ්	39
2.4.3	වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව	44
2.4.4	සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය	45
2.4.5	ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව	49
2.4.6	ජල සම්පත් මණ්ඩලය	51
2.4.7	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	52
2.4.8	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	52
2.4.9	ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව	53
2.4.10	රාජ්‍ය දැව සංස්ථාව	54
2.5	ඉදිරියේදී සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහන්	56
3	**3 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය**	59
3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	59
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	61
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	63
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	65
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	65
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	65
3.7	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	66
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	66
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	67
4	**හතරවන පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක**	80
4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක	80
5	**පස්වන පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**	81
5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	81
5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	87
6	හයවන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ	91
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	91
6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න	92
6.3	මානව සම්පත් සංවර්ධනය	92
7	**පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව**	94

01 පරිච්ඡේදය

1.1 හැඳින්වීම

අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද අංක 2412/08 දරණ 2024.11.25 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය අනුව ‘‘පරිසර අමාත්‍යාංශය’’ පිහිටුවන ලදී. ඒ අනුව පරිසර විෂය හා සම්බන්ධ ආයතන පරිසර අමාත්‍යාංශය යටතට ගැනුණු අතර, මෙම අමාත්‍යාංශයට වනාන්තර, වනසතුන්, හා තුරුලතා සංරක්ෂණය කරමින්, තිරසාර පරිසර සංකල්පයෙහි වැදගත්කම පිළිබඳව ජනතාව තුල ආකල්පමය වර්ධනයක් ඇති කිරීම මෙන්ම, වගුරු බිම් හා කඩොලාන අරක්ෂා කිරීම, වන ඝනත්වය සුරක්ෂිත කිරීම හා වන ආවරණය පුළුල් කිරීම, පරිසර දූෂණය වැලැක්වීම හා නවීන කළමනාකරණ හා තාක්ෂණය යොදා ගනිමින් පරිසර වෙනස්කම් සහ කාබන් භාවිතය අවම ආර්ථිකයක් සහිත තිරසාර සංවර්ධනයකට ගැලපෙන පරිදි පරිසර ප්‍රතිපත්ති හා නීති සම්පාදනය, උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ ආයතන මෙහෙයුම් සිදු කිරීමේ කාර්යයන් පවරා ඇත. වර්තමානය වන විට වෛද්‍ය දම්මික පටබැඳි මහතා මහතා විසින් පරිසර අමාත්‍ය ධූරය හොබවන අතර ඇන්ටන් ජයකොඩි මහතා විසින් නියෝජ්‍ය අමාත්‍ය ධූරය හොබවයි.

රාජ්‍ය ප්‍රතිපත්ති හා අනෙකුත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ‘‘තිරසර පරිසරයක්’’ නිර්මාණය කිරීම සඳහා නීති සහ අණපනත්වලට අනුකූලව පරිසර විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන ප්‍රමුඛ කාර්යයන් සඳහා පරිසර අමාත්‍යාංශය නායකත්වය සැපයීම සිදු කරනු ලබයි.

සමාජ ආර්ථික සංවර්ධනය සහ පරිසරය අතර සමතුලිතතාව රැකෙන පරිදි ස්වභාවික සම්පත් භාවිතය, තිරසර කළමනාකරණයේදී සහභාගීත්ව ප්‍රවේශ ක්‍රමවේදය අනුගමනය කිරීම, දේශගුණික විපර්යාසවලින් ඇතිවන පීඩාවන් අවම කිරීම, දැනුම, කුසලතා, ආකල්ප හා මනෝභාවයන් මඟින් ගොඩනැගෙන නීරෝගී ජන සමාජයක් සහ තුළිත පරිසරයක් යන සංකල්ප මල්ඵල ගැන්වීමෙන් තිරසර ජෛව ලෝකයක් අනාගත ශ්‍රී ලාංකික ප්‍රජාව වෙත ළඟා කර දීම උදෙසා පරිසර අමාත්‍යාංශ හා අනුබද්ධිත ආයතන ප්‍රමුඛව සමස්ත රාජ්‍ය යාන්ත්‍රනයේ ආයතනික, නෛතික හා තාක්ෂණික රාමුව ගොඩනැංවීම සඳහා විෂයභාර ඇමතිතුමාගේ උපදෙස් හා නායකත්වය යටතේ ක්‍රියාත්මක කෙරේ.

ඒ සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, රාජ්‍ය දැව සංස්ථාව, ජල සම්පත් මණ්ඩලය හා ශ්‍රී ලංකා ක්ලයිමෙට් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතන සමග පරිසර අමාත්‍යාංශය රටෙහි ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වේගවත් වීමත්, ජනතාවගේ ජීවන ක්‍රමය වෙනස්වීමත්, හේතුවෙන් පරිසරයට ඇතිවන බලපෑම් අවම කිරීම සඳහා සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයේම ආයතනික, නෛතික හා තාක්ෂණික රාමුව ශක්තිමත් කරමින් ජනතාවගේ ජීවන තත්ත්වය තිරසරව හා සකසුරුවම්ව ගොඩනැංවීම සඳහා සුවිශේෂී කාර්යයක් ඉටු කිරීම සඳහා බැඳී සිටී.

මෙම වාර්තාව මගින් පරිසර අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක ආයතන අමාත්‍යාංශයේ සියළු අංශ හා ව්‍යාපෘති මගින් 2025 වර්ෂයේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

1.2 ආයතනයේ දැක්ම හා මෙහෙවර

අමාත්‍යාංශයේ දැක්ම

“තිරසර පරිසරයක් උරුම සංවර්ධිත ශ්‍රී ලංකාවක්”

අමාත්‍යාංශයේ මෙහෙවර

පරිසර කළමනාකරණය පිළිබඳ ජාතික වැඩසටහන් ක්‍රියාවට නංවමින්, වනජීවී සංරක්ෂණය, ස්ථානීය වන සංරක්ෂණය, ශාක හා සත්ත්ව විශේෂ පරිබාහිර සංරක්ෂණය, වෙරළ සංරක්ෂණය හා කළමනාකරණය, සමුද්‍රීය පරිසර දූෂණ පාලනය, භූමි සම්පත් කළමනාකරණය, භූ ජල සම්පත් කළමනාකරණය, තිරසර දැව කර්මාන්තය ප්‍රවර්ධනය, කාබන් උදාසීනත්වය ලගාකරගැනීමට දායකත්වය ලබාදීම මෙන්ම දේශගුණ විපර්යාස හා පරිසර සංරක්ෂණය පිළිබඳ ජාත්‍යාන්තර බැඳීම් තහවුරු කරමින් ස්වභාවික සම්පත් සංරක්ෂණය සහ තිරසර භාවිතය සඳහා නායකත්වය ලබාදීම.

1.3 පරිසර අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්:

- පරිසර සංරක්ෂණය හා කළමනාකරණ පිලිබඳ ප්‍රතිපත්ති සහ සැලසුම් සම්පාදනය කිරීමට අදාළ පාර්ශ්වකරුවන්ට දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.
- ස්වභාවික සම්පත් (ජෛවවිවිධත්ව, ජලය, වාතය, පස හා ඛණිජ ආදී) තිරසර කළමනාකරණයත්, දේශගුණික බලපෑම් හා පරිසර දූෂණය අවම කර ගනිමින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ඉලකක් ලගාකර ගැනීමත්, සඳහා ක්‍රමවේදයන් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- පාරිසරික වෙනස්කම් සහ කාබන් අවම ආර්ථිකයක් සහිත තිරසර සංවර්ධනයක් ඇති කිරීම සඳහා ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කරමින් උපායමාර්ග ක්‍රියාත්මක කිරීම.
- තිරසර පරිසර සංකල්පයෙහි ඇති වැදගත්කම පිලිබඳව මෙන්ම වෙනත් ප්‍රධාන පාරිසරික ක්‍රියාදාමයන් පිළිබඳව ජාතික මට්ටමෙන් ජනතාව දැනුවත් කිරීම.
- ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේ දී පරිසරයට සිදුවන බලපෑම් පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, එම තොරතුරු විශ්ලේෂණය කිරීම සහ එම තොරතුරු මහජනතාව ඇතුළු අදාළ අංශ වලට යොමු කිරීම.
- වගුරු බිම්, කඩොලාන පරිසර පද්ධති, වනාන්තර, වනසතුන්, තුරුලතා ආරක්ෂා කිරීම හා සංරක්ෂණය මඟින් යහපත් වූ පරිසර කළමනාකරණයක් සඳහා නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණ යොදා ගනිමින් රාජ්‍ය රාජ්‍ය නොවන අංශවල හා මහජනතාවගේ කැපවීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.
- නිවාස, දේපල, වගාවන් සඳහා වන සතුන්ගෙන් වන හානිය අවම කර ගැනීමත්, වන අලි - මිනිස් ගැටුම් වැලැක්වෙන පරිදි ගම්මාන හා ජනාවාස ආරක්ෂාව සඳහා ග්‍රාමීය ප්‍රජා දායකත්වයෙන් යුතු ඒකාබද්ධ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- පරිසර හා ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයට අදාළ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම හා පසු විපරමෙන් ලැබෙන තොරතුරු මත පරිසර කළමනාකරණය සඳහා සුදුසු ක්‍රමෝපායයන් යෙදීම.
- වර්තමානය සහ අනාගත පරපුර උදෙසා ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති බහු පාර්ශ්වික පාරිසරික සම්මුතීන්ට අනුකූලව ශ්‍රී ලංකාව විසින් ඉටුකළ යුතු ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම තහවුරු කිරීම හා තවදුරටත් ජාත්‍යන්තර සහයෝගිතාව වර්ධනය කිරීමට පියවර ගැනීම.

1.4 අමාත්‍යාංශයේ සංවිධාන සටහන - පරිසර අමාත්‍යාංශය

පරිසර





#2020/08/01 දිනැති අංක 20/0010/227 දරන අමාත්‍ය ම ණ්ඩල තීරණයට අනුව, එය දරන්නාට මෙෙහ්ගුණිකව සහ කාලානුරූප වර්ධනයක් ලබාදෙන පරිදි අනුමත කර ඇති අතර, විශ්‍රාම යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ වෙනත් ඕනෑම හේතුවක් මත පිටව යාමෙන් එම කාලානුරූ අගෝස්තු වනු ඇත.

* යම් අවස්ථාවක එම කාලානුරූ දරන නිලධාරියා විශ්‍රාම යෑම, ඉල්ලා අස්වීම හෝ වෙනත් හේතුවක් නිසා පුරප්පාඩු ඒවාගොස් එම කාලානුරූ අගෝස්තු ම ව.

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු/ආයතන :

- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
- මධ්‍යම පරිසර අධිකාරිය
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
- රාජ්‍ය දැව සංස්ථාව
- ජල සම්පත් මණ්ඩලය
- ශ්‍රී ලංකා ක්ලයිමෙට් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්

1.6 අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු/ ආයතනය යටතේ පවතින අරමුදල් : ඇත.

- කැළෑ දෙපාර්තමේන්තු අරමුදල
- වනජීවී සංරක්ෂණ අරමුදල
- සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල
- උද්භිද උද්‍යාන භාර අරමුදල (මෙම අරමුදල 2025.07.31 දින සිට අවසන් කර ඇත)
- වෙරළ ආරක්ෂක තෘාග අරමුදල

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (නිබේ නම්)

අ) ව්‍යාපෘතියේ නම	1.එක්ව කළමනාකරණය කිරීම: වන විද්‍යාව, කෘෂිකර්මාන්තය සහ සංචාරක අංශ වෙත ප්‍රජාව කේන්ද්‍ර කරගත් පරිසර පද්ධති මත පදනම් වූ ප්‍රවේශයන් ඒකාබද්ධ කිරීම
ආ) දායක නියෝජිතායතනය	ගෝලීය පාරිසරික පහසුකම (GEF)
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු.මි. 635.9
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	2021 - 2026
අ) ව්‍යාපෘතියේ නම	2. ශ්‍රී ලංකාව තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම
ආ) දායක නියෝජිතායතනය	බහුපාර්ශවික අරමුදල (MLF)
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු.මි. 54.03 (2025)
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	වාර්ෂික වැඩසටහනකි

අ) ව්‍යාපෘතියේ නම	**3. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ POPs පළිබෝධනාශක සහ සෞඛ්‍ය සේවා අංශයේ රසදිය හා අපද්‍රව්‍ය සඳහා වූ ඒකාබද්ධ කළමනාකරණය හා පාරිසරිකව සුදුසු බැහැරලීම**
ආ) දායක නියෝජිතායතනය	**එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)**
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු.මි. 1512
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	2024-2029
අ) ව්‍යාපෘතියේ නම	**4. කෘෂිකර්ම, වනාන්තර හා වෙනත් ඉඩම් පරිහරණ ක්ෂේත්‍ර සඳහා විනිවිදභාවය වැඩිදියුණු කළ රාමුවක් සකස් කිරීමේ ව්‍යාපෘතිය**
ආ) දායක නියෝජිතායතනය	**ගෝලීය පාරිසරික පහසුකම (GEF) / එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)**
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු.මි. 247
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	2023 - 2026
අ) ව්‍යාපෘතියේ නම	5. **එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැළැක්වීමේ සම්මුතියේ අධීක්ෂණය හා වාර්තාකරණය වැඩිදියුණු කිරීමට යොමු කිරීම සඳහා පාර්ශවකාර ආයතන හා වෘත්තිකයන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘතිය (UNCCD) - ගෝලීය පරිසර පහසුකම - 7 -Umbrella IV**
ආ) දායක නියෝජිතායතනය	**ගෝලීය පාරිසරික පහසුකම (GEF)**
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු.මි. 29.497
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	2023 - 2025
අ) ව්‍යාපෘතියේ නම	**6. දේශගුණික විපර්යාස වල තීව්‍ර වන බලපෑම් මගින් අවදානමට ලක්විය හැකි ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ප්‍රජාවන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම" සඳහා**
ආ) දායක නියෝජිතායතනය	**අනුවර්තන අරමුදල (Adaptation Fund)**
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු.මි. 2044.7
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	2025-2029
අ) ව්‍යාපෘතියේ නම	**7. හවුල්කාරීත්ව සහ නව මූල්‍ය ක්‍රමවේද මගින් ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ ජෛවවිවිධත්වය අනුප්‍රවාහගත කිරීම සහ තිරසර භූමි කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය**
ආ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු.මි. 798.45
ඇ) දායක නියෝජිතායතනය	**ගෝලීය පාරිසරික පහසුකම (GEF)**
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	2024 - 2029

අ) ව්‍යාපෘතියේ නම	**8.** මිනමාටා සම්මුතියට අයත් විශේෂිත ජාත්‍යන්තර වැඩසටහන යටතේ ක්‍රියාත්මක රසදිය අඩංගු හා රසදිය මිශ්‍ර වූ අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ජාතික ධාරිතා වර්ධන ව්‍යාපෘතිය
ආ) දායක නියෝජිතායතනය	**එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන (UNEP)**
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු.මි. 32.15
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	2021-2025
අ) ව්‍යාපෘතියේ නම	**9.** ශ්‍රී ලංකාවේ පළමු සහ දෙවන ද්වි වාර්ෂික විනිවිදභාවය පිලිබඳ වාර්තා හා ජාතික සන්නිවේදන වාර්තා එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිලිබඳ රාමුගත සම්මුතියට
ආ) දායක නියෝජිතායතනය	**ගෝලීය පාරිසරික පහසුකම (GEF) / එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)**
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම	රු.මි. 398.6
ඈ) ව්‍යාපෘතියේ කාල සීමාව	2025—2028

02 පරිච්ඡේදය – ප්‍රගතිය

2.1 පරිසර අමාත්‍යාංශයේ අංශ මගින් සිදු කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය

2.1.1 පාරිසරික ප්‍රතිපත්ති විශ්ලේෂණය හා ක්‍රියාකාරී සැලසුම්

ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් (NDC 3.0)

2025 වර්ෂයේදී, ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් (NDC 3.0) එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියෙහි පැරිස් ගිවිසුම වෙත සකස් කර ඉදිරිපත් කරන ලදී. ප්‍රවාහනය, කර්මාන්ත, බලශක්තිය, අපද්‍රව්‍ය කළමනාකරණය, කෘෂිකර්මාන්තය සහ වන වගාව වැනි හරිතාගාර වායු අවම කිරීමේ අංශ ඇතුළු අංශ 16ක් සඳහා සහ කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය, පශු සම්පත්, ජලය, ජෛව විවිධත්වය, වෙරළබඩ සහ සමුද්‍ර, සෞඛ්‍ය, නාගරික සැලසුම්කරණය සහ මානව ජනාවාස, සංචාරක සහ විනෝදාස්වාදය යන ජාතික අනුහුරුවීමේ නිර්ණය කල දායකත්ව ක්ෂේත්‍ර මෙන්ම අලාභ සහ හානි සංශෝධන ක්ෂේත්‍ර මෙයට ඇතුළත් වේ.NDC 3.0 මගින් දේශගුණික අවම කිරීම සහ අනුවර්තන උත්සාහයන් සමස්ත ජාතික සංවර්ධන ප්‍රමුඛතා සමඟ පෙළගැස්වීම සඳහා ඒකාබද්ධ, ආංශික ප්‍රවේශයක් ප්‍රකාශ කරයි.

ජාතික අනුවර්තන සැලැස්ම 2026-2035

2026–2035 ජාතික අනුවර්තන සැලැස්ම (NAP 2.0) , දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2023), යාවත්කාලීන කරන ලද ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්ව (NDC 3.0) සහ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ සමපාත වන අයුරින් සකසා ඇත. එමෙන්ම මෙම සැලැස්ම පැරිස් ගිවිසුමේ අනුවර්තනය පිළිබඳ ගෝලීය ඉලක්කය සහ ආපදා අවදානම් අවම කිරීම සඳහා සෙන්ඩායි රාමුව සමඟ ද අනුකූල වේ. කලාපීය දේශගුණික විස්තාරණය මත පදනම් වූ සුවිශේෂී ප්‍රාදේශීය අවශ්‍යතා ග්‍රහණය කර ගැනීම සඳහා පළාත් අනුවර්තන සැලසුම් (PAPS) සකස් කර ඇත.

යාවත්කාලීන කරන ලද NAP හි දැක්ම වනුයේ දේශගුණයට සම්බන්ධ අවදානම් සහ ජනතාවට, පරිසර පද්ධතිවලට, යටිතල පහසුකම්වලට සහ ආර්ථිකයට සිදුවන හානි හා පාඩු අවම කිරීමෙන් දේශගුණයට ඔරොත්තු දෙන ශ්‍රී ලංකාවක් ගොඩනැගීම වේ. දේශගුණික අවදානමට ලක්විය අනුවර්තන ධාරිතාව වැඩි දියුණු කිරීම සිදු කරනු ලබන අතර මෙම අනුවර්තන සැලැස්ම 2026 දී කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය.

දේශගුණ සෞභාග්‍ය සැලැස්ම Climate Prosperity Plan (CPP)

දේශගුණ සමෘද්ධිය සැලැස්ම යනු දේශගුණ අවධානම් සංසදයෙහි ප්‍රධාන අංගයක් වන අතර එය දේශගුණ විපර්යාස නිසා අවධානමට ලක්වන රටවලට දේශගුණ මූල්‍යමය අවස්ථා ලබා ගැනීමට සහාය වීම සඳහා සැලසුම් කර ඇත. රටේ දිගුකාලීන උපාය මාර්ගයක් ලෙස 2022 දී ශ්‍රී ලංකාව දේශගුණ සමෘද්ධිය සැලැස්ම එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතිය වෙත ඉදිරිපත් කරන ලදී. 2026 වර්ෂයේ ශ්‍රී ලංකාව සිය දේශගුණ සමෘද්ධිය සැලැස්ම යාවත්කාලීන කර කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

ජාතික පාරිසරික ලේබලකරණය පිළිබඳ ජාතික රාමුව ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකාවේ පාරිසරික ලේබල් කිරීම සඳහා වූ ජාතික රාමුව, පරිසර අමාත්‍යාංශය විසින් සකස් කර ඇත. මෙම රාමුවෙහි සාමාන්‍ය නිර්ණායක දැනට කෙටුම්පත් කර ඇති අතර, නිර්ණායක සම්මත කිරීම සහ නිෂ්පාදන පදනම් කරගත් නිර්ණායක සකස් කිරීමේ සැලසුම කෙරෙහි අවධානය යොමු කර ඇත. නිර්ණායක සකස් කිරීමට සමගාමීව රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

තිරසාර නයිට්‍රජන් කළමනාකරණය පිළිබඳ ක්‍රියාකාරී සැලසුම සකස් කිරීම

එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන හා කෘෂිකර්ම අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය, බලශක්ති අමාත්‍යාංශය යන අමාත්‍යාංශ වල සහයෝගයෙන් ශ්‍රී ලංකාව නයිට්‍රජන් කළමනාකරණය සඳහා වූ දළ ජාතික නයිට්‍රජන් කළමනාකරණ සැලසුමෙහි කෙටුම්පත සකස් කිරීමට පියවර ගෙන ඇත. මෙම දළ සැලසුම එක්සත් ජාතීන්ගේ පරිසර සභාවෙහි තීරණ සහ ජාතික පාරිසරික ප්‍රතිපත්ති වලට අනුකූලව සැලසුම් කර ඇත.

2.1.2 ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්ව සංරක්ෂණය

ජාතික ජෛවවිවිධත්ව උපායමාර්ග හා ක්‍රියාත්මක සැලැස්ම (NBSAP)

ශ්‍රී ලංකාව 1992 දී ජෛවවිවිධත්ව සම්මුතියට අත්සන් තබා 1994 දී අපරානුමැතිය ලබා ගත් අතර, එම සම්මුතියේ ප්‍රතිපාදන අනුව ජාතික ජෛවවිවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමේ වගකීම භාර ගෙන ඇත. ඒ අනුව පරිසර අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය විසින් 2016–2022 කාලය සඳහා ජාතික ජෛවවිවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී.

මෙම සැලැස්ම ජෛවවිවිධත්ව සංරක්ෂණය, තිරසර භාවිතය සහ ප්‍රතිලාභ සාධාරණව බෙදාගැනීම අරමුණු කරගෙන ජාතික ඉලක්ක 12ක් හා ක්‍රියාකාරකම් 87ක් හඳුනාගෙන ඇති අතර, ඒවා ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය සහ අදාළ පාර්ශ්වකාර ආයතන විසින් සිදු කරනු ලබයි. මෙම සැලැස්ම ජීවී විශේෂ සංරක්ෂණය, ආක්‍රමණශීලී ආගන්තුක ජීවීන් කළමනාකරණය, ජෛව සුරක්ෂිතාව, පරාග වාහක සංරක්ෂණය, පාරම්පරික දැනුම සංරක්ෂණය සහ කඩොලාන සංරක්ෂණය වැනි ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත.

ජෛවවිවිධත්ව සම්මුතියේ 15 වන පාර්ශ්වකරුවන්ගේ සමුළුවේදී (COP 15) කුන්මිං–මොන්ට්‍රියල් ගෝලීය ජෛවවිවිධත්ව රාමුව සම්මත කරනු ලැබූ අතර, ඒ අනුව ප්‍රධාන ගෝලීය ඉලක්ක පදනම් කරගනිමින් නව ජාතික සැලසුම් සකස් කිරීමට පාර්ශ්වකාර රාජ්‍යයන් එකඟ වී ඇත.

ඒ අනුව පරිසර අමාත්‍යාංශය විසින් ජාතික ජෛවවිවිධත්ව ඉලක්ක (NBTs) සකස් කරමින් පවතින අතර, ශ්‍රී ලංකාව ජාතික ජෛවවිවිධත්ව ඉලක්ක 16ක් ජෛවවිවිධත්ව සම්මුතිය වෙත ඉදිරිපත් කර ඇත. මෙම ඉලක්ක මගින් ජෛවවිවිධත්වයට ඇති තර්ජන අවම කිරීම, පරිසර පද්ධති සංරක්ෂණය හා ප්‍රතිසංස්කරණය, ආක්‍රමණශීලී විදේශීය විශේෂ පාලනය, දූෂණය අවම කිරීම, දේශගුණික විපර්යාස බලපෑම් කළමනාකරණය, ජෛව ආරක්ෂාව, ජාන සම්පත් හා සම්බන්ධ ප්‍රතිලාභ බෙදාගැනීම, මූල්‍යකරණය සහ ධාරිතා සංවර්ධනය ඇතුළු ප්‍රමුඛ ක්ෂේත්‍ර ආවරණය කරයි. මේ අනුව නව ජාතික ජෛවවිවිධත්ව උපායමාර්ග සහ ක්‍රියාකාරී සැලැස්ම (NBSAP) 2026 –2030 සකස් කරමින් පවතී.

පුරාජෛවවිවිධත්ව සංචාරක කර්මන්තය වැඩි දියුණු කිරීමේ අරමුණින් රත්නපුර කෞතුකාගාරයේ පුරාජෛවවිවිධත්ව උද්‍යානය, කිතුල්ගල බෙලිලෙන සහ බුන්දල පතිරාජවෙල පුරාජෛවවිවිධත්ව සංචාරක ගමනාන්තයක් ලෙස සංවර්ධනය කරන ලදී. මෙම ස්ථානවලට පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව වැඩි කිරීමේ අරමුණින් රාජ්‍ය නිලධාරීන් සහ සංචාරක මඟ පෙන්වන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදී.

වනජීවී දෙපාර්තමේන්තුව, කෞතුකාගාර දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමඟ එක්ව රත්නපුර කෞතුකාගාරයේ පුරාජෛවවිවිධත්ව උද්‍යානය, කිතුල්ගල බෙලිලෙන හා බුන්දල පතිරාජවෙල පුරාජෛවවිවිධත්ව සංචාරක ගමනාන්තයන් ලෙස සංවර්ධනය කර ඇති අතර මෙම ස්ථානවල සංචාරක පැමිණීම වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.

ජෛවීය ද්‍රව්‍ය වෙත ප්‍රවේශය හා ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදා හදා ගැනීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය

මෙය ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම සඳහා පවත්වන ලද වැඩමුළුවේදී කෘෂිකර්ම අංශයේ නීතිමය පැතිකඩ සහ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර හඳුනා ගැනීම සඳහා විශේෂ කාර්ය කමිටුවක් පිහිටුවන ලදී.

පරිසර අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව අංශය සහ සත්ත්ව විශේෂඥයින්ගේ සහාය ඇතිව, ජාතික රතු දත්ත ලේඛණයේ ඇති සත්ත්ව විශේෂ (ක්ෂීරපායින්, සමනලුන් සහ බත්කූරන්) සංරක්ෂණ තත්ත්වය යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කරමින් පවතී .

ජෛව විවිධත්ව බලපෑම් ඇගයීම

' දිට්වා ' (Ditwah) සුළි කුණාටුව හේතුවෙන් ශ්‍රී ලංකාවේ බලපෑමට ලක් වූ ප්‍රදේශයන්හි ජෛවවිවිධත්වය, පරිසර පද්ධති සහ පාරිසරික සම්පත් කෙරෙහි එල්ල වූ බලපෑම ඇගයීම සඳහා පරිසර අමාත්‍යාංශය විසින් කඩිනම් ජෛවවිවිධත්ව බලපෑම් ඇගයීමක් සිදු කරනු ලබයි.

මෙම ඇගයීම සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණ, භූගෝලීය තොරතුරු පද්ධති (GIS) සහ චන්ද්‍රිකා ඡායාරූප විශ්ලේෂණය මෙන්ම අදාළ රාජ්‍ය ආයතන මගින් ලබාගත් දත්ත ද උපයෝගී කර ගනු ලැබේ. ආරක්ෂිත ප්‍රදේශ, වනාන්තර, තෙත්බිම්, ගංගා ද්‍රෝණි සහ වෙරළබඩ හා සාගර පරිසර පද්ධති ඇතුළු පාරිසරික වශයෙන් සංවේදී කලාප කෙරෙහි මෙහිදී විශේෂ අවධානයක් යොමු කරනු ලබන අතර, ගංවතුර, නායයාම් සහ වෙරළ ඛාදනය හේතුවෙන් සැලකිය යුතු බලපෑම් එල්ල වී ඇත.

ආවේණික සහ වඳවීමේ තර්ජනයට ලක් වූ ජීවී විශේෂවලට මෙන්ම වනජීවී වාසස්ථානවලට ඇති විය හැකි අවදානම් ද මෙහිදී හඳුනා ගැනීමට බලාපොරොත්තු වන අතර මෙමඟින් ලබා ගන්න නිර්දේශ පරිසර පද්ධති ප්‍රතිසංස්කරණය සහ සොබාදහම මත පදනම් වූ විසඳුම් (Nature-based solutions) ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් පදනමක් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2.1.3 දේශගුණික විපර්යාස අභියෝග ජයගැනීම

ශ්‍රී ලංකාව නිරන්තරව ත්‍රීව දේශගුණික විපර්යාස වල බලපෑම් වලට පාත්‍ර වන රටක් වන බැවින් දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් සම්මුතියට 2016 දී අත්සන් තබා ඇත. දේශගුණ සෞභාග්‍ය සැලැස්ම යාවත්කාලීන කිරීම සිදුවෙමින් පවතින අතර මීට සමගාමීව පරිසර අමාත්‍යාංශය, දේශගුණ අවදානම් සංසදය සමඟ එක්ව වැඩමුළුවක් පවත්වන ලදි. මෙම වලංගු කිරීමේ වැඩමුළුවේදි, පාර්ශවකරුවන් විසින් අනුවර්ථනය මත පදනම් වූ පරිවර්තන, තිරසාර බලශක්ති සංක්‍රාන්තිය, දේශගුණ විපර්යාසයන්ට ඔරොත්තු දෙන කෘෂිකර්මාන්තය, පරිසර පද්ධතිවල ඔරොත්තු දීමේ හැකියාව, දේශගුණ සුහුරු ආයෝජන කෙරෙහි අවධානය යොමු කල ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳව සමාලෝචනය කරන ලදී.

දේශගුණික විපර්යාස විෂය පථය පළාත් අනුහුරු සැලසුම් සඳහා ඇතුලත් කිරීම

“ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස බලපෑම් සඳහා වූ ජාතික අනුවර්තන සැලැස්ම 2016 – 2025” මගින් ලබා දී ඇති ප්‍රමුඛතා අනුව, පළාත් අනුවර්තන සැලැස්ම (PAP) හඳුනාගෙන ඇත.මේ යටතේ 2025 වසර තුළ, වයඹ, ඌව, සබරගමුව, දකුණු, උතුරු මැද සහ නැගෙනහිර පළාත් කිහිපයක දේශගුණික අනුවර්තනය සඳහා සූදානම් වීමේ ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කරන ලද අතර, හඳුනාගත් අනුවර්තන අවශ්‍යතා ඒකාබද්ධ කිරීම සඳහා ඒවා නැවත සලකා බැලීම සිදු කරයි. එමෙන්ම පළාත් සංවර්ධන සැලසුම් වලට අනුගත කිරීම ද සිදු කරන ලදී.

දේශගුණික මූල්‍ය, තාක්ෂණය සහ ධාරිතා වර්ධනය සඳහා වන සූදානම අවශ්‍යතා පළාත් දේශගුණ කමිටු හා පළාත් දේශගුණ ඒකක (PCC/PCU) උපදේශන අවශ්‍යතා සංවර්ධනය කේන්ද්‍ර කරගත් ව්‍යාපෘති සඳහා හඳුනා ගන්නා ලදී.

දේශගුණික මූල්‍යකරණය

ව්‍යාපෘති යෝජනා සංවර්ධනය කිරීමේ ධාරිතා ගොඩනැගීමේ වැඩමුළුව

දේශගුණික මූල්‍ය සුරක්ෂිත කිරීම සම්බන්ධ ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සඳහා කුසලතාවය සහ දැනුම ලබා දීම සඳහා පරිසර අමාත්‍යාංශය ප්‍රවේශ මධ්‍යස්ථානය එක්ව වැඩමුළුවක් පවත්වන ලදී.

මෙහිදී සාර්ථක දේශගුණික මූල්‍ය ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දෙන ලද අතර ඒ අනුව, කෘෂිකර්මය, වනාන්තර, ප්‍රවාහනය සහ අපද්‍රව්‍ය අංශ සඳහා කෙටුම්පත් සංකල්ප පත්‍රිකා හතරක් කෙටුම්පත් කරන ලදී. ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති යෝජනා සංවර්ධන ක්‍රියාකාරී කණ්ඩායමේ තාක්ෂණික හැකියාවන් ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් උක්ත සංකල්ප පත්‍රිකා සැකසීමේ වැඩමුළුවේ දෙවන සැසිය බොරැල්ලේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයේදී පවත්වන ලදී.

තරුණ දේශගුණ කතිකාව

ශ්‍රී ලංකාව සඳහා අනාගත දේශගුණික නායකයින් සංවර්ධනය කිරීමේ සැලකිය යුතු පියවරක් සනිටුහන් කරමින්, ජාත්‍යන්තර දේශගුණික ක්‍රියාවලීන්හි ක්‍රියාකාරීව සහභාගී වීමට දැනුම, කුසලතා සහ විශ්වාසය ඇති තරුණ තරුණියන් බල ගැන්වීම අරමුණු කර ගනිමින් තරුණ තරුණියන් 30 දෙනෙකු සඳහා දේශගුණික සාකච්ඡා පවත්වන ලදී. මෙහිදී UNFCCC දේශගුණික සාකච්ඡා සඳහා ඵලදායී ලෙස සම්බන්ධ වීම සඳහා ධාරිතාවය ගොඩනැංවීම සිදු කරන ලද අතර පරිසර අමාත්‍යාංශය , UNICEF සහ පොදුරාජ්‍ය මණ්ඩලීය දේශගුණික මූල්‍ය ප්‍රවේශ මධ්‍යස්ථානය විසින් මෙය සංවිධානය කරන ලදී. මෙම වැඩමුළුවට විශේෂඥ මණ්ඩල, සාකච්ඡා සමාකරණ, අනුවර්තනය, මූල්‍ය සහ සමානාත්මතාවය වැනි ප්‍රධාන දේශගුණික පාලන මාතෘකා පිළිබඳ සාකච්ඡා ඇතුළත් විය.

හරිත දේශගුණ අරමුදල

මෙහි අරමුණ වන්නේ ,

a) ජාතික බලයලත් අධිකාරිය, රටෙහි එකම සෘජු ප්‍රවේශ ආයතනය සහ ප්‍රතිනය සඳහා නම්කර ඇති සෘජු ප්‍රවේශ ආයතන වල ධාරිතාව ගොඩනැගීම.

b) හරිත දේශගුණ අරමුදලේ හඳුනාගත් ආයෝජන සංවර්ධනය ඇතුළුව රටේ පුළුල් දේශගුණික විපර්යාස වැඩසටහන් මෙහෙයවීම සඳහා ශක්තිමත් උපායමාර්ගික රාමු සංවර්ධනය කිරීම.

c) වැඩිදියුණු කළ දේශගුණික ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘති අදහස් සහ සංකල්ප සටහන් සංවර්ධනය හරහා රටේ හරිත දේශගුණ අරමුදලේ හඳුනාගත් ව්‍යාපෘති සංවර්ධනය කිරීම සහ ඉදිරියට ගෙන යාම මගින් දේශගුණික මූල්‍ය වෙත ප්‍රවේශ වීමට රටේ සූදානම ධාරිතාව වැඩිදියුණු කිරීමයි.

ශ්‍රී ලංකාව විසින් ගෝලීය ජල හවුල්කාරිත්වය (GWP) සමඟ සහයෝගයෙන් හරිත දේශගුණික අරමුදල (GCF) වෙත දෙවන NDA ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරන ලදී. එමෙන්ම,මේ යටතේ ප්‍රතීතන උපකාරක කවුළුව සහ ව්‍යාපෘති සංවර්ධන ක්‍රියාකාරී කණ්ඩායම ස්ථාපිත කරන ලදී. දේශගුණික සුහුරු හරිත වර්ධන ක්‍රමෝපාය සහ ආයෝජන සැලැස්ම සකස් කරන ලද අතර මෙම ව්‍යාපෘතිය යටතේ සංකල්ප පත්‍රිකා තුනක් සකස් කරන ලදී.

හරිත දේශගුණික අරමුදල ආශ්‍රිත ක්‍රියාකාරකම්

දේශගුණික විපර්යාසවලට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇති සංවර්ධනය වෙමින් පවතින රටවලට හරිත දේශගුණික අරමුදල (GCF) මූල්‍ය ආධාර සපයයි. පරිසර අමාත්‍යාංශය හරිත දේශගුණික අරමුදලේ ජාතික නම් කරන ලද අධිකාරිය (NDA) වේ.

හරිත දේශගුණ අරමුදලේ (GCF) නැගෙනහිර සහ දකුණු ආසියාවේ උප-කලාපීය ප්‍රධානී ශ්‍රී අනුරාග් මිශ්‍රා මහතා විසින් ශ්‍රී ලංකාවේ සිය නිල සංචාරයේදී ශ්‍රී ලංකාවේ දේශගුණ ක්‍රියාකාරී න්‍යාය පත්‍රයට GCF හි අඛණ්ඩ සහයෝගය තහවුරු කළේය. එසේම ශ්‍රී ලංකාවේ දේශගුණික ඔරොත්තු දීමේ ධීවර කටයුතු පිළිබඳ GCF සංකල්ප සටහන සඳහා විරෝධතා නොමැති බවට ලිපියක් නිකුත් කර ඇත. ශ්‍රී ලංකාවේ GCF ව්‍යාපෘතිවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා විවිධ රටවල් සඳහා GCF හි ව්‍යාපෘති රැස්වීම සහ ජාතික ව්‍යාපෘති සම්බන්ධීකරණ රැස්වීම් පවත්වන ලදී.

හරිත දේශගුණ අරමුදලේ (GCF) නැගෙනහිර සහ දකුණු ආසියාවේ උප-කලාපීය ප්‍රධානී ශ්‍රී අනුරාග් මිශ්‍රා මහතා සමඟ හමුව

2.1.4 වායු සම්පත් කළමනාකරණය

වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය ශ්‍රී ලංකාව තුළ සංසරණ වාතයේ ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රතිපත්ති, උපායමාර්ග හා නීතිමය තත්වයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන ආයතනය වේ.

බහු-දූෂක කාරකයන් හඳුනාගන්නා මධ්‍යස්ථානයට නව උපකරණයක් සවි කිරීම

ප්‍රංශ තාක්ෂණික සහයෝගීත්වය යටතේ කොළඹ නාගරික ප්‍රදේශය තුල වායු තත්ත්ව කළමනාකරණය පිළිබඳ සාක්ෂි පදනම් කරගත් උපාය මාර්ග සහ ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම සඳහා ධාරිතා සංවර්ධනය පිළිබඳ ඉදිරිපත් කරන ලද ව්‍යාපෘතිය මගින් 2025 සැප්තැම්බර් මස අවසානයේදී කොළඹ කොටුව ආශ්‍රිතව මධ්‍යම පරිසර අධිකාරිය විසින් මෙහෙයවන ඉතා ඉහල නිරවද්‍යතාවයකින් යුතුව වායුගෝලීය දූෂක කාරකයන් මැනිය හැකි බහු-දූෂක කාරකයන් හඳුනාගන්නා මධ්‍යස්ථානයට නව උපකරණයක් සවි කරන ලදී.

මෙම ව්‍යාපෘතිය මගින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRO) සහ මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සඳහා වායු දූෂණය ක්‍රමාංකනය කිරීමේ උසස් තාක්ෂණික පද්ධතියක් සහ ශ්‍රී ලංකාවේ වායු දූෂණය මැනීමේ වපසරිය තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා නවීන අඩු වියදම් ක්ෂුද්‍ර සංවේදක පද්ධති ලබා දී ඇත.එමඟින් වාතයේ පවතින PM-10, PM-2.5,NOx, SOX, CO, ඕසෝන් පිළිබඳ දත්තයන් ලබා දෙනු ලැබේ.

මේ යටතේ වායු සම්පත් කළමනාකරණ කමිටුව මගින් පාර්ශවකරුවන් සමඟ විශේෂඥ හා තාක්ෂණික රැස්වීම් පවත්වා ඇත.

ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම (2022-2030) සඳහා පාර්ශවකරුවන් සමඟ එහි රැස්වීම් පවත්වා ඇති අතර වාහන වායු විමෝචන භාරකාර අරමුදල

මඟින් ලබා දෙන තොරතුරු කළමණාකරණට, දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා කටයුතු කිරීම පිළිබඳව, ප්‍රගතිය සමාලෝචනයක් මධ්‍යම පරිසර අධිකාරිය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය එක්ව සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ වායු දූෂණය සඳහා වාහන වලින් සිදුවෙන දායකත්වයට පසුව සැලකිය යුතු මට්ටමක පවතිනුයේ ස්ථානීය ප්‍රභව මඟින් සිදුවන වායු දූෂණය වේ. එනම්, කර්මාන්තශාලා ,විදුලි බලාගාර සහ විවෘත දහනය වැනි ප්‍රභව මඟිනි. එබැවින් සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් සඳහා ප්‍රශස්ථ මට්ටමින් වායු තත්ත්ව කළමනාකරණය කරමින් පවත්වාගෙන යනු ලබන කර්මාන්තශාලා අධ්‍යයන කිරීම සඳහා දිසත්‍රික් මට්ටමින් ක්ෂේත්‍ර අධ්‍යයන වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඇත.

සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් සඳහා වායු දූෂණය පාලනය කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් කුරුණෑගල හා කෑගල්ල දිස්ත්‍රික්කයන්හි තෝරාගත් කර්මාන්තකරුවන් හා මධ්‍යම පරිසර අධිකාරිය හා පළාත් පරිසර අධිකාරියේ නිලධාරීන් ඇතුලත්ව 50 දෙනෙකු පමණ සහභාගීත්වයෙන් සිදු කරන ලද අතර තුල්හිරිය අපනයන කලාපයේ (MAS Fabric Park) එක් දින ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවක් ද සිදු කරන ලදී.

ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව අතරතුර

ගෘහස්ථ වායු තත්ත්ව කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයට අදාලව විවිධ ක්ෂේත්‍රයන් සහ මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් යුතුව පරිසර දිනයට සමගාමීව කලුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී හා කොළඹ, කිලිනොච්චි, අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලදී දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මීට අමතරව, ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ව්‍යාපෘති යෝජනා කැඳවීම සිදු කරන ලද අතර එම ව්‍යාපෘති යෝජනා විමර්ශනය කර, සුදුසු ව්‍යාපෘති තෝරා ගැනීම කමිටුව විසින් සිදු කරන ලදී.

මේ යටතේ 2025 වර්ෂය තුළ ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලදී. එමඟින් වායු දූෂණය සහ ඒ ආශ්‍රිත සෞඛ්‍ය ගැටලු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කර අවසන් කරන ලදී. අදාළ ව්‍යාපෘති සඳහා අවසන් වාර්තා ලබාගෙන ඇති අතර, ඒවා විමර්ශනය කිරීමද සිදුකර ඇත. මේ යටතේ පහත සඳහන් වැඩසටහන් සිදු කරන ලදී.

ගාල්ල දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා රාජ්‍ය නිලධාරීන්, මධ්‍යම ගමනාගමන මණ්ඩලවල කාර්මික නිලධාරීන්, සිසුන් හා ගුරුභවතුන්, ආයෝජන කලාපයේ කර්මාන්තකරුවන් සහ නිලධාරීන්, මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් දැනුවත් කිරීම

- පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් විසින් නාගරික ප්‍රජාව,ගෘහනියන්,පාසල් සිසුන් සහ කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කිරීම.
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් විසින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාසැල් සිසුන් දැනුවත් කිරීම.
- යාපනය දිස්ත්‍රික්කයේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාසැල් ගුරුවරුන්,රාජ්‍ය නිලධාරීන් සහ කර්මාන්තකරුවන් දැනුවත් කිරීම.
- මොණරාගල දිස්ත්‍රික්කයේ විද්‍යා හා තාක්ෂණික නිළධාරීන් විසින් සුලු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්,ව්‍යවසායකයින්,කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම.
- මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිසර සංවර්ධන නිලධාරීන් විසින් පාසැල් සිසුන්, කර්මාන්ත ව්‍යවසායකයින් සහ ප්‍රජා කණ්ඩායම් දැනුවත් කිරීම.

වායු තත්ත්ව කළමනාකරණය සඳහා තිරසාර උපායමාර්ග - ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා න්‍යාය සහ ප්‍රායෝගික මාර්ගෝපදේශය පිලියෙල කිරීම යටතේ "වායු තත්ත්ව කළමනාකරණය සඳහා තිරසාර උපායමාර්ග ඇතුළත්ව ධාරිතා වර්ධනය සඳහා න්‍යාය හා ප්‍රායෝගික මාර්ගෝපදේශ" නම් ප්‍රකාශනය සංවර්ධනය කර ඇත.මෙම ප්‍රකාශනය සකස් කර ඇත්තේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ න්‍යායාත්මක දැනුම වර්ධනය කිරීම සහ එම දැනුම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීමේ අරමණු කර ගනිමින් මෙය පවත්වන ලදී.එමඟින්, ක්ෂේත්‍ර නිලධාරීන්ට වායු ගුණාත්මකභාවය කළමනාකරණය සම්බන්ධ කරුණු පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ හැකියාව වැඩිදියුණු වන අතර, වායු දූෂණය අවම කිරීම සඳහා සාර්ථක ප්‍රවේශයක් සකස් කර ගැනීමට දායකත්වය සැලසෙයි.

රාජ්‍ය ආයතනයන්හි ගෘහස්ථ වායු තත්ත්ව මැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම යටතේ ගෘහස්ථ වායු තත්ත්ව කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයට අදාලව ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනයන්හි වායු තත්ත්ව මැනබැලීමේ වැඩසටහන් වලට අදාලව රාජ්‍ය ආයතන 13ක ගෘහස්ථ වායු තත්ත්ව මැනීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී.

මෙහිදී ජාතික හා අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව CO2, PM10, PM2.5, VOC (වාෂ්පශීලී කාබනික සංයෝග) ෆෝමැල්ඩිහයිඩ් යන සංඝටක පිළිබඳ

මැණීම් කටයුතු සිදු කර ඇත.එමඟින් පරිසරයට නිකුත් වන රසායනික සංයෝග වලට පුද්ගලයන් නිරාවරණය වීමෙන් පුද්ගල සෞඛ්‍යයට වන බලපෑම් විග්‍රහ කර නිර්දේශ ඉදිරිපත් කර අවසන් වාර්තාව සකස් කර ඇත.

ශ්‍රී ජයවර්ධනපුර කලාප අධ්‍යාපන කාර්යාලය විසින් ලබාදුන් මඟපෙන්වීම අනුව, එම කලාපය තුළ වායු දූෂණය වැඩිම පාසල ලෙස හඳුනාගෙන ඇති අඹතලේ ටිකිරි කුමාරි ප්‍රාථමික විද්‍යාලය මෙම නියමු ව්‍යාපෘතිය සඳහා තෝරා ගෙන ඇත.ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර, පාසල අවට පවතින පසුබිම් වායු තත්ත්වය පිළිබඳ වාර්තාවක් ලබාගෙන යෝග්‍යතාවය පරීක්ෂා කරන ලදී. එම වාර්තාව අනුව, පාසලට යාබද මාර්ගයෙන් පැමිණෙන වායු දූෂක පාසල් පරිශ්‍රය තුළට පැතිර යාම අවම කිරීම සඳහා ස්වාභාවික වායු පෙරණයක් ලෙස ක්‍රියාකරන ජෛව ආකෘතියක් (bio-barrier) නිර්මාණය කිරීමට යෝජනා කර ඇත.අදාළ ජෛව ආකෘතිය සඳහා තාක්ෂණික සැලසුම සකස් කර ඇති අතර මෙම නියමු ව්‍යාපෘතිය 2026 වසර තුළ ක්‍රියාත්මක කිරීමට නියමිතය.

2.1.5 පරිසර සැලසුම් හා ආර්ථික

හරිත රාජ්‍ය ප්‍රසම්පාදන වැඩසටහන

හරිත රාජ්‍ය ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර මෙහි හරිත මූලික අදියර ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩ සහ සේවා කාණ්ඩ ප්‍රමුඛතාගත කිරීම සිදු කරමින් පවතී. මෙම ප්‍රමුඛතා අනුව 2026 වසරේදී හරිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සකස් කිරීමට සැලසුම් කර ඇත.

හරිත නිෂ්පාදන හා හරිත රැකියා ප්‍රවර්ධන වැඩසටහන

මේ යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්ෂුද්‍ර , කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්/ ව්‍යවසායකයන් දැනුවත් කිරීමේ වැඩ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙමඟින් ස්වභාවික සම්පත් සීමිත පරිභෝජනයේ අහිතකර දුර්විපාක පෙන්වා දෙමින් නිෂ්පාදන ක්‍රියාවලියේදී පාරිසරක හායනයන් අවම කර සම්පත් සහ බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා කර්මාන්තවල හරිත පැතිකඩ දියුණු කිරීම සඳහා මඟ පෙන්වීමක් ලබා දේ. හරිත ලේබලකරණයේ වැදගත්කම පැහැදිලි කිරීමද මෙම සැසි වල දී සිදු කරනු ලැබේ.

එමෙන්ම මෙම වැඩසටහන යටතේ ඇඹිලිපිටිය සහ බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලදී පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් / හරිත ව්‍යවසායකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ලදී. පොල් කෙඳි, පොල් ලෙලි කැබලි, කොහු බත්, පොල් කටු ආභරණ හා විසිතුරු නිර්මාණ, දිසිදි පොල් හා පොල් තෙල් නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රමිතීන්/ ප්‍රමිති සහතික ලබා ගැනීම, ව්‍යාපාර ලියාපදිංචි හා අගය එකතු කල නිෂ්පාදන වෙළඳපොළ දක්වා ඉදිරිපත් කිරීමට මාර්ගෝපදේශ පොල් සංවර්ධන අධිකාරියේ සම්පත් දායකත්වයෙන් සිදු කරන ලදී.

පරිසර දූෂණය අවම කර ගනිමින් කර්මාන්තය කර ගෙන යාමට යෙදිය යුතු පිළියම් පිලිබඳ පැහැදිලි කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ සම්පත් දායකත්වයෙන් සිදු විය.

කර්මාන්ත හා ව්‍යවසායකයන්ව සංවර්ධන අමාත්‍යාංශය මඟින් කර්මාන්ත වල හරිත පැතිකඩ දියුණු සඳහා දෙනු ලබන පොළී අඩු සහන ණය යෝජනා ක්‍රම වන E-FRIEND පිළිබඳව දැනුවත් කිරීම සිදු කරන ලදී.

පරිසර සංවේදී ප්‍රදේශ වල ජෛවවිවිධත්ව සංරක්ෂණය සහ පරිසර පද්ධති සේවා නඩත්තුව වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ,ශ්‍රී ලංකාවේ හඳුනාගත් පාරිසරික සංවේදී ප්‍රදේශ (ESA) කළමනාකරණය කිරීම පිළිබඳ ප්‍රාදේශීය පරිපාලන නිලධාරීන්ගේ ධාරිතා ප්‍රවර්ධන නේවාසික වැඩමුළුව පවත්වන ලදී.

වැඩසටහන සඳහා සහභාගීවූවන්

බස්නාහිර පලාතේ හඳුනාගත් පාරිසරික සංවේදී ප්‍රදේශ පිහිටි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 30ක ප්‍රාදේශීය පරිපාලන නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළුවක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සහයෝගයෙන් පවත්වන ලදී.

දිවයිනේ රක්ෂිත ප්‍රදේශ ජාලයෙන් පිටත හමුවන පාරිසරික සංවේදී ප්‍රදේශ සංරක්ෂණය කිරීම සඳහා වූ "ශ්‍රී ලංකාවේ පාරිසරික සංවේදී ප්‍රදේශ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" ක්‍රියාත්මක කිරීම හා පාරිසරික සංවේදී ප්‍රදේශ කළමනාකරණයේදී අධීක්ෂණයේදී අදාල පාර්ශවකාර ආයතන හා එක්ව සහ-කළමනාකරණ ප්‍රවේශය සඳහා ප්‍රාදේශීය පරිපාලන නිළධාරීන්ගේ මැදිහත්වීම විශාල දායකත්වයක් ලබාදෙයි.

ආරක්ෂිත ප්‍රදේශ ජාලයෙන් පිටත පාරිසරික සංවේදී ප්‍රදේශ සිතියම්ගත කිරීම සඳහා රටපුරා තක්සේරුවක් සිදුවෙමින් පවතින අතර, තීරණ ගැනීමේ මෙවලමක් ලෙස දත්ත සමුදායක් සහ වෙබ් අඩවියක් නිර්මාණය කිරීමෙන් ඊට සහාය වේ. මේ වන විට, සත්ත්ව විශේෂ විද්‍යාත්මක විශ්ලේෂණය මගින් ලංකාව පුරා පාරිසරික සංවේදී ප්‍රදේශ 139 ක් හඳුනාගෙන ඇත.

පාරිසරික පාලනය සහ පරිසර පද්ධති ආරක්ෂණය ශක්තිමත් කිරීමේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් ශ්‍රී ලංකාව තුළ පරිසර සංවේදී ප්‍රදේශ (ESA) ක්‍රියාත්මක කිරීම සඳහා වන ජාතික මාර්ගෝපදේශ කෙටුම්පත් කර ඇත. මෙම ක්‍රියාවලියේ කොටසක් ලෙස, විවිධ අදහස් සහ විශේෂඥ දැනුම ඇතුළත් කර ගැනීම සඳහා පාර්ශ්වකරුවන්ගේ උපදේශනයක් සිදු කරන ලදී.

ශ්‍රී ලංකාව තුල පැරිස් ගිවිසුමේ 6 වැනි වගන්තිය ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා දේශගුණික මූල්‍ය දැනුවත් කිරීමේ සැසිය: දේශගුණික ක්‍රියාකාරකම් සඳහා තිරසාර මූල්‍ය සහ කාබන් වෙළෙඳපොළ දියුණු කිරීම

ශ්‍රී ලංකාවේ ජාතික ලෙස නිර්ණය කරන ලද දායකත්ව ක්‍රියාවට නැංවීම සහ දේශගුණයට ඔරොත්තු දෙන ක්‍රියාකාරකම් සංවර්ධනය සඳහා ආයතන අතර සහයෝගීතාව පෝෂණය කිරීම මඟින් හරිත හා සමාජ බැඳුම්කර මෙන්ම පැරිස් ගිවිසුමේ 6 වැනි වගන්තිය කාබන් වෙළෙඳපොළ ඇතුළු ජාත්‍යන්තර දේශගුණික මූල්‍ය මෙවලම් පිළිබඳ ජ්‍යෙෂ්ඨ රජයේ පාර්ශ්වකරුවන්ගේ දැනුම වැඩිදියුණු කිරීම යටතේ අග්‍රාමාත්‍ය කාර්යාලය, පරිසර අමාත්‍යාංශය සහ ගෝලීය හරිත වර්ධන ආයතනය (Global Green Growth Institute) වැඩසටහන සංවිධානය කරන ලදී. මේ යටතේ කාබන් වෙළඳාම ඇතුළුව දේශගුණික මූල්‍ය මෙවලම් පිළිබඳ දැනුවත් කිරීමේ සැසි පවත්වන ලදී.

ප්‍රවාහන අමාත්‍යාංශයේ පවත්වන ලද දැනුවත් කිරීමේ සැසිය

ජාතික හරිත වාර්තාකරණ ක්‍රමවේදය යටතේ,

- යුරෝපා සංගමය අරමුදල් සපයන Accelerating Industries' Climate Response Sri Lanka (AICRSL) ව්‍යාපෘතියෙහි සහාය ඇතිව ESG වාර්තාකරණ සන්දර්භයට අනුකූලව හරිත වාර්තාකරණ මාර්ගෝපදේශවල දෙවන අනුවාදය යාවත්කාලීන කරන ලදී.
- ජාතික හරිත වාර්තාකරණ මෙහෙයුම් කමිටුවේ සංශෝධිත හරිත වාර්තාකරණ මාර්ගෝපදේශ වලංගු කර අනුමත කර ඇත.
- තිරසාරභාවය වාර්තා කිරීම සහතික කිරීම සඳහා ඇගයීම් නිර්ණායක සහ යාන්ත්‍රණය සංවර්ධනය කිරීම ආරම්භ කර ඇත.
- නව ව්‍යවසායකයින්, නිෂ්පාදකයින් සහ සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම සිදු කරමින් පවතී.
- ජාතික හරිත වාර්තාකරණය හා ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකරණ ආයකනයෙහි හි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය හි (SLFRS) S1 සහ S2 තිරසාර වාර්තාකරණ රාමුව සහ සම්බන්ධතාවය ගොඩනගා ඇත.
- NGRS මාර්ගගත E අනුවාදය ප්‍රකාශනය සඳහා සූදානම් වෙමින් පවතී.

තිරසර පරිභෝජන හා නිෂ්පාදනය වැඩසටහන

2019 දී සම්මත කරන ලද තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි අරමුණ පාරිසරික හායනයෙන් ආර්ථික වර්ධනය වෙන් කිරීම සහ ආර්ථිකයේ සියලුම අංශ ඔස්සේ තිරසරභාවය ප්‍රවර්ධනය කිරීම වේ.

මෙම වැඩසටහන යටතේ රාජ්‍ය ආයතන තුල නව ආයතනික සංස්කෘතියක් ඇති කිරීමේ මූලික පියවර ලෙස පරිසර අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතන තිරසර පරිභෝජන හා නිෂ්පාදන මොඩලයන් බවට පත් කිරීම සඳහා සඳහා දැනුවත්කිරීමේ වැඩසටහනක් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

මෙම වැඩසටහනට සමගාමීව ප්ලාස්ටික් බෝතල් එකතු කිරීමේ බහාලුම් 3ක් අමාත්‍යාංශ පරිශ්‍රයේ ස්ථාපිත කිරීම හා පළතුරු පැල ලබාදීම පුද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය නොවන සංවිධානයක දායකත්වයෙන් සිදුකරන ලදී. තවද බස්නාහිර පළාත් සභ අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරියේ කලාප කළමණාකරු විසින් නැවත භාවිතා කළ නොහැකි පොලිතීන් ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීම සඳහා පරිසර හිතකාමී ගඩොල් (Eco Bricks) සෑදීම හඳුන්වාදීම ද මෙදින සිදුවුණි.

2.1.6 පරිසර දූෂණ පාලන හා රසායන ද්‍රව්‍ය කළමනාකරණය

සමුද්‍රීය පරිසරය ඇතුළුව ප්ලාස්ටික් දූෂණය පිළිබඳ ජාත්‍යන්තර නීත්‍යානුකූලව බැඳී ඇති මෙවලමක් සංවර්ධනය කිරීම සඳහා වූ අන්තර් රාජ්‍ය සාකච්ඡා කමිටුවෙහි 5.2 රැස්වීම ස්විස්ටර්ලන්තයේ ජිනීවා හි පැවති අතර ඒ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ගරු අමාත්‍යතුමා සහ ලේකම්තුමා ඇතුළු දූත කණ්ඩායමක් සහභාගී වූ අතර එහිදී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ගෝලීය සහයෝගීතාවය වැඩි දියුණු කළ යුතු බව ඉල්ලා සිටින ලදී.

- විද්‍යාත්මක-ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම
- මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාරවලට සහාය වීම
- තාක්ෂණික හුවමාරු වැඩසටහන් සහ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම

එමෙන්ම අන්තර් රාජ්‍ය සාකච්ඡා කමිටුවෙහි රාජ්‍යයන්හි පරිසර අමාත්‍යවරුන්ගේ සැසිවාරයේදී ජපන් රජයේ ගරු පරිසර අමාත්‍යතුමා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡාවක් පැවැත්විණි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ රසදිය කළමනාකරණය සහ රසදිය ද්‍රව්‍ය ප්‍රවාහය (Mercury Material Flow) සම්බන්ධ අධ්‍යයනයක් සිදු කිරීම සඳහා ආධාර ලබා දීමට ජපන් රජය එකඟ වී ඇත. එම සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස ජපන් රජයේ නියෝජිතයින් මෙරටට පැමිණි අතර ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙනන් ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡාවත් පැවැත්විණි. ඒ අනුව 2026 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

සභ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් රාජ්‍ය ආයතනවල සභ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" මැයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 09/2025 දරන චක්‍රලේඛය නිකුත් කර ඇත.

එම චක්‍රලේඛ මඟින් රාජ්‍ය ආයතන තුළ 3R සංකල්පයට අනුගත කිරීම, අපද්‍රව්‍ය රැස් කිරීම සහ බැහැර කිරීමත් මෙම ක්‍රියාවලිය පිළිබඳ නිලධාරීන්ගේ දැනුවත් කිරීම මෙන්ම ධාරිතා සංවර්ධනය කිරීම පිළිබඳවත් උපදෙස් ලබා දී ඇත. එලෙසම රාජ්‍ය ආයතන තුළ ක්‍රියාත්මක කිරීමෙන් පසු විපරම් කිරීම පිළිබඳව ද උපදෙස් ලබා දී ඇත.

ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රතිපත්ති හා තීරණ ගැනීම සඳහා ප්ලාස්ටික් හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව ස්ථාපිත කර එහි පළමු රැස්වීම් කැඳවීම සිදු කරන ලදී.

බාසල්, රෝටර්ඩෑම්, ස්ටොක්හෝම්, මිනමාටා ජාතික සම්බන්ධීකරණ කමිටුවේ රැස්වීම් වලදී භාවිතා කරන ලද ඇඳුම් ආනයනය පාලනය කිරීම/තහනම් සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය ක්‍රියාත්මක කිරීම සඳහා තීරණ ගන්නා ලදී. එම තීරණ අනුව වාර්ෂික කෝටා ක්‍රමයක් හඳුන්වා දෙන ලද අතර, 2027 වර්ෂය අවසානය වන විට භාවිතා කරන ලද ඇඳුම් ආනයනය සම්පූර්ණයෙන්ම නතර කිරීමටත් තීරණය විය.

2.1.7 ස්වභාවික සම්පත් සංරක්ෂණය

නියඟය සඳහා පෙර සුදානම් යාන්ත්‍රණයක් සකස් කිරීම

එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය පිටුදැකීමේ අන්තර්ජාතික සම්මුතියේ (United Nations Convention to Combat Desertification - UNCCD) 15 වන පාර්ෂවකාර රැස්වීමේදී ගෝලීය ප්‍රජාව විසින් නියඟය පිටුදැකීම පිළිබඳ උපායමාර්ගික අරමුණු හඳුන්වා දුන් අතර පරිසර අමාත්‍යාංශය විසින් මෙරටට සුදුසු ලෙස මෙම උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් “GEF -7 Enabling Activities for Implementing UNCCD COP Drought Decisions” හි කලාපීය ව්‍යාපෘතිය මඟින් මූල්‍යමය සහ තාක්ෂණික සහය යටතේ නියඟය සඳහා පෙර සුදානම් යාන්ත්‍රණයක් සකස් කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කරන ලදී. මේ සඳහා තාක්ෂණික කමිටුවක් පිහිටුවීමට අවශ්‍ය පියවරගෙන ඇත.

භූමි හායනය නිශේධනය සඳහා ඉලක්ක සැකසීමේ වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ විවිධ පාරිසරික දත්ත (එනම් පස වර්ගය, බෑවුම, දේශගුණය, භූමි ආවරණය) භූගෝලීය තොරතුරු පද්ධති (GIS) තුළට ඒකාබද්ධ

කරමින් ශ්‍රී ලංකාවේ ඉඩම් භායනයට ලක්වීමේ අවදානම සහිත ප්‍රදේශ සිතියම් ගත කර ඇති අතර මෙම සිතියම් ජාතික, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමෙන් ජනනය කර ඇත. තවද, මෙම තොරතුරු ගංගා ද්‍රෝණි සහ ජල පෝෂක ප්‍රදේශ මට්ටම්වලටද සිතියම් ගත කර ඇති අතර මේ ආශ්‍රිත දත්ත පද්ධතියක් ද සකස් කර ඇත.

මෙම සිතියම් සහ දත්ත උපයෝගී කරගනිමින් ජාතික, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමෙන් පාංශු සංරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කළ හැකි අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රදේශ තීරණය කිරීමට ද අවශ්‍ය සැලසුම් ක්‍රියාත්මක කිරීමටද ඉඩකඩ සැලසේ.මෙම දත්ත පද්ධතිය ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී මට්ටම දක්වා හඳුන්වාදීම වැදගත් වන අතර මෙම දත්ත පද්ධතිය උපයෝගී කරගනිමින් පාංශු සංරක්ෂණ සැලසුම් සහිතව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද උපයෝගී කරගත හැක. මේවා උපයෝගී කර ගෙන භූමි භායන නිශේධන සංශෝධිත ඉලක්ක සකස්කර 2026 වන විට එලි දැක්වීමට අපේක්ෂිතය.

2.1.8 පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම්

ජගත් පරිසර දිනයට සමගාමීව දිවයිනම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් පාරිසරික ව්‍යාපෘති යෝජනා කැඳවන ලදී. එයින් තෝරාගත් පරිසර ව්‍යාපෘති 320ක් පරිසර සතිය තුලදී ක්‍රියාත්මක කිරීම අදාල ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී.

රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

“Clean Sri Lanka” වැඩසටහන යටතේ ආරක්ෂක අමාත්‍යාංශය මඟින් රාජ්‍ය ආයතනවල සයිබර් ආරක්ෂණ විගණනයන් හා ඒ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

සයිබර් ආරක්ෂණ විගණනයන් හා ඒ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

පරිසර අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතනවල මාධ්‍ය ප්‍රචාරණ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සිදු කර ගැනීමේ අරමුණින් අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතනවල සම්බන්ධීකරණ නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුවක් මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ මූලිකත්වයෙන් පරිසර අමාත්‍යාංශයේදී පවත්වනු ලැබීය.

නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ විද්‍යා, ගණිත, ශාරීරික අධ්‍යාපනය හා ප්‍රාථමික විෂය ධාරාවන් යටතේ පුහුණුව ලබන ගුරු ශික්ෂණලාභීන් 253 දෙනෙකු හා එම පීඨයේ කථිකාචාර්ය මණ්ඩලයේ 42 දෙනෙකු ඇතුළු 295 දෙනෙකු දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වනු ලැබීය.එහිදී දේශගුණ විපර්යාස හා එහි බලපෑම, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය, ශ්‍රී ලංකාවේ වෙරළ සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය හා ශ්‍රී ලංකාවේ ඛණිජ හදුනා ගැනීම හා ව්‍යාප්තිය පිලිබඳ දේශණ පවත්වන ලදි.

පරිසර සුරක්ෂිතාව තහවුරු කිරීම උදෙසා ක්‍රියාත්මක කරනු ලබන අණ පනත්, නීති රෙගුලාසි හා පාරිසරික විෂය සංවේදි කරුණු පිළිබඳ ව දැනුවත් කිරීමේ වැඩසටහනක් ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර රාජකාරී කටයුතුවල යෙදෙන නිලධාරීන් 100 දෙනෙකු සඳහා වක්වැල්ල කළමනාකරණ සංවර්ධන පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී .

බස්නාහිර පළාත් පාළන නියෝජිතයින් හට පාරිසරික නීති හා ප්‍රතිපත්ති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී නියෝජිතයින් 200 දෙනකු සඳහා පවත්වන ලදී.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨයේ සිසුන් හා ආචාර්ය මණ්ඩලය සඳහා වර්තමාන පාරිසරික ප්‍රතිපත්ති,නාගරික තිරසර භාවය හා ඒ ආශ්‍රිත ආර්ථික අංශ,නාගරික පරිසර පද්ධති කළමනාකරණ පිළිබඳ දේශන මාලාවක් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වනු ලැබීය.

“ප්ලාස්ටික් හා පොලිතින් භාවිතය මඟින් සිදුවන දූෂණය අවසන් කරමු” යන තේමාව යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පරිසර නිලධාරීන්ගේ දායකත්වයෙන් පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් මුළු දිවයින පුරා පවත්වන ලදී. මේ යටතේ වැඩසටහන් 307ක් සඳහා ප්‍රතිපාදන ලබා දී සිසුන් 30,700 ක් පමණ දැනුවත් කරන ලදී

"සොබා" සඟරාවෙහි දෙවන කලාපය

"සොබා" සඟරාව මුද්‍රණය කිරීම සහ බෙදා හැරීම.

පරිසර අමාත්‍යාංශය මඟින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන "සොබා" පාරිසරික සඟරාවේ 2025 වර්ෂයේ පළමු කලාපය "ප්ලාස්ටික් මඟින් සිදුවන දූෂණය අවසන් කරමු." යන්න තේමා කරගනිමින් හා දෙවන කලාපය "පාරිසරික ප්‍රතිපත්ති හා නීති පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම" යන මැයෙන් මුද්‍රණය කරන ලදී. මෙම සඟරාවන් පාසැල් පුස්තකාල, මහජන පුස්තකාල, රාජ්‍ය ආයතන සහ පළාත් පාලන ආයතන වෙත බෙදා හරිනු ලැබීය.

ජෛවවිවිධත්වය පිළිබඳ දැනුවත් කිරීම

වර්තමානයේ පරාග වාහක සංරක්ෂණයේ අඩුපාඩු සොයා බැලීම හා පරාග වාහක සංරක්ෂණය කිරීම මඟින් පොල් ඵලදාව වැඩි කර ගැනීම පිළිබඳව පොල් වගා කරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පරිසර අමාත්‍යාංශයේදී පවත්වන ලදී.

දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින්

තර්ජනයට ලක්වූ ශාක විශේෂ ඇතුලත්ව යාවත්කාලීන කරනු ලැබූ ජාතික රතු දත්ත ලේඛණය පිළිබඳව අදාල රාජ්‍ය නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානයේදී සහ හම්බන්තොට මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ දී පවත්වන ලදී.

නීල කාබන් පරිසර පද්ධති සංරක්ෂණය සහ තිරසර භාවිතය පිළිබඳ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලතිව් සහ කිලිනොච්චි දිසා වන කාර්යාල හා එක්ව මූලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පවත්වන ලදී. තවද, මූලතිව් හි නයාරු කලපු ප්‍රදේශයේ නිල් කාබන් පරිසර පද්ධති - විශේෂයෙන් කඩොලාන සහ ලවණ වගුරු බිම් - කෙරෙහි අවධානය යොමු කරමින් ක්ෂේත්‍ර අධ්‍යයනයක් ද සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ තෙත්බිම් පරිසර පද්ධතිවල වැදගත්කම, එම පරිසර පද්ධතිවලට පවතින තර්ජන හා තෙත්බිම් සංරක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳව පාසැල් සිසුන් හා ගම්පහ අධ්‍යාපන කලාපයේ විද්‍යා ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ගම්පහ බණ්ඩාරවත්ත පරාක්‍රම විදුහලේදී පවත්වනු ලැබීය.

ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ ආක්‍රමණශීලී ආගන්තුක ශාක විශේෂයක් වන යෝධ නිදිකුම්බා (*Mimosa pigra*) ශාකය පැතිරීම නිසා තෙත් බිම් පරිසර පද්ධතීන් මෙන්ම, කෘෂි පරිසර පද්ධතීන් තර්ජනයට ලක්ව ඇති බව වාර්තා වේ. මෙම ආක්‍රමණශීලී ආගන්තුක ශාක පාලනය හා කළමනාකරණය සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් කොළඹ, කළුතර, කෑගල්ල, ගම්පහ හා රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි වැඩසටහන් මාලාවක් පරිසර අමාත්‍යාංශයේ ක්‍රියාත්මක කරන ලදී .

2.1.9 අන්තර්ජාතික පාරිසරික සබඳතා

"පාරිසරික ක්‍රියාවලීන් සහ පාරිසරික අධ්‍යාපනය සඳහා තරුණයින්ගේ අර්ථවත් සහභාගීත්වය වැඩි දියුණු කිරීම" යන මාතෘකාවෙන් යුත් කෙටුම්පත් යෝජනාව, නයිරෝබි හි පැවති එක්සත් ජාතීන්ගේ පරිසර සමුළුවේ හත්වන සැසිවාරයේදී ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කරන ලද අතර එය සම්මත කරන ලදී.

මෙම යෝජනාව ගෝලීය පාරිසරික අභියෝගවලට මුහුණදීමේදී තරුණයින්ගේ වැදගත් කාර්යභාරය හඳුනා ගන්නා අතර පාරිසරික ක්‍රියාවලීන් සඳහා තරුණයින්ගේ පූර්ණ, ඵලදායී සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමට මෙන්ම ජාතික ප්‍රමුඛතාවයන්ට අනුකූලව පාරිසරික අධ්‍යාපනය ශක්තිමත් කිරීමට සාමාජික රටවලින් ඉල්ලා සිටින ලදී.

දේශගුණික විපර්යාස, ජෛව විවිධත්ව හානිය සහ දූෂණය, කාන්තාරීකරණය, භූමි හා පාංශු හායනය, දේශගුණික විපර්යාස, ජෛව විවිධත්ව

දූෂණය, කාන්තාරීකරණය, භූමි හා පාංශු හායනය, නියඟය සහ වන විනාශය වැනි ගෝලීය පාරිසරික අභියෝග මෙම යෝජනාව යටතේ හඳුනා ගන්නා අතර, මෙම පාරිසරික අභියෝග ළමයින්ට සහ තරුණ ප්‍රජාව, විශේෂයෙන් අවදානමට ලක්විය හැකි තත්ත්වයන් යටතේ සිටින්නන්ට අසමාන ලෙස බලපාන බව සඳහන් කරයි. මෙමගින් පාරිසරික ක්‍රියාවලීන්හි තරුණයින්ගේ පූර්ණ, ඵලදායී, අර්ථවත්, නිර්මාණාත්මක සහභාගීත්වය සහතික කිරීම සඳහා හැකියාව ලබා දෙන පරිසරයන් නිර්මාණය කිරීමේ වැදගත්කම ද අවධාරණය කරයි.

පාරිසරික ක්‍රියාවලීන්හි තරුණයින්ගේ පූර්ණ, ඵලදායී සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමට සහ පාරිසරික අධ්‍යාපනය, සාක්ෂරතාවය සහ තිරසාර සංවර්ධන නිපුණතා ජාතික අධ්‍යාපන පද්ධතිවලට ඒකාබද්ධ කිරීම සඳහා වන දිරිමත් කිරීම් අන්තර්ගත කිරීම සඳහා මෙම යෝජනාව මඟින් සාමාජික රටවලට ආරාධනා කර ඇත.

2.1.10 පාරිසරික දින සැමරීම

ලෝක මුහුදු තෘණ දිනය (2025 මාර්තු 1)

මෙවර මුහුදු තෘණ දිනය සැමරීමේ ජාතික වැඩසටහන "විකසිත තාරුණ්‍යයෙන් පිබිදෙන මුහුදු තෘණ'' යන තේමාව යටතේ 2025 කොළඹ වරාය නගරයේදී පවත්වන ලදී. ගරු පරිසර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා ලේකම්තුමාගේ මෙන්ම රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්,රාජ්‍ය ආයතන නිලධාරීන්,තරුණ ප්‍රජාව, පාසැල් සිසුන්,රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම පුද්ගලික අංශයේ නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

ගෝලීය ප්‍රතිචක්‍රීකරණ දිනය

(2025 මාර්තු 18)

ප්‍රතිචක්‍රීකරණයේ වැදගත්කම අවධාරණය කරමින් සහ අපද්‍රව්‍ය අවම කිරීම සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා සාමූහික ක්‍රියාමාර්ග දිරිමත් කිරීම අරමුණු කර ගනිමින් මෙම වසරේදී ගෝලීය ප්‍රතිචක්‍රීකරණ දිනය සමරන ලදී. කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය යටතේ ලියාපදිංචි ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ ව්‍යවසායකයින් 50 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදී.

ජගත් මිහිතල දිනය

(2025 අප්‍රේල් 22)

මෙම වසරේ ජගත් මිහිතල දිනයේ තේමාව වූයේ Our Power – Our Planet (යොදා මිනිස් බලයක්-රැකගමු මිහිතලයක්) යන්නයි.

මෙවර 55 වැනි වතාවට සමරනු ලබන ජගත් මිහිතල දිනය ක්ෂේත්‍රයේ ප්‍රවීණ හා විෂය පිළිබඳ

කමිටු සාකච්ඡාව පවත්වමින්

විද්වතුන් 04 නෙකුගෙන් යුත් කමිටුවක් සමඟ විද්වත් කථිකාවතක් සජීවී ලෙස අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වනු ලැබීය.

අන්තර්ජාතික ජෛවවිවිධත්ව දිනය

(2025 මැයි 22)

2025 වර්ෂයේ අන්තර්ජාතික ජෛවවිවිධත්ව දින සැමරුම් උළෙල 2025 මැයි මස 22 වන දින ගරු පරිසර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් "සොබා දහම සමඟින් තිරසර සංවර්ධනය" යන තේමාව යටතේ ජෛවවිවිධත්වයෙන් අනූන දඹුල්ල පොපම් තුරුළුයනේදී රජය නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන පාසැල් සිසුන් මෙන්ම ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. මෙහිදී ඌණ භාවිත ආහාර හා පළතුරු ප්‍රවර්ධනය සහ තිරසාර

ප්‍රදර්ශණය නරඹමින්

සංවර්ධනය සඳහා ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් දේශීය ආහාර ප්‍රදර්ශනයක් ද පවත්වන ලදි

ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණ දිනය

(2025 ජූනි 03)

ගරු පරිසර අමාත්‍යතුමා සහ ගරු පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් උක්ත ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණ දිනය සැමරීම සඳහා ස්වාභාවික සම්පත් කළමනාකරණ අංශය විසින් සිදු කරන ලදී. මෙහිදී ජල මූලාශ්‍ර සංරක්ෂණය සඳහා ජල සම්පත් මණ්ඩලය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව දැනුවත් කිරීම හා ජල මූලාශ්‍ර සංරක්ෂණය පිලිබඳව විද්වත් සාකච්ඡාවක් පවත්වන ලද අතර වැඩසටහන සඳහා පරිසර අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතනවල නිලධාරීන් , විශ්ව විද්‍යාල සිසුන්ද ඇතුළත්ව 200 ක පිරිසක් සම්බන්ධ විය

ජගත් පරිසර දිනය

(2025 ජූනි 05)

කාබන් ශූන්‍ය සැමරුමක් බවට සහතික ලබාදෙමින්

2025 වර්ෂයේදී ද **“ප්ලාස්ටික් මඟින් සිදුවන දූෂණය අවසන් කරමු.”** යන මැයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් කෑගල්ල නිදහස් මාවත පරිශ්‍රයේදී පරිසර දින සැමරුම් වැඩසටහන පවත්වන ලදී.පරිසර දින ජාතික සැමරුමට සමගාමීව මැයි 30 සිට ජූනි 05 දක්වා සතිය “ජාතික පරිසර සතිය” ලෙස ප්‍රකාශයට පත් කර එම සතිය තුල පරිසර සංරක්ෂණය සඳහා කළ

යුතු ක්‍රියාකාරකම් පිළිබඳ සියලු රාජ්‍ය ආයතන දැනුවත් කිරීම සඳහා වක්‍රලේකයක් නිකුත් කරන ලදී.

එය දිවයින පුරාම ක්‍රියාත්මක කරන ලද අතර. එම සතිය මැයි 30 දින සිට පිළිවෙලින් ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ දිනය, වායු දූෂණය සහ එහි අහිතකර බලපෑම් අවම කිරීමේ දිනය, පරිසර පවිත්‍රතාවය පිළිබඳ දැනුවත් කිරීමේ දිනය, ජෛව විවිධත්ව සංරක්ෂණ දිනය, ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණ දිනය, වෙරළ කලාප පවිත්‍ර කිරීමේ දිනය, රුක් රෝපණය හා ජගත් පරිසර දින ප්‍රධාන සැමරුම ලෙස දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරන ලදි.2025 පරිසර දින සැමරුම් වැඩසටහනේදී හරිත පාසැල් සංකල්පය ප්‍රවර්ධනය, සහ හොඳම හරිත දුම්රිය ස්ථාන 10 ක් සඳහා ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානය කිරීම ද අතිගරු ජනාධිපතිතුමා අතින් සිදු කරන ලදී.

ජගත් කාන්තාරකරණ හා නියඟය පිටුදැකීමේ දිනය

(2025 ජූනි 17)

මෙම වසරේ තේමාව වූයේ “භූමිය ප්‍රතිස්ථාපනය සඳහා අවස්ථාව විවර කරමු” යන්නයි. මෙමගින් භූමි ප්‍රතිශ්ඨාපණය සඳහා පවතින අවස්තාවන් වැඩිදියුණු කිරීම අර්ථවත් කරන ලදී. මෙම දිනය සැමරීමට විශේෂ වැඩසටහනක් පරිසර අමාත්‍යාංශයේ ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය සහ ශ්‍රී ලංකා ගුවන් හමුදා කෘෂි ඒකකය විසින් පරිසර අමාත්‍යාංශයේ දී පවත්වන ලදී.

අන්තර්ජාතික කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණ දිනය

(2025 ජූලි 26)

මෙවර අන්තර්ජාතික කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණ දින සැමරීම් ජාතික වැඩසටහන ගරු පරිසර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ආනවිලුන්දාව රැම්සාර් තෙත්බිම් පරිශ්‍රයේදී පවත්වන ලදී.

මෙම ජාතික උත්සවය පැවති දින පරිසර අමාත්‍යාංශය මගින් හෙක්ටයාර 3.2 ක් වූ භායනයට පත් ප්‍රදේශයක මාර්ගෝපදේශයන්ට අනුකූලව කඩොලාන ප්‍රතිෂ්ඨාපනය කිරීමේ වැඩසටහනක් පුද්ගලික අංශයේ සහයෝගය ඇතිව දියත් කරනු ලැබීය. පාසැල් හා විශ්ව විද්‍යාල සිසුන් අදාල රාජ්‍ය ආයතන නිලධාරීන්,පුද්ගලික අංශය රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජාවගේ සහභාගීත්වයෙන් මෙම ජාතික උත්සවය පවත්වන ලදී.

නිල් අහස සඳහා පිරිසිදු වාතය පිළිබඳ ජාත්‍යන්තර දිනය

(2025 සැප්තැම්බර් 08)

මෙවර 2025 වසරට යෙදෙන සයවන නිල් අහස් තලයක් සඳහා පිරිසිදු වාතය පිළිබඳ ජාත්‍යන්තර දිනයේ තේමාව “සැමට පිරිසිදු වාතය ලබා ගැනීමේ අයිතිය සුරක්ෂිත කිරීම සඳහා විසඳුම්” යන ක්‍රියාමාර්ග වේගවත් කිරීමේ අවශ්‍යතාව අවධාරණය

කරනු ලැබේ. ඒ අනුව, කැලණිය - ගුරුකුල විද්‍යාලයේ දරුවන් හට වායු දූෂණය සහ එහි සෞඛ්‍ය, ආර්ථික සහ දේශගුණය කෙරෙහි දැඩි බලපෑම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදු කරන ලදී.මීට අමතරව මධ්‍යම පරිසර අධිකාරිය වායුගෝලයේ ගුණාත්මකභාවය හඳුනාගැනීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන “එයාර්මෙයාර් - ජාතික වායු ගුණාත්මක ජාලය, ශ්‍රී ලංකාව” ජනගත කර ඇත.

2025 ජගත් ඕසෝන් දිනය

(2025 සැප්තැම්බර් මස 16)

ජගත් ඕසෝන් දින සැමරුම් තේමාව පෙරදැරි කර ගනිමින් විද්‍යාවෙන් ගෝලීය ක්‍රියාකාරිත්වයට යන තේමාව යටතේ ගිනි ඇවිලෙන/විෂ සහිත ශීතකාරක සහ ඒවා අඩංගු උපකරණ ආරක්ෂිතව හැසිරවීම පිළිබඳව සකස් කරන ලද ජාතික ආරක්ෂක ප්‍රමිතීන් කෙටුම්පත සමාලෝචනය සහ අනුමැතිය සඳහා නිල වශයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) වෙත භාර දෙන ලදී.

ජාත්‍යන්තර ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය දිනය

(2025 ඔක්තෝබර් 14)

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වගකීමෙන් යුතු ලෙස කළමනාකරණය කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම පිළිබඳ ජනතාව අතර අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා ගෝලීය මට්ටමේ ක්‍රියාත්මක වන වැඩසටහනකි.පරිසර අමාත්‍යාංශය විසින් 2025 ඔක්තෝබර් 14 සිට 21 දක්වා කාලය "ඉ-අපද්‍රව්‍ය සතිය" ලෙස ප්‍රකාශයට පත් කර ඇත. මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වූයේ වර්ධනය වෙමින්

පවතින පාරිසරික සහ මහජන සෞඛ්‍ය ගැටළුවක් වන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය නිසි ලෙස එකතු කිරීම, බැහැර කිරීම සහ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය කිරීම පිළිබඳ මහජන අවබෝධය ඉහළ නැංවීමයි.

නැගෙනහිර, ඌව, දකුණු සහ උතුරු පළාත් හතර තුළ රාජ්‍ය නිලධාරීන්, අධ්‍යාපන ආයතන, පළාත් පාලන ආයතන, පුද්ගලික අංශ නියෝජිතයින් සහ ප්‍රජා සාමාජිකයින් සම්බන්ධ කරගනිමින් ආයතනික සහ ප්‍රජා මට්ටමින් වගකීමෙන් යුතු ඉ-අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම අරමුණ කර ගනිමින් දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පහක් සිදු කරන ලදී.

2.1.11 ආයතනික කටයුතු

බඳවා ගැනීම්

කළමනාකරණ සේවා නිලධාරී	06

සේවා ස්ථීර කිරීම්

සංවර්ධන නිලධාරී	127

උසස් කිරීම්

දීපව්‍යාප්ත සේවා	02
දෙපාර්තමේන්තුගත (විධායක)	02
සංවර්ධන නිලධාරී සේවය	07

විශ්‍රාම ගැන්වීම්

දීපව්‍යාප්ත සේවා	02
දෙපාර්තමේන්තුගත (විධායක)	01

ඉල්ලා අස්වීම්

සංවර්ධන නිලධාරී	06

තනතුර අතහැරයාම්

සංවර්ධන නිලධාරී	03

ණය ලබා දීම්

ආපදා ණය	106
දේශීය නිවාඩු රාජ.පරි.ව.14/2022	01
විදේශ නිවාඩු රාජ්‍ය.පරි.ව. 14/2022	05
හැදුනුම්පත් සකස් කිරීම්	366
පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු ඉදිරිපත්	15
වාර්ෂික වාර්තා හා කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම්	02
සහනදායී පදනම් මත වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීම්	**21**
අමාත්‍ය මණ්ඩල සංදේශ	**38**

2.1.12 මානව සම්පත් සංවර්ධන

පුහුණු වැඩසටහන්
පරිසර අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා අභිප්‍රේරණය,ධනාත්මක චින්තනය,ආචාර ධර්ම පිළිබඳ දේශන වැඩසටහන
නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා ලියාපදිංචි ගාස්තු - 2024
නව ප්‍රසම්පාදන සංසදයේ පුහුණු වැඩසටහන සඳහා ලියාපදිංචි ගාස්තු - 2024
රජයේ වාහන නඩත්තුව පිළිබඳ පුහුණු වැඩමුළුව
නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය පිළිබඳ වැඩමුළුව
ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළුව
ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩමුළුව
2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අත්පොතෙහි කැපී පෙනෙන ලක්ෂණ පිළිබඳ වැඩමුළුව
ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහායකයන්ගේ එක්දින පුහුණු වැඩමුළුව
නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය පිළිබඳ වැඩමුළුව
පරිසර අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් සඳහා ධාරිතා පුහුණු වැඩසටහන

ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන
පරිසර අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළුව
කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරී පුහුණුව පිළිබඳ වැඩසටහන
පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වන පුහුණු වැඩසටහන
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 4 වන අන්තර්ජාතික ගවේෂණය පිළිබඳ වැඩමුළුව සඳහා එක් නිලධාරියකුගේ සහභාගී වීම
ලිපිගොනුකරණය පිළිබඳ පුහුණු වැඩසටහන
Clean Sri Lanka ජාතික වැඩ සටහනට සමගාමීව සෙයිරි සතිය නිමිත්තෙන් පැවැත් වූ පුහුණු වැඩ සටහන
ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල පුස්තකාලයාධිපතින්ගේ සංගමයේ 15වන අන්තර්ජාතික සම්මේලනය සඳහා නිලධාරියකු සහභාගී වීම
Certificate in Artificial Intelligence පුහුණු පාඨමාලාව
ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩමුළුව
කාර්යාල සටහන් ලිවීම හා රාජකාරී ලිපි ලිවීම සඳහා පැවති පුහුණු වැඩසටහන
ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන
විද්‍යාත්මක,පිරිමැසුම්දායක හා ආරක්ෂිත රිය පැදවීම උදෙසා රියදුරන් වෙනුවෙන් පැවැත්වූ පුහුණු වැඩසටහන සඳහා රියදුරන් යොමු කිරීම
ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහායකයන්ගේ එක්දින පුහුණු වැඩමුළුව
කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරී පුහුණුව පිළිබඳ වැඩසටහන
Certificate in Artificial Intelligence පුහුණු පාඨමාලාව
රාජ්‍ය ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

2.1.13 අභ්‍යන්තර විගණන

අමාත්‍යාංශය හා ඊට අයත් ආයතනවල අභ්‍යන්තර පාලනය විධිමත්ව ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය පිහිටුවා ඇත.

අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2025 වර්ෂය සඳහා සංශෝධිත විගණන සැලැසුම යටතේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තා ඇතුලත්ව විගණන වාර්තා 35 ක් නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

ඒ අනුව 2025 වර්ෂය තුළ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඊට අදාළ කමිටු වාර්තා නිකුත් කර ඇති අතර විගණන වාර්තා 35 ක් නිකුත් කර තිබේ.

විගණන සැලසුමට පරිබාහිරව වෙනත් විශේෂ විගණන වාර්තා 06 ක් නිකුත් කර ඇත.

2.1.14 පරිසර ගැටළු පිළිබඳ මහජන පැමිණිලි, අභියාචනා හා මාධ්‍ය වාර්තා

2025 වර්ෂයට අදාලව පරිසර අමාත්‍යාංශයේ විවිධ අංශවලට, අමාත්‍යාංශයට අයත් ආයතන හා වෙනත් අමාත්‍යාංශ හා ආයතන වෙත විමර්ශන කටයුතු සඳහා පැමිණිලි 84ක් ලැබී ඇති අතර 23 සඳහා වාර්තා කැදවා ඇති අතර පිළිතුරු ලැබීම් 01 ක් හා විමර්ශන 17 ක් සිදු කර අවසන් අතර විමර්ෂණ 43 ක් සිදු කරමින් පවතී.

2.1.15 නෛතික කටයුතු

ක්‍රියාකාරකම	ප්‍රගතිය 2025.12.31
ජාතික පාරිසරික පනත යටතේ අභියාචනා විභාගය	තීරණ ලබාදුන් අභියාචනා 22
පතල් හා ඛනිජ පනත යටතේ අභියාචනා විභාග කිරීම	තීරණ ලබාදුන් අභියාචනා 07
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ පනත	තීරණ ලබාදුන් අභියාචනා 57
අමාත්‍යාංශයට අදාළ උසාවි නඩු, මානව හිමිකම් නඩු සහ ඔම්බුඩ්ස්මන් නඩු සඳහා සහාය ලබා දීම	නඩු 26
අමාත්‍යාංශය හා රේඛීය නියෝජිතායතන සම්බන්ධ ගිවිසුම් සකස් කිරීම	ගිවිසුම් 14
මහජන පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම	පැමිණිලි 01
පාරිසරික නීතිය පිළිබඳව පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය කිරීම	වැඩමුළු 02

2.1.16 අමාත්‍යාංශයේ අභ්‍යන්තර පද්ධති වෙනස්කම් හා ප්‍රතිසංස්කරණ

ජාත්‍යන්තර දේශගුණික හා පාරිසරික අරමුදල් සඳහා ව්‍යාපෘති යෝජනා තෝරා ගැනීම

සම්ප්‍රදායිකව එක් එක් අංශ මඟින් හුදෙකලාව සිදු කරන ලද ජාත්‍යන්තර දේශගුණික සහ පාරිසරික මූල්‍ය ප්‍රභවයන්ගෙන් අරමුදල් ලබාගැනීමේ ක්‍රියාවලිය වඩාත් විධිමත්, විනිවිදභාවයකින් යුක්තව සිදු කිරීම සඳහා පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ සංකල්පයකට අනුව 2025 ඔක්තෝබර් මාසයේදී ජාත්‍යන්තර දේශගුණික හා පාරිසරික මූල්‍ය අරමුදල් සඳහා ව්‍යාපෘති යෝජනා තේරීමේ ස්ථාවර කමිටුව ස්ථාවර කමිටුව ස්ථාපිත කරන ලදී.

මෙම කමිටුවේ සභාපතිත්වය පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් දරනු ලබන අතර, අතිරේක ලේකම්වරුන්, ප්‍රධාන මූල්‍ය නිලධාරී, අදාළ විෂය ක්ෂේත්‍රයන්ට අයත් අධ්‍යක්ෂවරුන් සහ අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ලබයි.

ප්‍රධාන ජාත්‍යන්තර පාරිසරික සහ දේශගුණික මූල්‍යකරණ ප්‍රභවයන්ගෙන් අරමුදල් ලබා ගැනීමේදී විචක්ෂණශීලී, පාරදෘශ්‍ය සහ ජාතික ප්‍රමුඛතා මත පදනම් වූ තීරණ ගැනීමේ ක්‍රියාවලියක් සහතික කිරීම මෙම කමිටුවේ ප්‍රධාන අරමුණ වේ.

මෙම කමිටුව මඟින්, ජාත්‍යන්තර දේශගුණික හා පාරිසරික අරමුදල් සඳහා ඉදිරිපත් කිරීමට නියමිත ව්‍යාපෘති යෝජනා සමාලෝචනය කර අනුමත කිරීම සිදු කරනු ලබන අතර, ව්‍යාපෘති යෝජනා සකස් කිරීමේදී ජාතික ප්‍රමුඛතා හඳුනාගෙන ඒවාට අනුකූලව යෝජනා සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව ද අවධාරණය කර ඇත. තවද කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබන සියලු ව්‍යාපෘති සහ සංකල්ප යෝජනා සඳහා අදාළ දෙපාර්තමේන්තු සහ අංශවල නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් සමාලෝචනයක් ලබා ගැනීම අනිවාර්ය කරමින්, ඒ සඳහා ප්‍රමිතිගත ආකෘතියක් සහ මාර්ගෝපදේශ මාලාවක් හඳුන්වා දී ඇත. මෙමඟින් ජාත්‍යන්තර මූල්‍යකරණ අවස්ථා සඳහා උසස් තත්ත්වයේ, ජාතික ප්‍රමුඛතා සමඟ අනුකූල සහ තරඟකාරී ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා පාරිසරික වෘත්තිකයන්ගේ සංගමය (Institute of Environmental Professionals Sri Lanka – IEPSL) හරහා පාරිසරික වෘත්තිකයන් ඵලදායී ලෙස සම්බන්ධ කර ගැනීම සඳහා රාමුවක් ස්ථාපිත කිරීම.

පාරිසරික තේමාවන් හුදකලාව අධ්‍යයනය කිරීමෙන් ඔබ්බට ගොස්, විභව පාරිසරික අවදානම් හඳුනා ගැනීමට, තක්සේරු කිරීමට සහ අවම කිරීමට ඉඩ සලසන සාක්ෂි ජනනය කිරීමෙන් පූර්වාරක්ෂාව සඳහා ප්‍රවේශයක් දිරිමත් කරන හරිත පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම අමාත්‍යාංශය ප්‍රමුඛ කර්තව්‍යයක් ලෙස සලකයි. ශ්‍රී ලංකාව සතුව විද්වතුන්, පර්යේෂකයන්, තාක්ෂණික විශේෂඥයන් ඇතුළු සුදුසුකම් ලත් පාරිසරික වෘත්තිකයන්ගේ සැලකිය යුතු සම්පත් දායකත්වයක් පවතින නමුත්, එම විශේෂඥතාවන් විශාල වශයෙන් විසිරී පවතින අතර එම දැනුම ජාතික වශයෙන් ක්‍රමවත්ව සංවිධානගත කළ හැකි විධිමත් සහ ආයතනික යාන්ත්‍රණයක් දැනට නොපවතී.

පාරිසරික වෘත්තිකයන්ගේ දායකත්වය ආයතනික මට්ටමින් ලබා ගැනීම සඳහා ව්‍යුහගත ජාතික රාමුවක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන යෝජනාවක් ශ්‍රී ලංකා පාරිසරික වෘත්තිකයන්ගේ සංගමය (IEPSL) වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව, පාරිසරික වෘත්තිකයන් වර්ගීකරණයන් පදනම් කරගත් "පාරිසරික වෘත්තිකයන්ගේ විද්වත් රාමුවක්" (Collegiate Framework for Environmental Professionals) ස්ථාපිත කිරීමට අදාල කටයුතු මේ වන විට අරම්භකර ඇත. ඒ සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීමට අදාල කටයුතු මේ වන විට කටයුතු කරමින් පවතී.

විශ්ව විද්‍යාල පාදක කර ගත් වීධිමත් පාරිසරික පර්යේෂණ සහයෝගීතාවක් ස්තහාපනය කිරීම

දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම, වනාන්තර හා වනජීවී සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සහ වායු හා ජල දූෂණය අවම කිරීම ඇතුළු මතුවෙමින් පවතින පාරිසරික අභියෝග ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රතිපත්ති සැකසීම හා තීරණ ගැනීම සඳහා උපකාරී වන දත්ත මත පදනම් වූ නිර්දේශ ලබාදීමට විශ්වවිද්‍යාල පර්යේෂණවලට වැදගත් දායකත්වයක් සැපයිය හැකිය.

පරිසර අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන හා එක්ව, පර්යේෂණ හා අධ්‍යයනයන් ප්‍රවර්ධනය සඳහා දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල අධ්‍යයන පාඨමාලා ඒකාබද්ධ කරගනිමින් විධිමත් ක්‍රමවේදයක් ස්ථාපනය කිරීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව, ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය සමඟ සහ අදාළ පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවයකට එළඹීමට අපේක්ෂිතය.

මෙම වැඩපිළිවෙළට පර්යේෂණ, සේවාස්ථ පුහුණු, ශිෂ්‍ය හුවමාරු සහ පශ්චාත් උපාධි පර්යේෂණ සබඳතා ඇතුළත් වේ. ඊට අදාළ දත්ත හුවමාරුව, මූල්‍යකරණ විධිවිධාන සහ බුද්ධිමය දේපළ අයිතීන් වැනි කරුණු ඇතුලත් අවබෝධතා ගිවිසුමක් අනුව අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එකාබද්ධව මෙය ක්‍රියාත්මක කිරීමට නියමිතය.

2.1.17 "වනස්පති" වැඩසටහන

ශ්‍රී ලංකාව විසින් පැරිස් ගිවිසුම යටතේ ගෙන ඇති ජාත්‍යන්තර බැඳීම් සහ රජයේ නව පරිසර ප්‍රතිපත්තියට අනුකූලව, ජල මූලාශ්‍ර, වනජීවීන් සහ ශාක විශේෂ ආරක්ෂා කරමින් වනාන්තර සංරක්ෂණය හා සුරක්ෂිත කිරීම අරමුණු කරගෙන "වනස්පති" වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. එමෙන්ම, 2030 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ වනාන්තර ආවරණය සියයට 32 දක්වා ඉහළ නැංවීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණකි. "වනස්පති" වැඩසටහන ශ්‍රී ලංකාවේ වනාන්තර ආවරණය පුළුල් කිරීම, ජෛව විවිධත්වය සුරක්ෂිත කිරීම සහ පරිසර සංරක්ෂණ කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීම අරමුණු කරගත් දිගුකාලීන ජාතික වැඩසටහනක් ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම වැඩසටහන යටතේ 2025 වර්ෂය තුළ දිස්ත්‍රික්ක 6ක් ආවරණය වන පරිදි රක්ෂිත වනාන්තර 29ක් ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇත. එමඟින් හෙක්ටයාර 47,058.32ක සමස්ත වනාන්තර භූමි ප්‍රමාණයක් නීතිමය ආරක්ෂාව යටතට පත් කිරීමට හැකි වී ඇත.

මෙම වනාන්තර අතරින් විශාලතම ප්‍රමාණය හෙක්ටයාර 40,684.99කින් සමන්විත මොණරාගල දිස්ත්‍රික්කයේ නිල්ගල රක්ෂිතය වන අතර, අම්පාර, කෑගල්ල, ගාල්ල, පුත්තලම, මහනුවර සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල පිහිටි වනාන්තර රැසක් මෙම වැඩසටහන යටතේ රක්ෂිත වනාන්තර ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

2025 - රක්ෂිත			
අනු අංකය	**දිසාව**	**වනාන්තරයේ නම**	**ප්‍රමාණය) හෙක්)**
1	අම්පාර	කරංගාව රක්ෂිතය	370.15
2		පානම උතුර රක්ෂිතය	832.46
3		බදුළුගොඩ රක්ෂිතය	70.83
4		පාලකුඩා කඩොලාන රක්ෂිතය	113.49
5	කෑගල්ල	තුල්හිරිකන්ද රක්ෂිතය	46.44
6		උඩලියද්ද රක්ෂිතය	15.3
7		වේරහැන්කන්ද රක්ෂිතය	36.62
8	ගාල්ල	කොට්ටව රක්ෂිතය	441.63
9	පුත්තලම	මැරවල කඩොලාන රක්ෂිතය	16.52
10		වවුල්කැලේ කඩොලාන රක්ෂිතය	0.77
11		මරම්බැට්ටිය කඩොලාන රක්ෂිතය	18.98
12		කුසල කඩොලාන රක්ෂිතය	0.36
13		මැරවල 01 කඩොලාන රක්ෂිතය	20.55
14		මැරවල 02 කඩොලාන රක්ෂිතය	8.36
15		මැරවල 03 කඩොලාන රක්ෂිතය	1.36
16		කරුප්පනේ 02 කඩොලාන රක්ෂිතය	0.41
17	මහනුවර	රජගල රක්ෂිතය	402.11
18		රිලාගල රක්ෂිතය	515.31
19	මොණරාගල	අඹඅත්තාහෙල රක්ෂිතය	716.08
20		නිල්ගල රක්ෂිතය	40684.99
21		පොරමැඩිල්ල රක්ෂිතය	126.26
22		කන්දයාය රක්ෂිතය	450.58
23		වැලිආර රක්ෂිතය	1527.71
24		කුඩාගොඩකන්ද රක්ෂිතය	51.29
25		වන්නිතිබ්බාගොඩ රක්ෂිතය	204.82
26		ආගරේ රක්ෂිතය	272.42
27		වෙහෙරගල රක්ෂිතය	30.6
28		මිල්ලකැලේ රක්ෂිතය	31.33
29		බණ්ඩාරවාඩිය රක්ෂිතය	50.59
			47058.32

2.2 වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශය

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශයේ කාර්යභාරය ක්‍රියාත්මක කරන අංශ

පාලන අංශය

මානව සම්පත් කළමනාකරණය හා භෞතික සම්පත් කළමනාකරණය කිරීම තුළින් වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශයේ අරමුණු ඉටුකරවා ගැනීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශය තුල සාමාන්‍ය පරිපාලනය හා විනය පවත්වාගෙන යාම, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශයේ සියලු නිලධාරීන්ගේ ආයතන කටයුතු සිදුකිරීම, දෙපාර්තමේන්තුවල ආයතන කටයුතු නිසියාකාරව සිදුකිරීමට වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශයේ අවශ්‍ය සහය ලබා දීම, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තු ප්‍රශ්න හා අමාත්‍ය මණ්ඩල සංදේශ වලට අදාලව කටයුතු කිරීම හා වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම පාලන අංශයෙන් සිදු කරනු ලබයි.

සැලසුම් අංශය

වනජීවී ආරක්ෂණය, වන සංරක්ෂණය හා සත්ත්ව සුබසාධනය යන විෂයට අදාළව සැලසුම් හා අධීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් මෙම අංශය වගකියනු ලබයි. එසේම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ලභා කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම ද මෙම අංශයෙන් සිදුකෙරේ .

සංවර්ධන අංශය

මෙම අංශය මඟින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය දැව සංස්ථාව මඟින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු විධිමත්ව හා ඵලදායීව ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සිදු කරනු ලැබේ.

ගිණුම් අංශය

මෙම අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ලෙස ඉටු කළ යුතු වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශයේ හා අංශය යටතේ ඇති ආයතනවල මූල්‍ය පාලන කාර්යභාරයට අවශ්‍ය සෘජු සහාය දැක්වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය හා කර්තව්‍යයි. ඒ අනුව, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශය යටතේ ඇති ආයතනවල මූල්‍ය පාලන කටයුතු සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම හා ඊට අදාළ පාලන කටයුතු මෙම අංශය මඟින් ඉටු කරනු ලබයි.

අභ්‍යන්තර විගණන අංශය

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු පිළිබඳව ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන ක්‍රමවේද වල කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඇගැයීම සඳහා නිරන්තර සෝදිසි පරීක්ෂණ සිදුකිරීම හා දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂණ කටයුතු මෙහෙයවීම ද අභ්‍යන්තර විගණන අංශයෙන් සිදුකරනු ලබයි.

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවල සංවර්ධන වැඩසටහන් මූල්‍ය ප්‍රගති සාරාංශය –2025

ආයතනය	මූලධන ප්‍රතිපාදන (රු.මී.)	මූලධන සත්‍ය වියදම (රු.මී.)	වියදම %
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශය	35.00	9.97	28.48
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	406.00	378.43	93.20
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	1280.00	1261.30	98.53
ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව	167.00	95.13	56.96
එකතුව	**1888.00**	**1744.83**	**92.41**

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු/ආයතන වලට අදාල සමස්ථ ප්‍රතිපාදන සාරාංශය

(2025.12.31 දිනට)

ආයතනය	මූලධන			පුනරාවර්තන			මූලධන + පුනරාවර්තන මුළු එකතුව
	ඒකාබද්ධ අරමුදල	දෙපාර්තමේන්තු/ ආයතනික අරමුදල	මූලධන එකතුව	ඒකාබද්ධ අරමුදල	දෙපාර්තමේන්තු/ ආයතනික අරමුදල	පුනරාවර්තන එකතුව	
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අංශය	35.00	-	**35.00**	187.00	-	**187.00**	**222.00**
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	406.00	780.95	**1,186.95**	5,324.00	2,739.95	**8,063.95**	**9,250.90**
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	1,280.00	-	**1280.00**	2,500.00	-	**2,500.00**	**3,780.00**
ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව	167.00	450.37	**617.00**	784.00	1,377.50	**2,161.50**	**2,778.50**
එකතුව	**1,888.00**	**1,231.32**	**3,119.32**	**8,795.00**	**4,117.45**	**12,912.45**	**16,031.77**
රාජ්‍ය දැව සංස්ථාව	-	1,199.67	**1,199.67**	-	5,402.90	**5,402.90**	**6,602.57**
මුළු එකතුව	**1,888.00**	**2,430.99**	**4,318.99**	**8,795.00**	**9,520.35**	**18,315.35**	**22,634.34**

ඒකාබද්ධ අරමුදල

ආයතනය	මූලධන ප්‍රතිපාදන (රු.මි.)	මූලධන සත්‍ය වියදම (රු.මි.)	වියදම %
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	780.95	775.52	99.30
ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව	450.37	383.50	85
එකතුව	**1231.32**	**1159.02**	**94.12**

දෙපාර්තමේන්තු සංචාරක පැමිණීම හා ආදායම –2025.12.31 දිනට

ආයතනය	සංචාරක පැමිණීම			ආදායම (රු.මි.)			එකතුව
	දේශීය	විදේශීය	එකතුව	දේශීය	විදේශීය	වෙනත්	(රු.මි.)
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	1,468,176	1,155,946	2,624,122	188.34	6272.91	134.41	6595.66
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	592,199	301,615	**893,814**	52.63	451.39	75.10	**579.13**
ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව	1,940,808	250,745	2,191,553	496.51	982.84	131.29	1610.64
මුළු එකතුව	**4,001,183**	**1,708,306**	**5,709,489**	**737.48**	**7707.14**	**340.80**	**8785.43**

2.3 පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය

2.3.1 එක්ව කළමනාකරණය කිරීම: වන විද්‍යාව, කෘෂිකර්මාන්තය සහ සංචාරක අංශ වෙත ප්‍රජාව කේන්ද්‍ර කරගත් පරිසර පද්ධති මත පදනම් වූ ප්‍රවේශයන් ඒකාබද්ධ කිරීම

එක්ව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ අනුරාධපුර මල්වතු ඔය ද්‍රෝණිය, මන්නාරම, පුත්තලම සහ වව්නියාවේ තෝරාගත් අත්හදා බැලීමේ භූමි දර්ශක වලට අයත් කෘෂිකර්මාන්තය, සංචාරක හා වන වගාව සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණය ඇතුළත් කිරීම සඳහා සාකල්‍ය භූමි දර්ශක ප්‍රවේශයක් ස්ථාපිත කිරීමය. ස්වභාවික සම්පත් කළමනාකරණය තුලට ජෛව විවිධත්ව සංරක්ෂණය ප්‍රධාන ධාරාගත කිරීම හා මල්වතු ඔය ද්‍රෝණියේ වෙන් වශයෙන් පිහිටි ප්‍රදේශ තුනක එනම් ගොඩබිම් ප්‍රදේශ දෙකක් (රිටිගල සිට මිහින්තලය යෝධ වැව /මඩු පාර-විල්පත්තුව) සහ එක් මුහුදු ආශ්‍රිත කලාපයක (මන්නාරම බොක්ක/වන්කාලෙයි-අරිප්පු-සිලාවතුර) ඉඩම් පරිහරණය සැලසුම් කිරීම සඳහා දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් රජය සහ බහුවිධ ප්‍රාදේශිය සහ පළාත් බල ප්‍රදේශ පුරා පැතිරුණු සිවිල් සමාජය සමඟ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇත. ව්‍යාපෘතිය සංරචක 4කින් වේ.

මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම තුලින් එල්ලංගා වැව් පාරිසරික වශයෙන් ප්‍රතිස්ථාපනය කිරීම, දේශීය ශාක විශේෂ නැවත සිටුවීම සහ පාංශු සංරක්ෂණය.

පරිසර අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකා රතු කුරුස සංගමය විසින් මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ මැදවච්චිය ගොවිජන සේවා මධ්‍යස්ථානය සමඟ එක්ව මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෝරාගත් වැව් 14 ක ආක්‍රමණශීලී ආගන්තුක ශාක විශේෂ ඉවත් කරමින් දේශීය ශාක විශේෂ සිටුවීම සහ පාංශු සංරක්ෂණය කිරීමේ කටයුතු සිදු කරන ලදී.

මෙහිදි ගොවි සංවිධාන සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලද අතර ආක්‍රමණශීලී ශාක විශේෂවල බලපෑම, ඉවත් කිරීමේ තාක්ෂණික ක්‍රම, පාංශු සංරක්ෂණය සහ ප්‍රතිෂ්ඨාපනය කරන ලද පරිසර පද්ධති තිරසාරව පවත්වාගෙන යාම සඳහා ගොවි සංවිධානවල කාර්යභාරය ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ලදී.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ තන්තිරිමලේ සහ මන්නාරම දිස්ත්‍රික්කයේ නාන්දන් සහ මුසලි හි තෝරාගත් භූමි ප්‍රදේශ කිහිපයක තරුණ කණ්ඩායම් සඳහා සංචාරක ව්‍යාපාරය සහ පාරිසරික තිරසාරභාවය සඳහා සමාජ මාධ්‍ය භාවිතය පිළිබඳ පුහුණු කිරීමේ වැඩසටහන

පරිසර අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව අංශයේ මඟ පෙන්වීම යටතේ සහ මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමඟ එක්ව ශ්‍රී ලංකා රතු කුරුස සංගමය සංචාරක ප්‍රවර්ධනය සහ පාරිසරික තිරසාරභාවය සඳහා සමාජ මාධ්‍ය භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් අනුරාධපුරයේ තන්තිරිමලේ සහ ගම්බිරිගස්වැව යන ප්‍රදේශවල සහ මන්නාරමේදී පවත්වන ලදී. තිරසාර සංචාරක භාවිතයන් ප්‍රවර්ධනය කිරීම, පාරිසරික සංරක්ෂණය පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සහ සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ පාරිසරික වශයෙන් වගකිවයුතු ආර්ථික අවස්ථාවන්හි නියැලීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා සමාජ මාධ්‍ය වේදිකා ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා තරුණ තරුණියන්ගේ දැනුම හා කුසලතාවයන් සන්නද්ධ කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය.

වෙරළ පිරිසිදු කිරීමේ ශ්‍රමදානය

මන්නාරම් දූපතේ ප්ලාස්ටික් හා දූෂණයෙන් තොර හරිත වෙරළ තීරයන් හරහා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම.

ප්ලාස්ටික් හා දූෂණයෙන් තොර වෙරළ තීරයක් පවත්වා ගැනීම, වෙරළ සංරක්ෂණය සඳහා ප්‍රජා වගකීම දිරිමත් කිරීම සහ කොටස්කරුවන් අතර සහයෝගීතාව වර්ධනය කිරීම මගින් පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක්, මන්නාරම දූපතේ කීරි වෙරළ තීරයේදී පැවැත්විණි.

මේ සඳහා ශ්‍රී ලංකා රතු කුරුස සංගමයේ ස්වේච්ඡා සේවකයින්, නාවික හමුදා නිලධාරීන්, නගර සභා නියෝජිතයින්, ප්‍රජාව සහ සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයින් ඇතුළු 70 කට අධික පිරිසක් පිරිසිදු කිරීමේ ක්‍රියාකාරකම්, අපද්‍රව්‍ය බැහැර කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් වල නිරත වූහ.

රජයේ නිලධාරීන් සඳහා පාරිසරික බලපෑම් තක්සේරුකරණ (න්‍යාය සහ ප්‍රායෝගික), සමාජීය හා පරිසර ආරක්ෂණ ක්‍රම සහ ජෛවවිවිධත්ව සංරක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

පාරිසරික බලපෑම් තක්සේරුව පිළිබඳ දැනුම, සමාජීය හා පාරිසරික ආරක්ෂණ ක්‍රම සහ ජෛවවිවිධත්ව සංරක්ෂණය හා තිරසර භාවිතය ආවරණය වන ප්‍රායෝගික අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා ධාරිතා ගොඩනැගීමේ අරමුණින් පාරිසරික බලපෑම් තක්සේරුව පිළිබඳ පුහුණු වැඩසටහනක් අනුරාධපුර, රිටිගල තොරතුරු හා පර්යේෂණ මධ්‍යස්ථානයේදී පැවැත්විණි.

මේ සඳහා පරිසර අමාත්‍යාංශයට අයත් සංවර්ධන නිලධාරීන්, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව , මධ්‍යම පරිසර අධිකාරිය , සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය , වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අයත් නිලධාරීන් සහභාගි වූ අතර මෙහිදී පාරිසරික බලපෑම් තක්සේරුකරණ ක්‍රියාපටිපාටි, අදාළ නීතිමය රාමු, සමාජීය හා පාරිසරික ආරක්ෂණ සහ ජෛවවිවිධත්ව සංරක්ෂණයේ විවිධ අංශවල නිපුණතා ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

මන්නාරම වන්කාලෙයි මුහුදු කඩනය (Sea breaker) ඉදි කිරීම.

එක්ව කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ මන්නාරම ප්‍රදේශයේ ධීවර ජනතාවගේ පහසුකම් ආරක්ෂා කිරීමටත් කුනාටු සහිත ප්‍රදේශවල මුහුදු වෙරළට රළ මගින් සිදුවන හානිය වැලැක්වීම සඳහාත් ගංවතුර තර්ජනය අවම කිරීම සඳහාත් මන්නාරම් දිස්ත්‍රික්ලේකම් කාර්යාලය සමඟ එක්ව මන්නාරම වන්කාලෙයි මීටර් 750 ක ප්‍රමාණයක මුහුදු කඩනයක් (Sea breaker) ඉදි කෙරේ.

පරිසර සංචාරක ව්‍යාපාරය පිළිබඳ පුහුණු වැඩසටහන් සහ සංචාරක මාර්ගෝපදේශක බලපත්‍ර ගැනීම පිළිබඳව හඳුන්වාදීම

පරිසර සංචාරක ව්‍යාපාරය සහ සංචාරක මාර්ගෝපදේශක බලපත්‍ර ලබාදීම පිළිබඳ පුහුණු වැඩසටහනක් සහ පරිසර සංචාරක ව්‍යාපාරය සහ වගකිවයුතු සංචාරක ව්‍යාපාරය පිළිබඳ මූලික සංකල්ප, ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යුහය, ප්‍රවණතා සහ අවස්ථා සහ අනුරාධපුරයේ සහ උතුරු මැද පළාතේ ජෛවවිවිධත්වය සහ පාරිසරික සංචාරක විභවය පිළිබඳව පුහුණු වැඩසටහන් අනුරාධපුර පවත්වන ලදී. මහාචාර්ය ශ්‍රියානි වික්‍රමසිංහ මිය සහ ආචාර්ය මල්රාජ් බී. කිරිඇල්ල මහතා විසින් පුහුණු වැඩසටහන් පවත්වන ලදී. වනජීවී දෙපාර්තමේන්තුවේ, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නිලධාරීන් පළාත් සංචාරක අධිකාරියේ සංචාරක මඟ පෙන්වන්නන් සහ අනෙකුත් අදාළ ආයතනවල නිලධාරීන් මෙම වැඩසටහනට සහභාගී වූහ. මෙම වැඩසටහන මගින් තිරසාර සංචාරක පිළිවෙත් පිළිබඳ සහභාගිවන්නන්ගේ දැනුම ශක්තිමත් කරන ලද අතර සංචාරක මාර්ගෝපදේශක බලපත්‍ර අවශ්‍යතා සපුරාලීම සඳහා ඔවුන්ගේ සූදානම වැඩි දියුණු කරන ලද අතර එමඟින් කලාපයේ සහ ජෛවවිවිධත්වයට අනුකූලව සංචාරක කටයුතු සංවර්ධනයට සහය වීම සිදුකරන ලදී.

රාජ්‍ය නිලධාරීන් සඳහා භූගෝලීය තොරතුරු පද්ධති (GIS) පිළිබඳ පුහුණු වැඩසටහන පැවැත්වීම

ජෛවවිවිධත්ව සංරක්ෂණය සඳහා භූගෝලීය තොරතුරු පද්ධති (GIS) භාවිතා කිරීම පිළිබඳ රාජ්‍ය නිලධාරීන් සඳහා තෙදින පුහුණු වැඩසටහනක් අනුරාධපුර මිහින්තලේ රජරට විශ්වවිද්‍යාලයේදී පැවැත්විණි.

ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමින් ජෛවවිවිධත්ව සංරක්ෂණ සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබන පාරිසරික කළමනාකරණය, ස්වභාවික සම්පත් සංරක්ෂණය, වන වගාව, කෘෂිකර්මාන්තය සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍ර නියෝජනය කරමින් නිලධාරීන් 35 දෙනෙකු සඳහා පවත්වන ලද මෙම වැඩසටහන දත්ත රැස් කිරීම සහ සිතියම්ගත කිරීමෙහි නියැලී සිටින නිලධාරීන් සඳහා පවත්වනු ලැබූ අතර එය භූගෝලීය තොරතුරු පද්ධති(GIS) පාදක සංරක්ෂණ සැලසුම්කරණය සහ තීරණ ගැනීමේදී ඔවුන්ගේ තාක්ෂණික ධාරිතාව වැඩි දියුණු කිරීම පිණිස සිදු කරන ලදී.

අරිප්පු පාසල් භූමිය තුල ඉගෙනුම් අවකාශය වැඩිදියුණු කිරීම සඳහා පොකුණු ඉදිකිරීම

මන්නාරම අරිප්පු පාසල් භූමිය තුල ස්වභාවික සම්පත් සංරක්ෂණය සහ තිරසාර කළමනාකරණයට අදාලව පොකුණු දෙකක් නිර්මාණය කිරීම සහ එම පොකුණු අවට ප්‍රදේශය ස්වභාවික පරිසරයක් නිර්මාණය කිරීම තුලින් පරිසර අධ්‍යාපනය පිළිබඳ පාසැල් දරුවන්ට අවබෝධයක් ලබා දීමට මෙමඟින් අවස්ථාව සැලසේ.

2.3.2 ශ්‍රී ලංකාව තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම

මේ වනවිට, ඕසෝන් ක්ෂයකාරක රසායන ද්‍රව්‍යයක් වන හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFC) ශ්‍රේණියේ රසායන ද්‍රව්‍යයන් 2030 වන විට 100% පරිභෝජනය අවම කිරීමට අපේක්ෂිතය. තවද, කිගාලි ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කිරීමේ පූර්ව ව්‍යාපෘතිය යටතේ (Preparation of Kigali Implementation Plan) 2024 සිට 2029 දක්වා අදියර I සැලසුම් කාලරාමුව තුල HFC අවම කිරීමේ කළමනාකරණ සැලැස්ම සකස් කර අනුමත කර ඇත. එමඟින් 2045 වර්ෂය වන විට 80%කින් HFC සමස්ත පරිභෝජනය අඩු කිරීමට සැලසුම් කර ඇත.

ඒ අනුව HCFC ආනයනය කිරීම පාලනය කිරීම සඳහා බලපත්‍ර ක්‍රමවේදය ක්‍රියාත්මක වීම හා කෝටා නිකුත් කිරීම සිදු වන අතර 2024 වසරේ සිට HFC සඳහා කෝටා ක්‍රමවේදය ක්‍රියාත්මක වේ.

ඕසෝන් ප්‍රහීනකාරක රසායනික ද්‍රව්‍ය පාලනය සඳහා ක්‍රියාත්මක යාන්ත්‍රණය යටතේ HCFC හා HFC ආනයනය කිරීමට සුදුසුකම් ලත් ආයතන 64 ක් වෙත කෝටා නිකුත් කිරීම සිදු කරන ලදී. මෙම කෝටාව ආනයනය කිරීමේදී ජාතික ඕසෝන් ඒකකයේ නිර්දේශය මත ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ආනයන පාලන බලපත්‍රයක් සහිතව ආනයනය කිරීම සිදු කරන අතර HFC පසුවිපරම් කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ ASYCUDA පද්ධතියට පිවිසීමට හැකියාව ලැබී ඇත. එමෙන්ම ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මගින් හඳුන්වා දී ඇති STRAT LINK පද්ධතිය සමඟ සම්බන්ධ වී මෙම කෝටා ආනයනය තවදුරටත් විධිමත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

HFC ශ්‍රේණියේ රසායනික ද්‍රව්‍යය අදියර ගතව සීමා කිරීම පිළිබඳ මොන්ට්‍රියල් සන්ධානයේ කිගාලි සංශෝධනයට අනුරූප ජාතික වගකීම් ඉටු කිරීම ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රයේ නියුතු පිළිගත් සහතිකයක් හා විධිමත් පුහුණුවක් නොමැති කාර්මිකයින්ගේ සේවය ප්‍රමිතිකරණයට ලක් කර ජාතික වෘත්තීය පුහුණු සහතිකයක් (NVQ -4) පිරිනැමීම සඳහා ජාතික ඕසෝන් ඒකකය මූල්‍යමය දායකත්වය හා තාක්ෂණ ධාරිතා වර්ධනය ඉහල නැංවීම සිදු කරන ලදී.

මේ යටතේ කාර්මික ශිල්පීන් 29 ක් සඳහා මූල්‍ය හා තාක්ෂණ දායකත්වය ලබාදී ඇත. එමඟින් විධිමත් සහතිකකරණයක් කිරීම තුලින් හොඳ සේවා පුරුදු (GSP) පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබා ගන්නා අතර ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ උපකරණ භාවිතය පිළිබඳ මනා පලපුරුද්දක් ලබාගැනීමටද හැකියාව ඇතිවේ.

මීට අමතරව පෙර ඉගෙනුම් පාදක ඇගයීම් ක්‍රමවේදය ඔස්සේ (RPL) සහතිකරණයක් ලබාගත් කාර්මිකයින් සඳහා, බලපත්‍රලාභී කාර්මිකයකු වීම (Licensed Technician) සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ වන විට මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) සමඟ සහයෝගීව ජාතික ඕසෝන් ඒකකය විසින් සිදු කරන ලදී. RAC කාර්මික ශිල්පීන් 247 දෙනෙකු NVQ මට්ටම 3 ලබා ගන්නා ලදී.

මොන්ට්‍රියල් සන්ධානයේ බැඳීම් හා එහි ජාතික ක්‍රියාකාරිත්වය පිළිබඳව පවත්වන ලද වැඩමුළු පහත පරිදි වේ.

ඕසෝන් ක්ෂකාරක රසායන ද්‍රව්‍ය හා ඕසෝන් ක්ෂකාරක නොවන රසායන ද්‍රව්‍ය පාලන ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු 6 ක් භාණ්ඩ නිශ්කාශන අංශයේ රේගු නිලධාරීන් සඳහා පවත්වන ලදී.

නවතම ශීතකරණ හා වායුසමන උපකරණ සංවර්ධන පිළිබඳව දැනුම සහ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා, සහ හොඳ සේවා පුරුදු අනුගමනය කිරීමට, පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළු 4 ක් පවත්වා ඇත.

ශීතකරණ හා වායුසමන ක්ෂේත්‍රයේ යහපුරුදු හා ගිනිගන්නා සුළු ශීතකාරක හා ඒවා අඩංගු උපකරණ හැසිරවීම පිළිබඳ පුහුණු වැඩමුළු 06 ක් කාර්මික ශිල්පීන් සඳහා පවත්වන ලදී.

වාණිජ ශීතකරණ හා මධ්‍යම වායු සමන යන්ත්‍රෝපකරණ ක්ෂේත්‍රයේ සේවය කරන තාක්ෂණික නිළධාරීන් සඳහා ගිනි ගන්නා සුළු ශීතකාරක හැසිරවීම හා ශීතකරණ ක්ෂේත්‍රයේ යහ පුරුදු පිළිබඳ වැඩමුළු 06 ක් පවත්වන ලදී.

ශීතකරණ හා වායුසමන (RAC) සහ ජංගම වායු සමන (MAC) ක්ෂේත්‍රයේ වැඩහල් අධීක්ෂණය සහ ඇගයීම සඳහා වැඩසටහන් 05 ක් පවත්වන ලදී.

මධ්‍යම වායු සමන සැලසුම් උපදේශකයින්, විවිධ සංගම් සහ අවසාන පරිශීලකයින් සඳහා, ඕසෝන් ප්‍රහීනකාරක රසායනික ද්‍රව්‍ය/HFC භාවිතයෙන් ඉවත් කිරීම/අඩු කිරීම පිළිබඳව අවබෝධ වැඩිදියුණු කිරීම සඳහා සහ ඕසෝන් ක්ෂකාරක නොවන රසායන ද්‍රව්‍ය සහ අඩු ගෝලීය උණුසුම් විභවයක් සහිත ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීමේ වැඩමුළු 07 ක් පවත්වන ලදී.

පුහුණු වැඩසටහන් පැවැත්වීම

ශ්‍රී ලංකාවේ කාර්මික, වෘත්තීය අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථාන 9 ක් වෙත රු. මි. 22.5 වටිනාකමින් යුතු වායු සමන හා ශීතකරණ (RAC) ක්ෂේත්‍රයට අදාල පුහුණු උපකරණ සහ යන්ත්‍ර බෙදා දෙන ලදී.

ශීතකාරක එකතු කිරීමේ හා ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම් වැඩමුළු 02 ක් පවත්වන ලදී.

බාලදක්ෂිකා සංගමය හා ජාතික ඕසෝන් ඒකකය ඒකාබද්ධව ඕසෝන් මිතුරු වැඩසටහනක් පවත් වන ලදී.

ජාතික ඕසෝන් ඒකකය මඟින් ඕසෝන් පුහුණුකරුවන් ලෙස පුහුණු කරවන ලද මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් මඟින් දිවයින පුරා විවිධ පාර්ශවකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පවත්වන ලදී.

2.3.3 ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ POPs පළිබෝධනාශක සහ සෞඛ්‍ය සේවා අංශයේ රසදිය හා අපද්‍රව්‍ය සඳහා වූ ඒකාබද්ධ කළමනාකරණය හා පාරිසරිකව සුදුසු බැහැරලීම

දිගුකල් පවත්නා කාබනික දූෂක පිලිබඳ ජාතික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යාවත්කාලීන කිරීම මෙම ව්‍යාපෘතියේ එක් ප්‍රධාන ක්‍රියාකාරකමක් වේ. මේ සඳහා උපදේශක සමාගමක් තෝරා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු මේ වනවිට අවසන් කර ඇත.

මධ්‍යම පරිසර අධිකාරිය, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සම්බන්ධ කරගනිමින් රසායනික ද්‍රව්‍ය ආනයනය පිළිබඳව මධ්‍යගත ඩිජිටල් දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා පද්ධති විශ්ලේෂණ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

සෞඛ්‍ය අංශයේ රසදිය හා රසදිය අඩංගු උපකරණ භාවිතය පිලිබඳ තක්සේරුව සිදු කරමින් පවතී. මේ වනවිට Asia Recycling ආයතනයේ ගබඩා කොට ඇති CFL බල්බ වල අඩංගු වූ රසදිය මෙම ව්‍යාපෘතිය හරහා පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම සම්බන්ධයෙන් වන මූලික කටයුතු සිදු කරමින් ඇත .

මධ්‍යම පරිසර අධිකාරිය, පාරිභෝගික කටයුතු අධිකාරිය, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා සබරගමු විශ්වවිද්‍යාලය යන ආයතනයන්හි රසායනාගාර වල දිගුකල් පවත්නා කාබනික දූෂක සහ රසදිය අන්තර්ගත ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා අවශ්‍ය රසායනාගාර උපකරණ ලබා දීම ව්‍යාපෘතිය මගින් සිදු කෙරෙන අතර එම උපකරණ මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය මේ වනවිට සිදු කරමින් පවතී.

වයඹ පලාතේ හා නැගෙනහිර පලාතේ සෞඛ්‍ය අංශයේ ජනනය වන සායනික අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම සඳහා මූලික අධ්‍යනයක් සිදු කරමින් පවතී.

2.3.4 කෘෂිකර්ම, වනාන්තර හා වෙනත් ඉඩම් පරිහරණ ක්ෂේත්‍ර සඳහා විනිවිදභාවය වැඩිදියුණු කළ රාමුවක් සකස් කිරීමේ ව්‍යාපෘතිය

කෘෂිකර්ම, වනාන්තර හා වෙනත් ඉඩම් පරිහරණ ක්ෂේත්‍රය සඳහා විනිවිදභාවය වැඩිදියුණු කළ රාමුවක් සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෝලීය පාරිසරික පහසුකමේ මුල්‍ය ප්‍රදානයක් යටතේ පරිසර අමාත්‍යාංශය විසින් එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සහයෝගයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම, වනාන්තර හා වෙනත් ඉඩම් පරිහරණ ක්ෂේත්‍රය සඳහා ප්‍රගතිය විනිවිදභාවයෙන් යුතුව වර්තාකිරීම සඳහා ඊට අදාළවන්නා වූ ජාතිකව නිර්ණය කළ දායකත්වයන්හි ප්‍රගතිය වාර්තාකරණයේදී හා හරිතාගාර වායු ඉන්වෙන්ට්‍රිය අවශ්‍ය දත්ත හා තොරතුරු ගබඩා කිරීම හා සත්‍යාපනය සඳහා දත්ත පද්ධතියක් සකස් කර අවසන් කරන ලදී.

එමෙන්ම පැරිස් ගිවිසුමෙහි 13 වන වගන්තිය අනුව පාර්ශව රාජ්‍යයන් විසින් දේශගුණික විපර්යාසවල ප්‍රගතිය වාර්තා කිරීමේ විනිවිදභාවය සහතික කිරීම සඳහා ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයට අනුකූලව කෘෂිකර්ම, වනාන්තර හා වෙනත් ඉඩම් පරිහරණ ක්ෂේත්‍රය සඳහා දත්ත හා තොරතුරු රැස් කිරීම, සත්‍යාපනය හා වාර්තාකරණය

සඳහා ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් 40 ක් විෂය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක් ඇති උපදේශකවරුන්ගේ සහභාගිත්වයෙන් යුතුව, විනිවිදභාවය වැඩිදියුණු කළ රාමුව සඳහා දත්ත මැනීම, සත්‍යාපනය හා වාර්තාකරණය සඳහා පාර්ශවයන් පුහුණු කිරීමේ වැඩසටහන් තුනක් පැවැත්විය. අදාල පුහුණු කිරීම් සඳහා අත්පොතක් සකස් කර පාර්ශවකරුවන්ගේ පරිශීලනයට යොමු කරන ලදී.

වනාන්තර මැනීම හා වන යොමු මට්ටම අදාළව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර ගෙන යන අතර එම දත්ත පිළිබඳ භූමි නිර්වද්‍යතාවය තහවුරු කරමින් දැනට වනාන්තර සිතියම් ගත කිරීම අවසන් අදියරේ සිදු වෙමින් පවතී. එමෙන්ම වන යොමු මට්ටම සකස් කිරීම සඳහා උපදේශක කණ්ඩායමක් පත් කරගෙන ඇත.

හරිතාගාර වායු විමෝචනය හා අවශෝෂණය ගණනය සඳහා අවශ්‍ය වන්නාවූ ශ්‍රීලංකාවට අදාල විමෝචන අගයන් ලබා ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධන විශ්වවිද්‍යාලය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සමග කටයුතු කරගෙන යමින් පවතී.

තවද, ජාතික විනිවිදභාවයෙන් යුතුව වාර්තා කිරීමේ ක්‍රමවේදය අධීක්ෂණ සහ වාර්තාකරණ සඳහා මාර්ග සිතියම පාර්ශවකරුවන්ගේ සක්‍රීය සහභාගීත්වය ඇතිව සකස් කරන ලදී. දත්ත පද්ධතිය සඳහා දත්ත සපයන්නන් පුහුණු කිරීම සඳහා මිනුම් ප්‍රොටෝකෝලය සහ QC / QA ප්‍රොටෝකෝල සකස් අවසන් කරන ලදී. මෙම තාක්ෂණික මෙවලම් සැකසීම සඳහා තාක්ෂණික කමිටු පත්කර එම දැනුම් යොදා ගනිමින් එම මෙවලම් වලංගු භාවය තහවුරු කර ඇත.

2.3.5 එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැළක්වීමේ සම්මුතියේ වාර්තාකරණය පිළිබඳ දත්ත රැස්කිරීම සඳහා ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩසටහන

එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය වැළක්වීමේ සම්මුතියේ අධීක්ෂණය හා වාර්තාකරණය වැඩිදියුණු කිරීමට යොමු කිරීම සඳහා පාර්ශවකාර ආයතන හා ව්‍යක්තිකයන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘතිය (ගෝලීය පරිසර පහසුකම - 7 - Umbrella IV) යටතේ භූමිය පදනම් කර ගනිමින් සකස් කරනු ලැබූ ජාතික දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා ආයතික හා තාක්ෂණික ධාරිතාවය වර්ධනය කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට සහාය ලබා දීමේ අරමුණින් පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරනු ලැබීය.

ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යය වන වාර්තාකරණ කාර්යය සඳහා දත්ත ගබඩා කර සේවාදායක පරිගණකයක් පිහිටුවීම සම්බන්ධයෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ උපදේශන සේවය ලබාගනිමින් එම කාර්යය 2025 වසරේදී සාර්ථකව අවසන් කර ඇත. භූමිය පදනම් කරගත් භූමි පරිහරණ දත්ත, භූමි ආවරණ දත්ත, පාංශු කාබන් කාබනික දත්ත, පාරිසරික සංවේදී කලාප දත්ත හා ජල මූලාශ්‍ර පිළිබඳ දත්ත එකතුවකින් මෙම සේවාදායක පරිගණකය සමන්විත වේ. www.nrm.env.gov.lk යනුවෙන් වෙබ් අඩවියක් මේ සම්බන්ධයෙන් ප්‍රතිස්ථාපය කර ඇති අතර එයින් තොරතුරු සංසරණය සඳහා මහ සලසයි.

උක්ත සේවාදායක පරිගණයේ පරිපාලනය හා දත්ත සංසරණය සම්බන්ධයෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ උපදේශන මණ්ඩලය විසින් එක්දින පුහුණු වැඩමුළුවක් සැසි ද්විත්වයක් යටතේ පවත්වා ඒ සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලබාදෙන ලදී. එමෙන්ම, සේවාදායක ප්‍රධාන පරිගණකයේ දත්තවලට යම් ස්වාභාවික ආපදාවකදී හානි සිදුවුව හොත් අපාදා ප්‍රතිසාධනයක් (Disaster Recovery) වශයෙන් ක්‍රියාකරන Network attached - Storage (NAS) උපාංගය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පිහිටුවීමට කටයුතු කර ඇත.

2.3.6 දේශගුණික විපර්යාස වල තීව්‍ර වන බලපෑම් මගින් අවදානමට ලක්විය හැකි ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ප්‍රජාවන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම" සඳහා වන කලාපීය ව්‍යාපෘතිය

දේශගුණික විපර්යාස වල තීව්‍ර වන බලපෑම් මගින් අවදානමට ලක්විය හැකි ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ප්‍රජාවන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම"(ADAPT4R) සඳහා වන කලාපීය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. මෙහිදී කලාපීය සමෝධානික ප්‍රවේශයක් යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ දේශගුණික විපර්යාස වලට පාත්‍රී ප්‍රජාවගේ දේශගුණික වෙනස්වීම් වලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සහ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම ව්‍යාපෘතියේ ඉලක්ක කර

ශ්‍රී ලංකාවේ මොණරාගල, ත්‍රිකුණාමලය, මන්නාරම , මුලතිව් , වව්නියාව සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කෙරේ.

පළමු වසර තුළ ADAPT4R වැඩසටහනට අදාළ ක්‍රියාකාරකම් දිස්ත්‍රික්ක 06 ක් පුරා සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. එහිදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් පහත පරිදි වේ.

1. මඩු ප්‍රදේශයෙහි තෝරාගත් තරුණ ගොවීන් සඳහා අනුරාධපුර හි පිහිටි මහඉලුප්පල්ලම ගොවිපල යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය සහ ගොවිපල යාන්ත්‍රික සේවා පුහුණු මධ්‍යස්ථානය තුළ දින දෙකක ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.
2. කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් කාන්තා හා තරුණ ව්‍යාපාර සංවර්ධන වැඩමුළුවක් සංවිධානය කරන ලදී.
3. මන්නාරම දිස්ත්‍රික්කයේ Good Agricultural Practices (GAP) පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.
4. මුලතිව් ප්‍රදේශයේ පශු සම්පත් ගොවීන් සඳහා විශේෂ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
5. සෙවනගල සහ කතරගම ප්‍රදේශවල බීජ වී වගාවට අදාළ පළමුවන පුහුණු වැඩසටහන සාර්ථකව පවත්වන ලදී.

2.3.7 හවුල්කාරිත්ව සහ නව මූල්‍ය ක්‍රමවේද මඟින් ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ ජෛවවිවිධත්වය අනුප්‍රවාහගත කිරීම සහ තිරසර භූමි කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය

ගෝලීය පාරිසරික පහසුකම් යටතේ මූල්‍යාධාර සපයනු ලැබූ මෙම පස් අවුරුදු ව්‍යාපෘතිය පරිසර අමාත්‍යාංශය, වැවිලි හා ප්‍රජා යටිගල පහසුකම් අමාත්‍යාංශය හා එක්ව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හරහා ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම ව්‍යාපෘතිය මඟින් දිස්ත්‍රික්ක 11ක සිතියම්ගත කිරීමේ කටයුතු, ස්ථානීය හා පරිභාහිර සංරක්ෂණ කටයුතු , ජෛවවිවිධත්ව සංරක්ෂණ කටයුතු හා තිරසර භූමි කළමනාකරණය, නිෂ්පාදිතාවය වැඩිකිරීම, කෘෂි වනවගා, පාරිසරි සංචාරක කර්මාන්තය, බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම හා ස්ත්‍රී පුරුෂභාවය හා පාරිසරික කරුණු පිලිබඳ අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම, ව්‍යාපෘතියට සම්බන්ධ කණ්ඩායම්වල ධාරිතා වර්ධනය සඳහා අවශ්‍යතාවයන් හඳුනාගැනීම හා පුහුණු මොඩියුල සකස් කිරීම සිදු කරනු ලබයි. ඉහත කාර්යයන් ශ්‍රී ලංකාවේ තේ හා රබර් නිෂ්පාදන ප්‍රදේශයන් ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරනු ලබන අතර වැවිලි ක්ෂේත්‍රයේ මෙහෙයුම් කටයුතු වැඩිදියුණු කර ගැනීමට සහාය වනු ලබයි.

ජෛවවිවිධත්වය සමීක්ෂණ සිදු කිරීම

කෑගල්ල හා කළුතර යන දිස්ත්‍රික්කවල වතු 31ක මුහුණට මුහුණ සමීක්ෂණ සිදු කිරීම

ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිෂ්ඨාපන ප්‍රදේශ 4ක්, ඛණ්ඩනයට ලක්වූ වනාන්තර කැබැලි සම්බන්ධ කරන්නා වූ මංපෙත් 2ක්, ගංගා දෙපස වූ ප්‍රදේශ 2ක්, පාරිසරික සංචාරක කර්මාන්තය නංවාලීමට හැකි ප්‍රදේශ 2ක් සමඟ පැල තවාන් 4ක් ස්ථාපිත කිරීමට යෝග්‍ය ප්‍රදේශ මේ වන විට ව්‍යාපෘතිය මඟින් හඳුනාගෙන ඇත.

තෙවැනි නියමු ප්‍රදේශය ලෙස ලුල්කඳුර වතුයායේ ප්‍රාථමික සමීක්ෂණයක් හා නිෂ්පාදනයන් සඳහා වූ තක්සේරුවක් සිදු කරන ලදී.

ස්ත්‍රී පුරුෂභාවය අනුප්‍රවාහගත කිරීම හා ව්‍යාපෘතිය අධීක්ෂණය හා නියාමනය සඳහා වැඩමුළු පවත්වන ලදී.

ශ්‍රී ලංකාවේ තෙත් හා අතරමැදි කළාපයන්හි දිස්ත්‍රික්ක 11ක පවතින වතු සමාගම්වලට අයත් ඉඩම්වල පවතින වනාන්තර සිතියම්ගත කිරීමේ කටයුතු ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි. මෙම සිතියම්ගත කිරීමේ කටයුතු සිදු කිරීමට පෙර ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් පිළිබඳ අදාළ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් නිළධාරීන් මේ පිළිබඳව දැනුවත් කිරීමේ කටයුතු සිදු කරන ලදී.

ජෛවවිවිධත්වය සමීක්ෂණය

2.3.8 මිනමාටා සම්මුතියට අයත් විශේෂිත ජාත්‍යන්තර වැඩසටහන යටතේ ක්‍රියාත්මක රසදිය අඩංගු හා රසදිය මිශ්‍ර වූ අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ජාතික ධාරිතා වර්ධන ව්‍යාපෘතිය

ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ සහ රත්නපුර ශීක්ෂණ රෝහලේ භාවිතයෙන් ඉවත් කර ඇති CFL හා TFL බල්බ කිලෝග්‍රෑම් 2620.17ක් ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කර ඇත.

2025 නොවැම්බර් මස ඇතිවූ ගං වතුර අපදා තත්ත්වයේදී කොලොන්නාව නගර සභා හා කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුල එක්රැස් වූ රසදිය අන්තර්ගත බල්බ ඇතුළු විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස බැහැර කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සපයන ලදී.

2.3.9 ශ්‍රී ලංකාවේ පළමු සහ දෙවන ද්වි වාර්ෂික විනිවිදභාවය පිලිබඳ වාර්තා හා ජාතික සන්නිවේදන වාර්තා එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්‍යාස පිලිබඳ රාමුගත සම්මුතියට ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය (UNFCCC) සහ පැරිස් ගිවිසුම යන දෙකටම පාර්ශවකාර රාජ්‍යයක් වශයෙන් 2024 වසරේ සිට දෙවසර කාලයකට වරක් ද්විවාර්ෂික විනිවිද භාවය පිළිබඳ වාර්තාව (BTR) ඉදිරිපත් කළ යුතුය. එබැවින් ශ්‍රී ලංකාව විසින් 1වන BTR වාර්තාව 2024 දෙසැම්බර් 31වන දින ඉදිරිපත් කරන ලද අතර 2වන BTR වාර්තාව 2026 දෙසැම්බර් අවසානය වන විට ඉදිරිපත් කිරීමට නියමිතය. මෙම වසරේදී, 1වන BTR වාර්තාවේ මුද්‍රණය සිදුකළ අතර දෙවන ද්විවාර්ෂික විනිවිදභාවය පිළිබඳ වාර්තාව සහ ජාතික සන්නිවේදන වාර්තාව සකස් කිරීම සම්බන්ධ අදාල රාජ්‍ය ආයතනික පාර්ශ්වකරුවන්ගේ දැනුම සහ කුසලතා වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වේ.

මේ සම්බන්ධයෙන්, පළමු ද්විවාර්ෂික විනිවිදභාවය විශ්ලේෂණ කිරීමට, ක්‍රමවේදය සහ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම පිළිබඳ වූ වැඩමුළුවක් පවත්වන ලදී. තවද, දෙවන ද්විවාර්ෂික විනිවිදභාවය පිළිබඳ වාර්තාවේ දත්ත සහ තොරතුරු රැස් කිරීම පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ උපදේශනය සහිතව සම්පූර්ණ කරන ලදී. විශේෂඥයින් සහ පාර්ශ්වකරුවන් සඳහා පාර්ශ්වකරුවන්ගේ වැඩමුළු 16 ක් පවත්වන ලදී. ඊට අමතරව, BTR 2 සහ 4 වන ජාතික සන්නිවේදන වාර්තාව සකස්කිරීමට අදාල කාර්ය නිර්ණ පත්‍රිකා උපදේශකවරුන් වෙත යවා ඇත.

2.4 අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ප්‍රගතිය

2.4.1 මධ්‍යම පරිසර අධිකාරිය

මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2025 වර්ෂය තුල සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්

මූල්‍ය ප්‍රගතිය

2025 වසරේ මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය ප්‍රගතිය

විස්තර	වාර්ෂික ප්‍රතිපාදන 2025 (රු. මිලියන)	මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන)	%
මුළු පුනරාවර්තන අයවැය	1,413.69	1,414.43	100.05%
වැටුප් සහ වේතන (භාණ්ඩාගාරයෙන්)	889.00	940.63	105.81%
මෙහෙයුම්, නඩත්තු සහ අනෙකුත් සංවර්ධන ක්‍රියාකාරකම් (මධ්‍යම පරිසර අධිකාරියේ ආදායමෙන්)	524.69	473.80	90.30%
ප්‍රාග්ධන අයවැය	75 .00	75.00	100%
ව්‍යාපෘති			
පාරිසරික ප්‍රවර්ධන වැඩසටහන	40.00	24.12	60.03%
පාරිසරික අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන	40.00	29.46	73.65%
මධ්‍යම පළාත් කාර්යාලය ගොඩනැගිල්ලේ පළමු මහලේ ඉදිකිරීම් නිම කිරීම.	20.00	20.00	100%
ජාතික උපායමාර්ගික පාරිසරික තක්සේරුව	10.00	9.96	99.60%

භෞතික ප්‍රගතිය

GovPay ඩිජිටල් ගෙවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීම

2025 සැප්තැම්බර් 26 වන දින, මධ්‍යම පරිසර අධිකාරිය විසින් GovPay රජයේ ඩිජිටල් ගෙවීම් පද්ධතිය නිල වශයෙන් දියත් කරන ලදී. ඒ හරහා බලපත්‍ර ගාස්තු, පරීක්ෂණ ගාස්තු, අනුමත පත්‍ර සහ අපද්‍රව්‍ය කළමනාකරණ ගාස්තු ඇතුළු සියලුම සේවා ගෙවීම් බැංකු 14ක් සහ මූල්‍ය තාක්ෂණ (FinTech) යෙදුම් 6ක් ඔස්සේ ඩිජිටල් ක්‍රමයට සිදු කිරීමට පහසුකම් සලසා ඇත.

පරිසර දූෂණ පාලනය:

මධ්‍යම පරිසර, "අ", "ආ" සහ "ඇ" කාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති කර්මාන්ත සඳහා දිවයින පුරා කර්මාන්ත 30,569 ක් පරිසර ආරක්ෂණ බලපත්‍ර යෝජනා ක්‍රමයට ඇතුළත් කර ඇති අතර, එමඟින් 2025 වර්ෂය තුළ නව පරිසර ආරක්ෂණ බලපත්‍ර 3,475 ක් නිකුත් කරන ලද අතර 13,722 ක් අලුත් කරන ලදී.

මධ්‍යම පරිසර අධිකාරිය විසින් නව කර්මාන්ත සඳහා පාරිසරික නිර්දේශ (ER) 1,255ක් නිකුත් කර ඇත.

කර්මාන්ත වල පාරිසරික අනුකූලතාවය සහ පසුවිපරම්

කර්මාන්තවල පාරිසරික අනුකූලතාව වැඩි දියුණු කිරීම සඳහා, මධ්‍යම පරිසර අධිකාරිය තාක්ෂණික මඟ පෙන්වීම සපයන විශේෂඥයින්/ උපදේශකයින් ලියාපදිංචි කිරීම, රසායනාගාර ලියාපදිංචි කිරීම, ගලි බවුසර්සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම සහ ඉහළ සහ මධ්‍යම පරිමාණයේ දූෂණයට හේතු වන කර්මාන්ත ස්ථානගත කිරීම සඳහා තාක්ෂණික මඟ පෙන්වීම වැනි උපාය මාර්ග හරහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් සපයයි.

දිස්ත්‍රික් මට්ටමේ සැලසුම්වලට අනුව කර්මාන්තවල අනුකූලතා නිරීක්ෂණය සිදු කළ අතර, "A" කාණ්ඩයේ කර්මාන්ත 404 ක්, "B" කාණ්ඩයේ කර්මාන්ත 2,010 ක් සහ "C" කාණ්ඩයේ කර්මාන්ත 1,528 ක් ආවරණය විය.

මහජන පැමිණිලි හැසිරවීම

මහජන පාරිසරික පැමිණිලි කළමනාකරණය යටතේ 2025 දී එයට පැමිණිලි 3,539 ක් ලැබුණු අතර ඉන් 2,560 ක් (72%) විසඳා ඇත.

වායු තත්ත්ව පසුවිපරම්

"නිල් අහස සඳහා පිරිසිදු වාතය" පිළිබඳ ජාත්‍යන්තර දිනය සැමරීමට සමගාමීව වායු තත්ත්ව පසුවිපරම් කිරීම සඳහා වන ජාතික වෙබ් අඩවිය (www.aq.cea.lk) දියත් කරන ලද අතර මෙමඟින් මුළු දිවයිනම ආවරණය වන පරිදි තත් කාලීන දත්ත සපයනු ලැබේ.

එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන මගින් ක්ෂුද්‍ර සංවේදක (IQAir AVO) දොළහක් (12) පරිත්‍යාග කරන ලද අතර ඒවායින් දහයක් (10) ස්ථිරව ස්ථාපනය කරන ලදී .

කොළඹ කොටුව වායු තත්ත්ව පසුවිපරම් මධ්‍යස්ථානය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2025 සැප්තැම්බර් 17 වන දින එයාර්පැරිෆ් ව්‍යාපෘතිය මගින් එලෝනා වායු තත්ත්ව නිරීක්ෂණ උපාංගය ස්ථාපනය කරන ලදී.

ජල තත්ත්ව පසුවිපරම්

මධ්‍යම පරිසර අධිකාරිය විසින් දිවයිනේ ප්‍රධාන ජල මූලාශ්‍ර සඳහා පුළුල් ජල තත්ව පසුවිපරම් වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි. දැනට මධ්‍යම පරිසර අධිකාරිය විසින් පුළුල් පරාසයක භෞතික, රසායනික හා ජීව විද්‍යාත්මක පරාමිතීන් විශ්ලේෂණය කරමින් පහත දක්වා ඇති ප්‍රධාන ජල මූලාශ්‍ර 22 ක ජල තත්ව පසුවිපරම් ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරනු ලබයි.

කැලණි ගඟේ - පූගොඩ ප්‍රදේශයේ ජල තත්ත්ව නිරීක්ෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලද අතර, එමඟින් තත්‍ය කාලීන ජල තත්ත්ව නිරීක්ෂණ, දූෂණ ප්‍රභව හඳුනාගැනීම සහ විද්‍යාත්මක ගංගා ද්‍රෝණි කළමනාකරණය වැඩි දියුණු කරන ලදී.

කලා ඔය සහ මහ ඔය සඳහා පුළුල් ක්ෂුද්‍ර ප්ලාස්ටික් විශ්ලේෂණයක් ආරම්භ කරන ලද අතර, ශ්‍රී ලංකාව පුරා ප්‍රධාන ගංගා 11 ක් දක්වා වැඩසටහන ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත.

පාරිසරික බලපෑම් තක්සේරුව

2025 වර්ෂය තුළ, මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික බලපෑම් ඇගයීම (පා.බ.ඇ.) 03 ක්, මූලික පාරිසරික පරීක්ෂණ (මූ.පා.ප.) 221 ක් සහ අතිරේක පාරිසරික බලපෑම් ඇගයීම් 02 ක් සඳහා අනුමැතිය ලබා දෙන ලදී. 2025 වසර තුළ තවමත් නිම කර නොමැති ව්‍යාපෘති සඳහා පා.බ.ඇ 08 ක් සහ මූ.පා.ප 06 ක් සඳහා ද අනුමැතිය දීර්ඝ කරන ලදී.

රැස්වීම්, ක්ෂේත්‍ර චාරිකා මෙන්ම අදාළ පසුවිපරම් වාර්තා සමාලෝචනය කිරීම මඟින් ව්‍යාපෘති තිහක් (30) පසුවිපරම් කරන ලදී.

ස්වභාවික සම්පත් කළමනාකරණය

ජාතික තෙත්බිම් වැඩසටහනට අනුකූලව දිස්ත්‍රික් මට්ටමේ තෙත්බිම් දින වැඩසටහන් 25ක් සාර්ථකව සංවිධානය කර නිම කරන ලදී.

තිරසාර පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ කළමනාකරණය සහතික කිරීම සඳහා, කමිටු රැස්වීම් 15 ක් සහ පසුවිපරම් පරීක්ෂණ 19 ක් පවත්වන ලදී. ඊට අමතරව, ස්වාභාවික සම්පත්, තෙත්බිම් සහ ප.ආ.ප්‍ර සම්බන්ධ මහජන පැමිණිලි දොළහක් ඵලදායී ලෙස විසඳා ගන්නා ලදී.

"ක්ලීන් ශ්‍රී ලංකා" ජාතික වැඩසටහන යටතේ හාලිඇල ජල මූලාශ්‍ර රක්ෂිත ව්‍යාපෘතියේ රක්ෂිත මායිම් වෙන් කිරීමට, ස්ථිර මායිම් කණු 9,436 න් 8,600 ක් දැනටමත් සකස් කර ස්ථාපනය සඳහා සූදානම් කර ඇත.රක්ෂිත තුළ වෘක්ෂලතා ආවරණය වැඩි දියුණු කිරීමට ශ්‍රමදාන තුනක් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වා ඇති අතර, ජීව වැට සඳහා අවශ්‍ය පුවක් සහ කිතුල් බීජ මිලදී ගෙන ඇත.

උපායමාර්ගික පාරිසරික ඇගයීම

ජාතික උපායමාර්ගික පාරිසරික ඇගයීම (NSEA) මෙහෙයුම් කමිටු රැස්වීමේදී, නිර්ණේය විෂය පථයෙහි පළමු අදියර ලෙස මුළු දිවයිනම ආවරණය වන පරිදි ජාතික පාරිසරික සංවේදීතා දර්ශක සිතියමක් සකස්කිරීම කිරීමට තීරණය කරන ලද අතර සිතියම සකස් කිරීම සඳහා සුදුසු උපදේශන සමාගමක් තෝරා ගන්නා ලදී.

පොලිතීන් සහ ප්ලාස්ටික් රෙගුලාසි බලාත්මක කිරීම

පොලිතීන් සහ ප්ලාස්ටික් රෙගුලාසි බලාත්මක කිරීම යටතේ, 2025 වසර තුළ දී, මුළු වැටලීම් 7,208 ක් සිදු කරන ලද අතර, අයිතමය අනුව වැටලීම් සංඛ්‍යාව 22,429 ක් වූ අතර, හඳුනාගත් මුළු උල්ලංඝනයන් සංඛ්‍යාව 557 කි. වාර්තාකරණ කාල සීමාව තුළ පොලිතීන් ආහාර දවටන කිලෝග්‍රෑම් 4,543 (ටොන් 5.01) ක් අත්අඩංගුවට ගන්නා ලදී.

උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය

මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2025 වසර තුළ දී උපලේඛනගත අපද්‍රව්‍ය කළමනාකරණ බලපත්‍ර 636 ක් (SWML) නිකුත් කර ඇත.

2025 වසර තුළ, බාසල් සම්මුතියේ තාක්ෂණික විශේෂඥ කමිටු රැස්වීම් හයක් (06) පවත්වන ලද අතර කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ලෙස ගන්නා අපද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා මුළු ආනයන නිෂ්කාශන 642 ක් සහ ආනයන අනුමැතීන් 59 ක් නිකුත් කරන ලදී. තවද, බාසල් සම්මුතියේ "අ" සහ "ආ" ලැයිස්තුවේ ලැයිස්තුගත කර ඇති අපද්‍රව්‍ය සඳහා දේශ සීමා හරහා ප්‍රවාහනය සඳහා එකඟතා 31 ක්, ප්‍රතිනැවුම්ගත කිරීම් සඳහා එකඟතා 39 ක් සහ අපනයනය සඳහා එකඟතා 143 (අන්තර්දේශීය චලනය) නිකුත් කර ඇත.

2025 වසරේ රසායනික කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ කොටසක් ලෙස, ඇතැම් රසායනික ආනයන සඳහා නිෂ්කාශන 391 ක් නිකුත් කර ඇති අතර ASYCUDA ආනයන අනුමැති 1,838 ක් නිකුත් කර ඇත. 2025 වර්ෂයේදී, තාක්ෂණික උපදේශක කමිටු රැස්වීම් දෙකක් (TACMIC) පවත් වී ඇති අතර, සුදු ඇස්බැස්ටෝස් ආනයනය කිරීම සඳහා ආනයන අනුමත 192 ක් ලබා දී ඇත.

උතුරු, වයඹ සහ සබරගමුව යන පළාත් 3 ආවරණය වන පරිදි පළාත්/දිස්ත්‍රික් කාර්යාල 7 ක (යාපනය, කිලිනොච්චි, වවුනියාව, මුලතිව්, කෑගල්ල, කුරුණෑගල සහ පුත්තලම) විද්‍යුත් අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන් සංවිධානය කරන ලදී.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

මධ්‍යම පරිසර අධිකාරිය යටතේ අන්තරායකර නොවන ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය එකතු කරන්නන් ලියාපදිංචි කරන ලද අතර (ක්‍රියාකාරී එකතු කරන්නන් 276 දෙනෙකු), යාවත්කාලීන කරන ලද දත්ත සමුදාය මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

2025 දී, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ආයෝජන මණ්ඩල ලියාපදිංචි පොලිමර් කර්මාන්ත හයක් සඳහා ප්ලාස්ටික්, පොලිතීන් සහ ටයර් අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 258,945 ක් සහ ටයර් 669, වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍රය හිමි අනුමත ප්‍රතිචක්‍රීකරණ සමාගම් වෙත යැවීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය ‘‘විරෝධතා නොමැති බව ප්‍රකාශ කිරීමේ ලිපි’’ නිකුත් කරන ලදි.

නැව්වලින් අනතුරුදායක නොවන/දූෂිත නොවන ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය එකතු කරන්නන් සඳහා පාරිසරික නිර්දේශ 23 ක් නිකුත් කරන ලදී.

ලැමිනේට් කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය පොලිතීන් ද්‍රව්‍ය ආනයනය කිරීමට සහ තහනම් කරන ලද ප්ලාස්ටික් භාණ්ඩ වෙනුවට භාවිත කළ හැකි විකල්ප ද්‍රව්‍ය සඳහා වන විරෝධතා නොමැති බව ප්‍රකාශ කිරීමේ ලිපි 1,016 ක් නිකුත් කරන ලදි.

ප්‍රතික්ෂේප කරන ලද ආනයනික භාණ්ඩ තොග හතරක් මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන්, රේගු සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා රේගු අනුමත ක්‍රමවේදයන් හරහා ආරක්ෂිතව සාර්ථකව විනාශ කරන ලදී.

වාර්තාගත කාලසීමාව තුළදී, ග්‍රීන් පාර්ක් ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 6,133.02ක් ක්‍රමානුකූලව කළමනාකරණය කරන ලද අතර ජෛව භායනයට ලක්වන අපද්‍රව්‍ය ටොන් 583ක් කොම්පෝස්ට් පොහොර බවට පත් කරන ලද අතර, ඒවා කෘෂිකාර්මික කටයුතු සඳහා අලෙවි කරන ලදී.

මහජන දැනුවත් කිරීම සහ අධ්‍යාපනය

“ක්ලීන් ශ්‍රී ලංකා’’ වැඩසටහන යටතේ, මධ්‍යම පරිසර අධිකාරිය දිස්ත්‍රික්ක 25 පුරාම පොලිස් නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙම වැඩසටහන්වල අවධානය යොමු වූයේ පාරිසරික නීති ක්‍රියාත්මක කිරීම, පොලිතීන්/ප්ලාස්ටික් නියාමනය, පාරිසරික ගැටළු සම්බන්ධයෙන් මහජන පැමිණිලි කළමනාකරණය සහ පාරිසරික ආරක්ෂාව සඳහා පොලිස් සහාය ශක්තිමත් කිරීම කෙරෙහි ය.

පරිසර සංරක්ෂණය සඳහා මහජන සහභාගීත්වය ඉහළ නැංවීම අරමුණු කරගනිමින්, 2025 වර්ෂයේ රාජ්‍ය නොවන සංවිධාන 229ක් ලියාපදිංචි වී ඇති අතර, 2025 වසර තුළදී සංවිධාන 05ක් අලුතින් ලියාපදිංචි කරන ලදී.

2025 වසර සඳහා වන පාරිසරික පුවත් පත්‍රිකාවේ (Newsletter) පළමු වෙළුම සකස් කර මුද්‍රණය කරන ලද අතර, එහි පිටපත් 5,000ක් පමණ බෙදා හරින ලදී. මීට අමතරව, 2025 වසර සඳහා වන "සොබාකෙත " සඟරාව ද සකස් කර බෙදා හරින ලදී.

2025 ජුනි 25 වන දින කෝට්ටේ ජනාධිපති විද්‍යාලයේදී ගරු පරිසර නියෝජ්‍ය අමාත්‍ය ඇන්ටන් ජයකොඩි මහතාගේ ප්‍රධානත්වයෙන් දීපව්‍යාප්ත පාසල් චිත්‍ර තරඟය පවත්වන ලදී. පාසල් ප්‍රජාව අතර අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම සහ නිර්මාණාත්මක කලාව හරහා පාරිසරික පණිවිඩ සන්නිවේදනය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන අඛණ්ඩව තෙවන වරටත් ක්‍රියාත්මක කරන ලදී.

පාසල් චිත්‍ර තරඟයේ සම්මාන ප්‍රදානෝත්සවය

මධ්‍යම පරිසර අධිකාරියේ කාර්ය මණ්ඩලය සහ ජාතික පාරිසරික තොරතුරු මධ්‍යස්ථානයේ (NEIC) පරිශීලකයින් වෙනුවෙන් "සොබා සිතුවම් රූ" සාක්ෂරතා ප්‍රවර්ධන වැඩසටහන දියත් කරන ලදී.

සාක්ෂරතාවය සහ කියවීමේ පුරුද්ද ප්‍රවර්ධනය කිරීමේ මූලපිරීම් වල කොටසක් ලෙස, පෙර පාසල් සහ පාසල් දරුවන් වෙනුවෙන් කතන්දර කියාදීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

2025 වර්ෂය තුළ දීප ව්‍යාප්තව පාසල් අතර පරිසර නියමු වැඩසටහන (EPP) සහ පරිසර ළමා සමාජ වැඩසටහන (Eco club) ක්‍රියාත්මක කරන ලදී.

2025 අප්‍රේල් සිට ජූලි දක්වා කාලය තුළ, දිස්ත්‍රික් සහ පළාත් පාරිසරික නියමු කඳවුරු මධ්‍යම පළාතේ, උතුරු පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ වයඹ පළාතේ පාරිසරික නියමු කඳවුරු පවත්වනු ලැබීය.

2025 ලෝක පරිසර දිනය සැමරීම සඳහා පාසල් සහ විවෘත කාණ්ඩ සඳහා තේමා 3ක් යටතේ ඡායාරූප තරඟයක් පවත්වන ලදී.

ජනාධිපති පාරිසරික පදක්කම දිනාගත් සාමාජිකයන්ගෙන් සමන්විත දිස්ත්‍රික් පාරිසරික නියමු සංසද 17ක් මධ්‍යම පරිසර අධිකාරිය විසින් පිහිටුවා ඇත.

ශිෂ්‍ය ගුරුවරුන්ගේ පාරිසරික සාක්ෂරතාවය ඉහළ නැංවීම සඳහා"හරිත නායක" වැඩසටහන විද්‍යාපීඨ තුළ ක්‍රියාත්මක කරන ලදී.

2025 වසරේදී, මධ්‍යම පරිසර අධිකාරිය විසින් පෙරපාසල් ගුරු පුහුණු වැඩසටහන යළි ආරම්භ කළ අතර, දිස්ත්‍රික්ක 24 පුරා පවත්වන ලදී.

පරිසර නියමු ජනාධිපති පදක්කම් ප්‍රදානෝත්සවය

පරිසර නියමු ජනාධිපති පදක්කම් ප්‍රදානෝත්සවය 2025 අගෝස්තු මස 21 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සාර්ථකව පවත්වන ලදී. නියමිත පාරිසරික ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම අගයමින් පාරිසරික නියමුවන් 192 දෙනෙකු මෙහිදී ජනාධිපති පදක්කමින් පිදුම් ලැබූහ.

ජනාධිපති පරිසර සම්මාන

11 වන “ජනාධිපති පරිසර සම්මාන - 2025”, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2025 ඔක්තෝබර් මස 23 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී.

පරිසර නියමු ජනාධිපති පදක්කම් ප්‍රදානෝත්සවය

මෙහිදී කර්මාන්ත, පාසල්, රාජ්‍ය සහ පෞද්ගලික ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පළාත් පාලන ආයතන, නව නිපැයුම්, පුනර්ජනනීය බලශක්ති උත්පාදන ව්‍යාපෘති මෙන්ම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඇතුළු විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් තෝරාගත් ජයග්‍රාහකයින් 132 දෙනෙකු සම්මානයට පාත්‍ර විය.

'හොඳම හරිත දුම්රිය ස්ථානය' තේරීමේ වැඩසටහන:

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ එකාබද්ධව, 2025 වසරේ හොඳම හරිත දුම්රිය ස්ථාන තේරීම "පිරිසිදු ශ්‍රී ලංකා" ජාතික වැඩසටහනට සමගාමීව සහ 2025 ලෝක පරිසර දින සැමරුමට අනුකූලව පවත්වන ලදී. ඒ අනුව, හොඳම ප්‍රධාන හරිත දුම්රිය ස්ථානය ලෙස ත්‍රිකුණාමලය දුම්රිය ස්ථානයත්, හොඳම හරිත උප දුම්රිය ස්ථානය ලෙස මීසාලෙයි උප දුම්රිය ස්ථානයත් සම්මානයට පාත්‍ර විය.

2.4.2 ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (ප්‍රයිවට්) ලිමිටඩ්

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල (පුද්ගලික) සමාගම 2008 අප්‍රේල් 09 වන දින සමාගම් අංක පී.වී.63781 යටතේ 2007 අංක 07 දරන සමාගම් පනතින් පිහිටුවන ලද රජය සතු සමාගමක් වන අතර 2020 සැප්තැම්බර් 25 වන දින අති විශේෂ ගැසට් පත්‍රයක් මඟින් පරිසර අමාත්‍යාංශය විෂය පථය යටතට ඇතුලත් කර ඇත.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදලේ නිෂ්පාදන හා සේවා

හරිතාගාර වායු සත්‍යාපනය (Carbon Foot-print Verification-ISO 14064-1, ISO 14067) සහ ජල පිය සටහන් සත්‍යාපනය (ISO 14046)

රාජ්‍ය හා පෞද්ගලික ආයතන විසින් ගණනය කරන ලද හරිතාගාර වායු විමෝචනය ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් සත්‍යාපනය කිරීමෙන් අනතුරුව ISO 14064–1:2018, ISO 14067:2018 හා ISO 14046 යනාදී අනුකූලතා සහතිකපත් එම ආයතන සඳහා පිරිනමනු ලැබේ.

ජල පියසටහන් සත්‍යාපනය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් ජල පිය සටහන් තක්සේරු කිරීමට සහ ඒ පිළිබඳ දැනුවත් කිරීමට ක්‍රියාකාරීව සිටින ජල පිය සටහන පිළිබඳව දැනුවත් කිරීම මඟින්, තිරසාර සංස්කෘතියක් පෝෂණය කිරීම සහ ධනාත්මක වෙනසක් ඇති කිරීම ශ්‍රී ලංකා දේශගුණ අරමුදලේ අරමුණු වේ.

වැඩසටහන් කාබන් පියසටහන් සත්‍යාපනය

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් යම්කිසි අවස්ථාවක ඇතිවන (වැඩමුළුවක, උත්සව අවස්ථාවක වැනි) හරිතාගාර වායු විමෝචනය සත්‍යාපන සිදුකරනු ලබයි

ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය (SLCCS)

මෙම යෝජනා ක්‍රමය මඟින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සුදුසුකම් ලත් කාබන් කළමණාකරන ව්‍යාපෘති ලියාපදිංචි කරන අතර අපේක්ෂිත පාර්ශව සඳහා ගුණාත්මක බව තහවුරු කළ ශ්‍රී ලාංකීය සහතික කරන ලද විමෝචන අඩු කිරීම් (Sri Lankan Certified Emission Reductions - SCER) නිකුත් කරනු ලබයි.

පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය (CDM)

ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් ශ්‍රී ලංකාවේ හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය භාවිතා කිරීමට ආයෝජකයින් දිරි ගැන්වීම හා පහසුකම් සැපයීම සිදු කරනු ලබයි.

තවද ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් ව්‍යාපෘති සැලසුම් ලේඛනය (PDD), අධීක්ෂණ වාර්තාව (MR) සකස් කිරීම සහ එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ (UNFCCC) පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය (CDM) යටතේ ව්‍යාපෘති ලියාපදිංචි කිරීම සහ සහතික කරන ලද විමෝචන අඩුකිරීම් (CER) නිකුත් කිරීම සඳහා වලංගු කිරීම හා සත්‍යාපන ක්‍රියාවලියට පහසුකම් සපයයි.

ශුද්ධ ශූන්‍ය බලශක්ති (Net Zero Energy) සහතිකකරණය

ශුද්ධ ශූන්‍ය බලශක්ති සංකල්පය යනු බලශක්තිය භාවිතය මඟින් බලශක්ති සංරක්ෂණ කාර්යක්ෂමතාව සහ ස්ථානීය පුනර්ජනනීය උත්පාදනය 100% සපුරා ගනු ලැබූ බලශක්ති භාවිතයයි. බලශක්ති සහතික කිරීමේ පද්ධතිය, කාබන් විමෝචනය අඩු කිරීම, බලශක්ති කාර්යක්ෂමතා තාක්ෂණය දිරිගැන්වීම හා ආයතනික මට්ටමෙන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා දේශගුණ අරමුදල විසින් සංවර්ධනය කරන ලද සංකල්පයකි.

දේශගුණික ධනාත්මක සහතිකකරණය (Climate Positive Certification)

මෙමඟින් නිෂ්පාදන,සේවා හා සංවිධානයන්හි වාර්ෂික හරිතාගාර වායු විමෝචන සහතිකකරණය කිරීම මඟින් ඒවායෙහි හරිතාගාර වායු විමෝචනය පියවා ගැනීමටත් හැකියාව ලැබී ඇත. තවද දේශගුණික ධනාත්මක සහතිකය ලබා ගැනීම සඳහා ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්හි විමෝචනය කෙරෙහි වාර්ෂිකව අවධානය යොමුකිරීම තුලින් ඔවුන්ගේ වාර්ෂික හරිතාගාර විමෝචනය සහ එය සත්‍යාපනය කරමින් අතිරික්ත ප්‍රමාණය අළෙවි කර ගැනීමට ද අවස්ථාව සලසා දී ඇත.

උපදේශන සේවාවන්

කාබන් අවම ආර්ථිකයක් ගොඩනැගීම සඳහා තීරණ ගැනීමට අවශ්‍ය මහපෙන්වීම හා නායකත්වය සපයයි. තවද ජාතික හරිත වාර්තාකරණ පද්ධතිය සඳහා උපදේශන සේවාවන් සපයයි.

විද්‍යාව මත පදනම් වූ ඉලක්ක සඳහා උපදේශනය (SBTi)

ආයතන සඳහා SBTi සැකසීම සඳහා ශ්‍රී ලංකා දේශගුණික අරමුදල උපදේශන සපයයි. නවතම දේශගුණ විද්‍යාව සමඟ සමපාත වන විමෝචන අඩු කිරීමේ ඉලක්ක සැකසීමට සමාගම් සඳහා ක්‍රමානුකූල සහ විද්‍යාව පදනම් කරගත් ප්‍රවේශයක් SBTi මුල පිරීම් සපයයි. මෙම ඉලක්ක සැලසුම් කර ඇත්තේ පැරිස් ගිවිසුමේ දක්වා ඇති පරිදි පූර්ව කාර්මික මට්ටමට වඩා සෙල්සියස් අංශක 2 ට වඩා අඩුවෙන් ගෝලීය උණුසුම සීමා කිරීමේ ගෝලීය ප්‍රයත්නයට අනුකූල වන පරිදි ය.

ශ්‍රී ලංකා දේශගුණ අරමුදලේ-2025 වර්ෂයේ ව්‍යාපෘති ප්‍රගතිය

හරිතාගාර වායු සත්‍යාපනය- 2025 වර්ෂයේ සම්පූර්ණ කර ඇති ව්‍යාපෘති

අංකය	ආයතනයේ නම
1	ඒෂියා සෙකියුරිටිස් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2	සිනමන් හෝටල් මැනේජ්මන්ට් ලිමිටඩ්
3	ඩී.එෆ්.සී.සී. බැංකුව පීඑල්සී
4	සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුරන්ස් පීඑල්සී
5	ඒෂියා සියාකා වෙයාහවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්
6	සෙලාන් බැංකුව පීඑල්සී
7	ඇලුමෙක්ස් පීඑල්සී (2024/25)
8	ඇලුමෙක්ස් පීඑල්සී (2023/24)
9	හොරණ ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
10	හයිඩ්‍රාමනී ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
11	සම්පත් බැංකුව පීඑල්සී
12	කොමර්ෂල් බැංකුව පීඑල්සී
13	ඔෂන්පික් (ප්‍රයිවට්) ලිමිටඩ්
14	එන්.ඩී.බී. කැපිටල් හෝල්ඩින්ග්ස් ලිමිටඩ්
15	හැටන් නෑෂනල් බැංකුව පීඑල්සී (2024)
16	ටීසැක් ප්‍රයිවට් ලිමිටඩ්
17	එම්.ජේ.එෆ්. බෙවරේජස් (ප්‍රයිවට්) ලිමිටඩ්
18	ඩිල්මා සිලෝන් ටී පුද්ගලික සමාගම
19	ආර්.අයි.එල්. ප්‍රොපර්ටි පීඑල්සී

අංකය	ආයතනයේ නම
20	සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුරන්ස් ලිමිටඩ්
21	මැලිබන් බිස්කට් මැනුෆැක්චරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
22	මැලිබන් මිල්ක් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
23	ඇමසන් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
24	ගස්ටන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
25	එම්.ජී. ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ්
26	කොන්කෝඩ් මැනුෆැක්චරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
27	කොන්කෝඩ් ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ්
28	කොන්කෝඩ් ෆුට්වෙයාර් (ප්‍රයිවට්) ලිමිටඩ්
29	හොරයිසන් ෆිෂරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
30	කැන්ඩි ඩිලයිට් ලිමිටඩ්
31	එම්.ඒ.එස්. කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
32	ජී.පී. ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
33	කැලණි වැලි ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
34	හේලීස් ඇඩ්වන්ටිස් ලිමිටඩ්
35	එම්ජේ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් & පෙන්ගුයින් ස්පෝට්ස්වෙයාර් (ප්‍රයිවට්) ලිමිටඩ්
36	ලිට්ල් ලයන් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
37	සෙරෙන්ඩිබ් ෆ්ලවර් මිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
38	බෝගවන්තලාව ටී එස්ටේට්ස් පීඑල්සී
39	ටෙක්ස්ට්‍රිප් (ප්‍රයිවට්) ලිමිටඩ්
40	තලවාකැලේ ටී එස්ටේට්ස් පීඑල්සී
41	ගෝල්ඩන් බෙක් (ප්‍රයිවට්) ලිමිටඩ්
42	තරුවිලාස් (ප්‍රයිවට්) ලිමිටඩ්
43	ඩීසල් & මෝටර් එන්ජිනීරින් පීඑල්සී
44	බෝඩ්පැක් (ප්‍රයිවට්) ලිමිටඩ්
45	හේලීස් ෆැබ්රික් පීඑල්සී
46	සවුත් ඒෂියා ෆැබ්‍රික් සමාගම
47	ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ලයිෆ් ලිමිටඩ්
48	ශ්‍රී ලංකා ඉන්ෂුරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ්
49	ඩිප්ඩ් ප්‍රොඩක්ට්ස් පීඑල්සී
50	ඇටයර් (ප්‍රයිවට්) ලිමිටඩ්
51	හේලීස් පීඑල්සී
52	කොරියන් ස්පා පැකේජිං (ප්‍රයිවට්) ලිමිටඩ්
53	සී.ඩී.බී. පීඑල්සී
54	නමුනුකුල ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
55	රිසයිප්ලස් ලිමිටඩ්
56	මර්කැන්ටයිල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී
57	ඇසට්ලයින් ෆයිනෑන්ස් ලිමිටඩ්

අංකය	ආයතනයේ නම
58	නොරිටාකේ ලංකා පෝර්සිලේන් (ප්‍රයිවට්) ලිමිටඩ්
59	එම්.ජේ.එෆ්. බෙවරේජස් (ප්‍රයිවට්) ලිමිටඩ්
60	කහවත්ත ප්ලාන්ටේෂන් පීඑල්සී
61	ඩිල්මා සිලෝන් ටී පුද්ගලික සමාගම
62	ක්ලයිමේට් ස්මාර්ට් ඉනිෂියටිව්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් – බැංකුව ඔෆ් සෙයිලන්
63	ඇතිමලේ ප්ලාන්ටේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
64	කේඑස්පීඒ එම්බිලිපිටිය පේපර් මිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
65	ඇල්පිටිය ප්ලාන්ටේෂන් පීඑල්සී
66	මැලිබන් ඩෙරි & ඇග්‍රි ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
67	වොන්ඩර්පැක් (ප්‍රයිවට්) ලිමිටඩ්
68	කොරියන් ස්පා ඇක්සෙසරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
69	කොරියන් ස්පා පැකේජිං (ප්‍රයිවට්) ලිමිටඩ්
70	කාගිල්ස් ෆුඩ් බෙවරේජ් ලිමිටඩ්
71	ඇග්‍රොමැට් ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ්
72	ඊ.බී. ක්‍රේසි & කො. පීඑල්සී – හෝම් කේයාර් අංශය
73	ගස්ටන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
74	එම්.ජී. ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ්
75	කොන්කෝඩ් මැනුෆැක්චරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
76	කොන්කෝඩ් ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ්
77	කොන්කෝඩ් ෆුට්වෙයාර් (ප්‍රයිවට්) ලිමිටඩ්
78	ඒෂියා සෙකියුරිටිස් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
79	ඉසබෙලා (ප්‍රයිවට්) ලිමිටඩ්
80	සරසවි එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
81	ඔකි ඩොකි (ප්‍රයිවට්) ලිමිටඩ්
82	සිනමන් හෝටල් මැනේජ්මන්ට් ලිමිටඩ්
83	කාගිල්ස් කන්ව්නියන්ට් ෆුඩ්ස් ලිමිටඩ්
84	කාගිල්ස් කොන්ෆෙක්ෂනරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
85	බයිරහ ෆාම්ස් පීඑල්සී
86	කොමර්ෂල් බැංකුව පීඑල්සී
87	එල්.ඔ.එල්.සී. ෆයිනෑන්ස් පීඑල්සී
88	නාලන්ද විද්‍යාලය
89	සෙරෙන්ඩිබ් ෆ්ලවර් මිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (2024)
90	ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී (2025)
91	හේලීස් ෆෙන්ටන්ස් ලිමිටඩ්
92	සියපත ෆයිනෑන්ස් පීඑල්සී

ජල පියසටහන් සත්‍යාපනය -2025 වර්ෂයේ සම්පූර්ණ කර ඇති ව්‍යාපෘති

අංකය	ආයතනයේ නම
1	හේලීස් ෆැබ්‍රික් සමාගම
2	සවුත් ඒෂියා ෆැබ්‍රික් සමාගම
3	එම් ජේ එෆ් බ්‍රෙවෙරේජර්ස් පුද්ගලික සමාගම
4	ඩිල්මා සිලෝන් ටී පුද්ගලික සමාගම
5	ඊ.බී. ක්‍රේසි & කෝ. පීඑල්සී – හෝම් කේයාර් අංශය

ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය- 2025 වර්ෂයේ සම්පූර්ණ කර ඇති ව්‍යාපෘති වලංගුකරණය

අංකය	ආයතනයේ නම
1	බොගවන්තලාව තේ සමාගම - සූර්ය පැනල ව්‍යාපෘතිය Phase II
2	බොගවන්තලාව තේ සමාගම - සූර්ය පැනල ව්‍යාපෘතිය Renewable

ශ්‍රී ලංකා කාබන් ණය යෝජනා ක්‍රමය- 2025 වර්ෂයේ සම්පූර්ණ කර ඇති ව්‍යාපෘති- සත්‍යාපනය

අංකය	ආයතනයේ නම
1	**මාදුරු ඔය කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය- Left Bank Main Canal at 24+140 Drop 9 Mini Hydro Power Project**
2	**මාදුරු ඔය කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය- Left Bank Canal Sluice Small Hydropower Project**
3	බොගවන්තලාව තේ සමාගම - සූර්ය පැනල ව්‍යාපෘතිය Phase II
4	බොගවන්තලාව තේ සමාගම - සූර්ය පැනල ව්‍යාපෘතිය Renewable

උපදේශන සේවාවන් - 2025 වර්ෂයේ සම්පූර්ණ කර ඇති ව්‍යාපෘති

අංකය	ආයතනයේ නම
1	ඩෙව්ඩ් පිරිස් මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
2	හැටන් නැෂනල් බැංකුව පීඑල්සී

ව්‍යාපෘති හා මූල්‍ය කළමනාකරණ ව්‍යාපෘතින් -2025 වර්ෂයේ සම්පූර්ණ කර ඇති ව්‍යාපෘති

අංකය	ආයතනයේ නම
1	පරිසර අමාත්‍යාංශය – BTR

අනෙකුත් පාරිසරික උපදේශන සේවාවන් -2025වර්ෂයේ සම්පූර්ණ කර ඇති ව්‍යාපෘති

අංකය	ආයතනයේ නම
1	ඊ.බී. ක්‍රේසි කොං. පීඑල්සී – හෝම් කේයාර් අංශය
2	එයිටිකන් ස්පෙන්ස් ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින් (ප්‍රයිවට්) ලිමිටඩ් – කාබන් නියුට්‍රල්
3	එයිටිකන් ස්පෙන්ස් ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින් (ප්‍රයිවට්) ලිමිටඩ් – කාබන් ක්‍රෙඩිට් මිලදී ගැනීම
4	ටීසැක් ප්‍රයිවට් ලිමිටඩ්
5	ඒෂියා සෙකියුරිටිස් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
6	සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුරන්ස් පීඑල්සී – නිෂ්පාදන මට්ටම
7	සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුරන්ස් පීඑල්සී – කාබන් නියුට්‍රල්
8	ඇමසන් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
9	නෙස්ලේ ලංකා ලිමිටඩ්
10	බෝගවන්තලාව ටී එස්ටේට්ස් පීඑල්සී – නිෂ්පාදන කාබන් පියසටහන
11	බෝගවන්තලාව ටී එස්ටේට්ස් පීඑල්සී – කාලගුණ ධනාත්මක
12	බෝගවන්තලාව ටී එස්ටේට්ස් පීඑල්සී – නෙට් සීරෝ බලශක්ති
13	බෝගවන්තලාව ටී එස්ටේට්ස් පීඑල්සී – කාබන් නියුට්‍රල් සහතික
14	එම්.ඒ.එස්. කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් – 50,000.00
15	හැටන් නෑෂනල් බැංකුව පීඑල්සී – 100%
16	හේලීස් ෆැබ්රික් පීඑල්සී – නිෂ්පාදන මට්ටම
17	කොමර්ෂල් බැංකුව පීඑල්සී
18	බෝඩ්පැක් (ප්‍රයිවට්) ලිමිටඩ්
19	හේලීස් ෆැබ්රික් පීඑල්සී
20	නොරිටාකේ ලංකා පොර්සලින් (ප්‍රයිවට්) ලිමිටඩ්
21	කොරියන් එස්පීඒ පැකේජින් (ප්‍රයිවට්) ලිමිටඩ්
22	එතිමාලේ ප්ලාන්ටේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
23	කේඑස්පීඒ එම්බිලිපිටිය පේපර් මිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
24	අටිරේ (ප්‍රයිවට්) ලිමිටඩ්
25	රීසයිප්ලාස් ලිමිටඩ්
26	කොරියන් එස්පීඒ ඇක්සෙසරිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
27	ඒෂියා සෙකියුරිටිස්
28	කොමර්ෂල් බැංකුව පීඑල්සී
29	කේඑස්පීඒ එම්බිලිපිටිය පේපර් මිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
30	ඒෂියා සෙකියුරිටිස් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
31	නාලන්ද විද්‍යාලය

හරිතාගාර වායු සත්‍යාපනය- සහතික ප්‍රදානය කිරීම

සහතික ප්‍රදාන උත්සවයේදී සියලුම සහතිකලාභීන්ගේ සමූහ ඡායාරූපය

2.4.3 වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

2025 වර්ෂය සඳහා නව ඉදිකිරීම් සහ පවතින ව්‍යුහයන් පුනරුත්ථාපනය කිරීම ඇතුළුව වෙරළ ආරක්ෂණ ව්‍යාපෘති 17 ක් සිදු කර

කර ඇත. ඒ අතරින් ව්‍යාපෘති 04 ක් දැනටමත් අවසන් කර ඇති අතර, 02 ක් 75% ක ප්‍රගතියක් ලබා ඇති අතර ඉතිරිය 50% කට ආසන්න ප්‍රගතියක් ලබා ඇත. ඒවා ආසන්න වශයෙන් ආරක්ෂිත දිග මීටර් 2510 ක් ආවරණය කරනු ඇත. තවද, කරුකපනේ, වීර්නගර්, බූස්ස, ඉරණවිල, කුඩාව, පේදුරුතුඩුව, වස්කඩුව, අඹකන්දවිල, කින්නියා, කිලිනොච්චි සහ ආරච්චිකට්ටුව වැනි ප්‍රදේශවල මෝසම් කාලගුණය සහ අනෙකුත් හදිසි කාලගුණික තත්ත්වයන් හේතුවෙන් සිදුවන හානි අවම කිරීම සඳහා හදිසි වෙරළ බාදන පියවර ගෙන ඇත. තවද, බාහිර ආයතන හරහා වෙන් කරන ලද අරමුදල් යටතේ මෙම දෙපාර්තමේන්තුව විසින් විශේෂ ව්‍යාපෘති තුනක් (03) ක්‍රියාත්මක කරනු ලැබේ. ඒවා පහත පරිදි වේ:

1. තල්දියවත්තේ මීටර් 220ක් දිග ධීවර නැංගුරම් දියකඩනය ප්‍රතිසංස්කරණය කිරීම - ධීවර දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන සමඟ (රු. මිලියන 44.94)
2. අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් හි විස්කි පොයින්ට් හි මීටර් 50ක භූ බෑග් ග්‍රොයින් ව්‍යුහයක් ඉදිකිරීම - SLTDA ප්‍රතිපාදන සමඟ (රු. මිලියන 19.02)
3. අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුනේ හි ග්‍රොයින් 11ක ග්‍රොයින් ක්ෂේත්‍රයක් ඉදිකිරීම - ජනාධිපති ලේකම් කාර්යාල ප්‍රතිපාදන සමඟ (රු. මිලියන 46.99)

මෙම ව්‍යාපෘති දෙසැම්බර් මස අවසානය වන විට පිළිවෙලින් 80%, 100% සහ 85% ක ප්‍රගතියක් ලබා ඇත.

වෙරළබඩ ඉංජිනේරු සැලසුම්, වෙරළබඩ පර්යේෂණ සහ අධ්‍යයන, වෙරළබඩ ජල තත්ත්ව පරීක්ෂණ වැඩසටහන් පැවැත්වීම සහ මුහුදු මට්ටම ඉහළ යාම පුරෝකථනය කිරීම සහ ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් (NDCs) මත පදනම්ව අවදානම් සිතියම් සකස් කිරීම යටතේ සැලසුම් 35ක් සම්පූර්ණ කර ඇති අතර අධ්‍යයන 06ක් අවසන් කර ඇත. (දික්ඕවිට වෙරළ ප්‍රදේශය / ලුනාව කලපුව / කප්පලඩි කලපුව / කන්දකුලිය වෙරළ තීරය / කළුතර වෙරළ තීරය/ හිරිකැටිය වෙරළ තීරය). ප්‍රීතිපුර, මොරවල, ඒත්තුකාල, තල්දියවත්ත සහ ගල්කිස්ස යන ප්‍රදේශවල නාන ස්ථාන 5ක ජල තත්ත්ව සාම්පල ලබා ගැනීම අවසන් කර ඇති අතර වසර පුරා කොළඹ සහ කළුතර දිස්ත්‍රික්කවල ස්ථාන 80 කදී මුහුදෙන් පිටතට ගලා යන ජල සාම්පල ලබා ගැනීම සිදු කර ඇත. එසේම, සාගර විශ්ව විද්‍යාලය සමඟ NDC 1.0 හි තාක්ෂණික වාර්තා ලිවීම සිදු කරමින් පවතින අතර NDC 2.0 සහ NDC 3.0 පිළිබඳ මූලික කටයුතු ආරම්භ කර ඇත.

වෙරළබඩ කලාප කළමනාකරණ ක්‍රියාකාරකම් ලෙස, 2025 වර්ෂයේදී වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් 60ක්, කඩොලාන/වෙරළබඩ ගස් සිටුවීමේ වැඩසටහන් 09ක් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක් සිදු කිරීමට නියමිතව තිබුණි. ඒ අනුව, පසුගිය වසර තුළ වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් 119ක්, කඩොලාන/ වෙරළබඩ ගස් සිටුවීමේ වැඩසටහන් 07ක් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 19ක් පවත්වන ලදී. දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන බලපත්‍ර ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා විද්‍යුත් බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දී ඇත. පසුගිය වසර තුළ එමගින් විද්‍යුත් බලපත්‍ර 2430 ක් නිකුත් කර ඇත.

වෙරළබඩ පෙළ විවිධත්වයේ වැදගත්කම, සංචාරක කර්මාන්තයේ විභවය සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් වෙරළබඩ පරිසරය පිරිහීම පාලනය කිරීමේ අවශ්‍යතාවය මත පදනම්ව හිරිකැටිය වෙරළබඩ ප්‍රදේශය විශේෂ කළමනාකරණ ප්‍රදේශයක් ලෙස තෝරාගෙන ඇත.

තලල්ල ප්‍රදේශයේ වෙරළ ප්‍රවේශ ස්ථාන 03ක් සංවර්ධනය කර මහජන භාවිතය සඳහා විවෘත කරන ලදී.

ඊට අමතරව, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වෙරළබඩ ප්‍රදේශය දිගේ ස්ථීර වෘක්ෂලතා රේඛාව සමීක්ෂණය කර මායිම් සලකුණු කර අවසන් කරන ලදී.

පිරිසිදු ශ්‍රී ලංකා වැඩසටහන (Clean Sri Lanka Programme) යටතේ වෙරළබඩ විවේක උද්‍යාන වැඩිදියුණු කිරීම සඳහා ස්ථාන 87 ක් හඳුනාගෙන ඇති අතර පසුගිය වසර තුළ ස්ථාන 43ක් නිම කිරීමට තීරණය කරන ලදී. ඒවායින් උද්‍යාන 39 ක් නිම කරන ලද අතර ස්ථාන 04 ක් ක්‍රියාත්මක වෙමින් පවතී. වසර අවසන් වන විට රු. මිලියන 71.71 ක් වැය කර ඇති අතර අබණ්ඩ කටයුතු සඳහා රු. 6.71 ක අමතර පිරිවැයක් අවශ්‍ය වේ.

2.4.4 සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

නැව් ආශ්‍රිත සමුද්‍ර දූෂණය අවම කිරීම සඳහා වැඩිදියුණු කළ පාලන යාන්ත්‍රණය

අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සැපයීම ශ්‍රී ලංකාවේ නැව් මගින් වන සමුද්‍ර දූෂණය වැළැක්වීම සඳහා වන අන්තර්ජාතික සම්මුතියට (MARPOL 73/78) පාර්ශවකරුවකු වේ. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත හා 2016 සමුද්‍ර පරිසර ආරක්ෂණ (නෞකා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ) නියෝගය යටතේ ශ්‍රී ලංකාවේ වරායන් වෙත පැමිණෙන නෞකා සඳහා අපද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ පහසුකම් සලසනු ලබයි.

2025 වසර තුළ නෞකා අපද්‍රව්‍ය කළමනාකරණය ශක්තිමත් කරමින්, සේවා සපයන ආයතන 34ක් ලියාපදිංචි කර බලපත්‍ර 2,177ක් නිකුත් කරන ලදී. තෙල් අපද්‍රව්‍ය 27,782.5 m^3, ඝන අපද්‍රව්‍ය 8,484.34 m^3, සහ මළ අපද්‍රව්‍ය 286 m^3, ආරක්ෂිතව ඉවත් කරන ලදී. මෙම සේවාවෙන් රු. මිලියන 31.57 ක ආදායමක් උපයා ඇත. 2025 බංකර් රෙගුලාසිය යටතේ යාත්‍රා මගින් නෞකා සඳහා ඉන්ධන සැපයීම යටතේ බංකර් බලපත්‍ර 14ක් නිකුත් කර ඇත. ඊට අමතරව තෙල් ගබඩා සංකීර්ණ දෙකකට සහ බව්සර් රථ මගින් තෙල් සපයන ආයතන තුනකට වාර්ෂික බලපත්‍ර ලබා දී ඇත. ඒ අනුව 2025 වර්ෂයේදී බංකර් සේවාවට බලපත්‍ර ලබාදීම මගින් මිලියන 2.21 ආදායමක් උපයන ලදී.

සමුද්‍රීය ප්ලාස්ටික් අපද්‍රව්‍ය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම IMO–FAO විසින් මූල්‍ය සහාය සහාය ලබා දෙන Reg Litter ව්‍යාපෘතියේ ක්‍රියාකාරී රටක් ලෙස ශ්‍රී ලංකාව, නැව් මූලාශ්‍රවලින් ජනනය වන සමුද්‍රීය ප්ලාස්ටික් අපද්‍රව්‍ය පිළිබඳ ජාතික කාර්යක්ෂම හා ඵලදායී ජාතික තෙල් හා රසායන ද්‍රව්‍යය විසිරීම්වලට ප්‍රතිචාර දැක්වීමේ හදිසි සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සිදු කරයි.

හදිසි තෙල් සහ අන්තරායකාරී හා හානිකර ද්‍රව්‍ය විසිරයාමකදී ක්‍රියාත්මක ජාතික සැළැස්ම යාවත්කාලීන කිරීම සහ එහි ඩිජිටල් පුවරුව සකස් කිරීම හා ඒ සම්බන්ධව අන්තර්-ආයතනික සමාලෝචනය, හදිසි තෙල් සහ අන්තරායකාරී හා හානිකර ද්‍රව්‍ය විසිරයාමකදී ක්‍රියාත්මක ජාතික සැළැස්ම සම්පූර්ණ ලෙස සංශෝධනය කිරීම සහ එයට අදාළ ඩිජිටල් පුවරුවෙහි පළමු අදියරය මේ වන විට සකස් කර ඇත (Digital Platform).

ශ්‍රී ලංකා ජල තීරයේ සිදුවිය හැකි හදිසි තෙල් හෝ රසායනික විසිරීමකදී එම තත්ත්වයන් වළක්වා ගැනීම හා අවම කිරීම වෙනුවෙන්, තෙල් හා අන්තරායකර හානිකර ද්‍රව්‍ය විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැලැස්ම ක්‍රියාත්මක කිරීම, විවිධ වූ මූලපිරීම් මාලාවකින් ප්‍රගතිය ලබා ඇත.

හදිසි තෙල්/ රසායනික විසිරීමකදී ක්‍රියාත්මක පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සඳහා සිද්ධි කළමනාකරණ කමිටු රැස්වීමක් හා අධිකාරියේ නිලධාරීන් සඳහා Incident Command System (ICS) පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.

2012 අංක 1 දරන තෙල් උතුරා යාම පිළිබඳ හදිසි සැලැස්ම නියෝගය ක්‍රියාත්මක කිරීම යටතේ තෙල් හැසිරවීම ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කරන වරාය, නැව්තොටවල්, පර්යන්ත වැනි අනෙකුත් අදාල ආයතන සඳහා බලපත්‍ර 7ක් ලබාදීම සිදු කරන ලදී.

හදිසි තෙල් විසිරීම සඳහා ප්‍රතිචාර දැක්වීම යටතේ අවස්ථා 4ක් ඵලදායී ලෙස පාලනය කරන ලද අතර, සමුද්‍ර දූෂණය වැළැක්වීමේ සහ වගවීමේ යාන්ත්‍රණයන් ශක්තිමත් කරමින් එක් නඩුවකට රුපියල් මිලියන 15 බැගින් රුපියල් මිලියන 60 ක් දඩ මුදල් වශයෙන් අය කරගෙන ඇත.

මීට අමතරව තෙල් කාන්දු හා අනෙකුත් දූෂණ සිද්ධීන් 7ක් සඳහා අවශ්‍ය නීතිමය කටයුතු සිදු වෙමින් පවතී.

තෙල් කාන්දුවීම් සිදුව ඇති අවස්ථා

MSC Elsa 3 නෞකා අනතුර

2025 මැයි 25 වන දින ලයිබීරියානු ධජය සහිත භාණ්ඩ ප්‍රවාහන නෞකාවක් වන MSC Elsa 3 ඉන්දියාවේ කේරළයේ තෝට්ටප්පිලි සිට නාවික සැතපුම් 38ක දුරකදී පෙරළී ගියේය.මෙම සිදුවීම හේතුවෙන්, 2025 ජුනි 12 වන දින ඩෙල්ෆ්ට්, නයිනතිව්, කිලිනොච්චි සහ මන්නාරම වෙරළ තීරයන් පබළු වලින් දූෂිත වී ඇති බව වාර්තා විය. ඒ අනුව, හානියට පත් වෙරළ තීරයන් පිරිසිදු කිරීමේ කටයුතු 2025 ජුනි 13 වන දින ආරම්භ කරන ලද අතර 2025 දෙසැම්බර් 31 වනවිට කි.මී. 492 ක් වෙරළ තීරයක මිනිස් බලය 88,556 ක් යොදාගනිමින්, ප්ලාස්ටික් පබළු කි.ග්‍රෑම් 4,983.52 ක් ඉවත් කරමින් පවිත්‍රතා කටයුතු සිදු කරන ලදී.

ගොඩබිම පදනම් වූ සමුද්‍ර දූෂණය අවම කිරීම සඳහා වැඩිදියුණු කළ පාලන යාන්ත්‍රණය

ජාත්‍යන්තරව පිළිගත් නිල් ධජ වෙරළ තීරයන් පිහිටුවීම- නිල්ධජ වැඩසටහන යටතේ ,පාරිසරික අධ්‍යාපනය සඳහා වන පදනම FEE මඟින් පිරිනමනු ලබන, නිල්ධජ සම්මානය හිමි වෙරළ තීරයකි. මෙම සහතිකය ලබා ගැනීම සඳහා අධ්‍යාපනය, ජලයේ තත්වය, තොරතුරු පාරිසරික කළමනාකරණ හා ආරක්ෂාව සහ සේවා යන ප්‍රධාන අංශ 4 කට අදාල වන නිර්ණායක 33 ඔස්සේ වෙරළ තීරයන්හි ජල තත්ත්ව අධීක්ෂණය සිදු කරයි. සමුද්‍ර සහ වෙරළාසන්න ජලය දූෂණයෙන් ආරක්ෂා කර ගැනීම උදෙසා අවශ්‍ය වන ප්‍රතිපත්තිමය හා නීතිමය පියවර ගැනීම සඳහා ඉවහල් වන දත්ත පද්ධතියක් පවත්වා ගැනීම අරමුණු කරගනිමින් කළුතර, කොළඹ,ගම්පහ, ත්‍රිකුණාමලය,මඩකලපුව,අම්පාර,හම්බන්තොට, මාතර හා ගාල්ල දිස්ත්‍රික්කයන්හි සමුද්‍ර නාන තොටුපලවල් 19 ක මාසික ජල තත්ත්ව පරීක්ෂාව සිදු කරන ලද අතර පරීක්ෂා කරන ලද මුළු භෞතික රසායනික හා ජීව විද්‍යාත්මක පරාමිතීන් සංඛ්‍යාව 08 කි.

ජාතික ඒකාබද්ධ වෙරළබඩ සහ සාගර ජල තත්ත්ව (ජලය, අවසාදිත, ජෛව) අධීක්ෂණ වැඩසටහන

ජාතික මට්ටමේ වෙරළ සහ සමුද්‍රීය ජල තත්ත්වය නිරීක්ෂණය කිරීම සහ තීරණ ගැනීමට දත්ත භාවිතා කිරීම අරමුණු කර ගනිමින් ජල තත්ත්ව දත්ත එකතු කිරීම හා විශ්ලේෂණය කිරීම, පාර්ශවකරුවන්ගේ වට-මණ්ඩල සාකච්ඡා පැවැත්වීම, ඒකාබද්ධ නිරීක්ෂණ රාමුව සංවර්ධනය කිරීම සහ සමාලෝචන රැස්වීම් පැවැත්වීම යන ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කරන ලදී. එසේම, කැළණිය විශ්වවිද්‍යාලය සමඟ එක්ව ක්ෂේත්‍ර විමර්ශන සිදු කරන ලදී.

ධීවර වරායන් ආශ්‍රිත දූෂණය අවම කිරීම- ධීවර වරාය ආශ්‍රිත අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් දීවර වරායන් 20ක අධීක්ෂණ කටයුතු, ධීවර වරායන් සඳහා අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

සමීක්ෂණ සහ දත්ත එකතු කිරීම

වෙරළ තීර ආශ්‍රිතව සන අපද්‍රව්‍යය ව්‍යාප්තිය, තක්සේරු කිරීමේ අරමුණින් දිස්ත්‍රික් 13 ක සමීක්ෂණය සිදු කර, අපද්‍රව්‍ය එකතු වීම සහ ව්‍යාප්තිය පිළිබඳ මූලික දත්ත ලබා ගෙන ඇත. මීට අමතරව කිලිනොච්චියේ ජලජීවී වගා සමීක්ෂණයක් සහ මන්නාරමේ වෙරළාශ්‍රිත අපද්‍රව්‍ය සන්නාම විගණන සමීක්ෂණයක් (Brand Audit Survey) පැවැත්විණි.

ඩම්පිං බලපත්‍ර ලබාදීම සහ හෝටල් අධීක්ෂණ කටයුතු-මුහුදට පිරිපහදු කල අපද්‍රව්‍ය බැහැරකිරීමේ බලපත්‍ර නිකුත් කිරීම 2013 අංක 01 දරන සමුද්‍රීය පරිසර ආරක්ෂණ (මුහුදට ඉවත දැමීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීමේ) නියෝගය යටතේ සිදු කරනු ලබයි. පිරිපහදු නොකළ අපජලය මුහුදට බැහැර කිරීම නියාමනය කිරීම සඳහා 2025 වර්ෂය තුලදී මුහුදට පිරිපහදු කල අපද්‍රව්‍ය පමණක් බැහැර කිරීමේ බලපත්‍ර (ඩම්පින් බලපත්‍ර) 302 ක් නිකුත් කර ඇත. 2025 වර්ෂය තුල දී ඩම්පින්

බලපත්‍ර නිකුත් කිරීමෙන් ලැබූ ආදායම රුපියල් 7,914,000.00 කි. මීට සමගාමීව දිස්ත්‍රික් මට්ටමේ අධීක්ෂණ සිදු කරන ලදී.

Clean Sri Lanka වැඩසටහන යටතේ වෙරළ සංරක්ෂණය සඳහා ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ස්වේච්ඡා සාමාජිකයින් 35,260ක් සමඟ වෙරළබඩ ස්ථාන 463ක් පුරා දීප ව්‍යාප්ත පිරිසිදු කිරීමේ වැඩසටහනක් සාර්ථකව පවත්වන ලදී.

පිවිතුරු සයුරක් පවත්වා ගැනීම සඳහා වෙරළ රැකබලාගන්නන්, හෝටල් වෙරළ රැකබලාගන්නන්ගේ යෙදවීමේ වැඩසටහන

වෙරළ තීරයන්හි තිරසාර කළමනාකරණය සඳහා වෙරළ රැකබලාගන්නන්ගේ වැඩසටහන පෞද්ගලික අංශයන්හි අනුග්‍රහය යටතේ සමුද්‍රධි සංවර්ධන දෙපාර්තමේන්තුව සමග එක්ව ක්‍රියාත්මක වේ.

ඒ අනුව දැනට කොළඹ, ගම්පහ, කළුතර,යාපනය හා ගාල්ල යන දිස්ත්‍රික්කයන් හි වෙරළ රැකබලාගන්නන් 39 දෙනෙකු මගින් කි.මී. 25.2 ක පමණ වෙරළ තීරයක් දිනපතා පවිත්‍ර කෙරේ. එමෙන්ම වෙරළබඩ පිහිටි හෝටල් වල සහභාගීත්වයෙන් දෙනිකව වෙරළ පවිත්‍ර කිරීම සඳහා ක්‍රමවේදයක් වන "හෝටල් වෙරළ රැකබලාගන්නන්ගේ වැඩසටහන" ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ඇත. මෙම වැඩසටහන යටතේ වෙරළබඩ දිස්ත්‍රික්ක 8ක හෝටල් 148ක් සම්බන්ධ වී, දෙනිකව සමස්ත කි.මී. 20.8ක වෙරළ තීරයක් පවිත්‍ර කරයි.

Clean Sri Lanka ජාතික වැඩසටහනට සමගාමීව සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් 2025 වර්ෂය තුළ දී පහත ව්‍යාපෘතීන් ආරම්භ කරනු ලැබීය.

- **තලල්ල නිල් ධජ වෙරළ ව්‍යාපෘතිය** - , 2026 වර්ෂය තුළ ජාත්‍යන්තර නිල්ධජ පරිසර ලාංඡනය ලබා ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක කර ඇත.
- **පවිත්‍ර වෙරළ නගර ව්‍යාපෘතිය වැඩසටහන, ත්‍රිකුණාමලය** - ශ්‍රී ලංකාව පුරා පිරිසිදු, ආරක්ෂිත සහ පාරිසරිකව සවිබලගන්වූ වෙරළ කලාප ස්ථාපිත කිරීම සඳහා ක්‍රියාත්මක ජාතික සංවර්ධන වැඩසටහනකි. පාරිසරිකව සුදුසු යටිතල පහසුකම් සංවර්ධනය දිගුකාලීන සංරක්ෂණ අරමුණු සමඟ ඒකාබද්ධ කරමින් වැඩසටහන් 2025 වර්ෂය තුලදී ක්‍රියාත්මක කෙරිණි.
- **අපද්‍රව්‍ය කළමණාකරනය සඳහා ජංගම යෙදුමක් (Mobile App) භාවිතා කිරීමේ වැඩසටහන-**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මඟින් වඩාත් පහසුවෙන් සුහුරු තාක්ෂණය ඔස්සේ භාවිතයට ගත හැකි නව Ocean Watch නව ජංගම යෙදුමක් හඳුන්වා දීම සිදු කරන ලදී. Ocean Watch ජංගම යෙදවුම වෙරළ තීර හා ධීවර වරාය ආශ්‍රිත පවිත්‍ර කිරීමේ වැඩසටහන් සම්බන්ධයෙන් සංවිධායක කණ්ඩායම් හා වෙරළ අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධ සියලු රාජ්‍ය ආයතන අතර කාර්යක්ෂම සම්බන්ධීකරණය සඳහා නිර්මාණය කර ඇත.

ගොඩබිමෙන් ඇළ මාර්ග හරහා සමුද්‍රයට පැමිණෙන අපද්‍රව්‍ය පාලනය කිරීම සඳහා waste traps පිහිටුවිය හැකි ස්ථාන පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඇති අතර, එයට පෞද්ගලික අංශයේ දායකත්වය ද අපේක්ෂා කරයි. අමතරව, සමුද්‍ර පරිසරයට අදාල පැමිණිලි යොමු කිරීම සඳහාද මෙම යෙදවුම භාවිතා කළ හැකි වීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් දත්ත එක්රැස් කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා අධීක්ෂණ, දිස්ත්‍රික් කමිටු රැස්වීම් හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

බලාත්මක කිරීමේ ඒකක පිහිටුවීමේ වැඩසටහන

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ මුලිකත්වයෙන් වෙරළබඩ දිස්ත්‍රික්ක 14 හිම පවතින වෙරළබඩ පළාත් පාලන ආයතන හා අනෙකුත් සෘජු හා වක්‍රව සම්බන්ධ ආයතන එකතුවෙන් බලාත්මක කිරීමේ ඒකක පිහිටුවීමට කටයුතු සිදු කල අතර මේ වන විට ලංකාව වටා බලාක්මක කිරීමේ ඒකක 84 ම පිහිටුවා එමගින් සමුද්‍ර දූෂණය වැලැක්වීමට කටයුතු සිදු කරමින් සිටී. 2025 වර්ෂය තුළ බලාත්මක කිරීමේ ඒකක මඟින් අදාල දිස්ත්‍රික්කයන්හි කමිටු රැස්වීම් ක්ෂේත්‍ර නිරීක්ෂණ සහ වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් පැවැත්වූ අතර, වෙරළ රැකබලා ගැනීම සඳහා වෙරළ රැකබලාගන්නන් 02 දෙනෙකුද යොදවා ඇත.

වෙරළබඩ ප්‍රදේශවල දිවිවා සුළි කුණාටුවෙන් අනතුරුව ක්‍රියාත්මක කරන ලද වෙරළ පිරිසිදු කිරීමේ මූලපිරීම් 300 කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් සංවිධානය කළේය.

වෙරළබඩ සහ සමුද්‍ර පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය කර සංරක්ෂණය කිරීම

කඩොලාන ප්‍රතිස්ථාපනය- කළුතර වෙරළ තීරය පිරිසිදු කිරීම සහ කඩොල් ආශ්‍රිත ශාක රෝපණය කිරීම සහ කඩොලාන ප්‍රරෝහිත රැස්කිරීමේ වැඩසටහනක් පුත්තලම දිස්ත්‍රික්කයේ කඩොල් ආශ්‍රිත ශාක රෝපණය කිරීම සිදු කරන ලදී. ඒ අනුව රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල්කාරීත්වය මගින්, ත්‍රිකුණාමලයේ හෙක්ටයාර 1ක්, කලුතර හෙක්ටයාර 0.6ක් සහ පුත්තලම වෙරළාශ්‍රිත ප්‍රදේශවල හෙක්ටයාර 0.2ක් කඩොලාන ආශ්‍රිත ශාක රෝපණය කිරීම සිදුකරන ලදී.

කොරල් රෝපණය කිරීමේ වැඩසටහන- ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය විසින් උණවටුන හා සීනිගම මුහුදේ කොරල් රෝපණය කිරීමේ වැඩසටහන් 2ක් සාර්ථකව සිදු කරන ලදී. උණවටුන මුහුදු තීරයේ කොරල් බෝල්ඩර් 10ක් ගිල්වා, එම බෝල්ඩර් මත Acropora විශේෂයට අයත් කොරල් රෝපණය කිරීම සිදු කරන ලදී (400 m2). තවද සීනිගම දේවාලය අසල මුහුදු තීරයේ 2025 වසරේ දෙසැම්බර් මස කොරල් බෝල්ඩර් 5ක් මුහුදේ ගිල්වා Acropora විශේෂයට අයත් කොරල් රෝපණය කිරීම සිදු කරන ලදී (200 m^2).

කොරල් රෝපණය කිරීම සිදු කිරීම

රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර සම්මුතීන් සහ පනත සංශෝධනය කිරීම

MT New Diamond හා MV X Press Pearl නෞකා ව්‍යසනයෙන් පසු 2008 අංක 35 දරණ සමුද්‍ර දූෂණ වැළක්වීමේ පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව පනතේ සංශෝධන විය යුතු තැන් හඳුනාගෙන ඒ අයුරින් සංශෝධනය කරන ලද පනත පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරි කටයුතු සඳහා යැවීමට කටයුතු කර ඇත.

MV X Press Pearl නෞකා ව්‍යසනයෙන් සිදු වූ හානිය සම්බන්ධයෙන් පනතේ අපරාධ වගකීම යටතේ පවරන ලද නඩුව මහාධිකරණයේ විභාග වෙමින් පවතී. MV X Press Pearl නෞකා ව්‍යසනය සම්බන්ධයෙන් තුන්වන පාර්ශවයන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කල මූලික අයිතිවාසිකම් නඩුවේ තීන්දුව 2025/07/24 වන දින ලබා දුන් අතර එහි දී පිහිටුවන MV X Press Pearl වන්දි කොමිසම හා MV X Press Pearl සමුද්‍ර හා වෙරළ පරිසර ප්‍රතිෂ්ඨාපන කිරීමේ හා ආරක්ෂා කිරීමේ කමිටුව ප්‍රකාරව වැඩ කටයුතු කරමින් පවතී. තව ද MT New Diamond නෞකාවෙන් සමුද්‍ර පරිසරයට සිදු වන දූෂණයට අදාළ වන්දි අය කර ගැනීමේ නඩුව කොළඹ වාණිජ මහාධිකරණට පවරා ඇති අතර නීතිපති දෙපාර්තමේන්තුව මගින් ඊට අදාළ කටයුතු මෙහෙවමින් පවතී.

දැනුවත් කිරීමේ වැඩසටහන්- පාසල් සමුද්‍ර කණ්ඩායක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, මඩකලපුවේ ප්‍රශ්න විචාරාත්මක තරඟයක් සහ ජගත් සාගර දිනය වෙනුවෙන් කෙටි චිත්‍රපට තරඟයක් ඇතුළු මාධ්‍ය ප්‍රචාරණයන් පවත්වන ලදී.

ජාතික පරිසර සතිය වැඩසටහන්- පරිසර සතිය පාදක කරගනිමින් මඩකලපුව, කිලිනොච්චිය, කළුතර, අම්පාර සහ මන්නාරම දිස්ත්‍රික්කයන්හි පෝස්ටර් චිත්‍ර තරඟ, වැලි නිර්මාණ තරඟ, දැනුවත් කිරීමේ පාගමන්, කඩොලාන/ වෙර්ළාශ්‍රිත රුක් රෝපණ සිටුවීම සහ පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මාතර දිස්ත්‍රික්කයේ වෙරළ තීරය පිරිසිදු කිරීම, මහජනතාව දැනුවත් කිරීම සහ කැස්බෑවන් මුදා හැරීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදී.

ජගත් සාගර දින වැඩසටහන්

ජගත් සාගර දිනය (2025 ජූනි 8) පාදක කර ගනිමින් කොළඹ පෝට් සිටි හි පැවති ජාතික සාගර දින උත්සවයට රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන සහ මහජනතාව ඇතුළු 2000ක් පමණ සහභාගි වූහ. වාර්තාව (State of Marine Environment Report) හා සමුද්‍ර ආරක්ෂිත කලාප පිලිබඳ ග්‍රන්ථය එළිදැක්වීම සිදු කරන ලදී.

ජාත්‍යන්තර වෙරළ පිරිසිදු කිරීමේ (ICC) දිනය හා සමුද්‍ර සම්පත් සුරැකීමේ සතිය- ජාතික වැඩසටහට සමගාමීව දීපව්‍යාප්ත වෙරළ පිරිසිදු කිරීම් රැසක් ක්‍රියාත්මක කෙරිණි.

සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරියේ ධාරිතාව ශක්තිමත් කිරීම- අධිකාරියේ ආයතනික සහ මෙහෙයුම් ධාරිතාව ශක්තිමත් කිරීමට පියවර ගන්නා ලදී. දැනට පවතින පුරප්පාඩුවලට අදාල, තනතුරු 34ක් බඳවා ගැනීම සඳහා රාජ්‍ය බඳවා ගැනීම් සමාලෝචන කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. කාර්ය මණ්ඩල කුසලතා සහ දැනුම වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික වැඩමුළු 16 ක් සහ මාර්ගගත වැඩමුළුවක් පවත්වන ලදී.

2.4.5. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාව තුළ ශාක විවිධත්වය විතැන් සංරක්ෂණය කිරීම සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විශාල දායකත්වයක් සපයන අතර උද්‍යාන අලංකරණය හා මල් වගාව ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ හා තාක්ෂණික වැඩසටහන් එමඟින් ක්‍රියාත්මක කරයි. ව්‍යක්තිකයන් සහ උද්‍යෝගයක් දක්වන තැනැත්තන්ගේ සිට පාසල් සිසුන් දක්වා සියලු ආකාරයේ කණ්ඩායම් සඳහා නිර්මාණය කර ඇති ක්‍රියාකාරකම් හරහා දැනුම ප්‍රවර්ධනය කරමින්, උද්භිද විද්‍යාව හා ස්වභාවධර්මය පිළිබඳ තොරතුරු මූලාශ්‍රයක් වශයෙන් ද මෙම දෙපාර්තමේන්තුව ක්‍රියා කරයි

2025 දෙසැම්බර් මස 31 වනවිට අවසානයේ උද්‍යානය නැරඹීමට පැමිණි මුළු නරඹන්නන් සංඛ්‍යාව මිලියන 2 ඉක්ම විය. 2025 දෙසැම්බර් මස 31 වන විට උද්භිද උද්‍යාන නැරඹීමට පැමිණි විදේශිකයන් සංඛ්‍යාව (361 ,648), පසුගිය වසරේ එකී කාල සීමාවට (345,594) සාපේක්ෂව 5%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

ආදායම

දිවිවා සුලිකුණාටුවෙන් උද්භිත උද්‍යාන සඳහා වූ බලපෑම හමුවේ වුවද 2025 වසරේ ඇතුළත් වීමේ ගාස්තු, පැළ අළෙවිය සහ කුලී ආදියෙන් 2025 වර්ෂයේදී උපයාගෙන ඇති මුළු ආදායම රු. මිලියන 1,394 කි. එය පසුගිය වසරේ (රු. මිලියන 1031.65) සාපේක්ෂව 21%ක වර්ධනයකි.

උද්‍යාන සංවර්ධන කටයුතු

මූන් අනුස්මරණ කෞතුකාගාරය ගරු අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මහත්මියගේ ප්‍රධානත්වයෙන් 2025 සැප්තැම්බර් 28 වන දින මහජනතාව සඳහා විවෘත කරන ලදී.

උද්‍යානයේ පෞරාණික උරුමය විස්තර කරන නිරූපණ හා නිදර්ශකවලට අමතරව, බහුමාධ්‍ය ප්‍රදර්ශක ද මෙම කෞතුකාගාරයට ඇතුළත් කර ඇත.

මූන් අනුස්මරණ කෞතුකාගාරය මහජනතාව සඳහා විවෘත කිරීම

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ප්‍රධාන දොරටුව අසල, ලංකා බැංකුවේ නව ශාඛාවක් 2025 සැප්තැම්බර් 28 වන දින නිල වශයෙන් විවෘත කරන ලදී. උද්‍යානයට පැමිණෙන නරඹන්නන්ට, කාර්ය මණ්ඩලයට සහ අවට ප්‍රජාවට නවීන බැංකු සේවාවන් ලබා ගැනීම සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමට මෙයින් හැකියාව ලැබේ.

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ අසල, ලංකා බැංකුවේ නව ශාඛාවක් විවෘත කිරීම

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයට පැමිණෙන අමුත්තන්ට විවේකීව ගත කළ හැකි සුවපහසු, සාමකාමී ස්ථානයක් වන ආපනශාලා ගොඩනැගිල්ල, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිසංස්කරණය කර නවීකරණය කරමින් පවතියි. එහි කටයුතු වලින් 90% ක් පමණ මෙම වසරේදීම මහජනතාවගේ භාවිතය සඳහා ලබා දෙනු ඇත.

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ආපනශාලා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය

දර්ශ කාලයක් අබලන්ව පැවති රාජකීය උද්භිද උද්‍යානයේ මහවැලි ගඟ හරහා ස්ථාපිත මීටර 150 ක් දිග එල්ලෙන පාලම (hanging bridge) රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කරන ලද අතර දිට්වා සුළිකුණාටුව හේතුවෙන් එම පාලමට අධික අලාභ හානි සිදුවිය.

අමාත්‍යාංශයේ සහාය ඇතිව වෙබ් අඩවිය සහ විද්‍යුත් ටිකට්පත් පද්ධතිය වැඩිදියුණු කරමින් පවතියි.

හක්ගල උද්භිද උද්‍යානයට පැමිණෙන නරඹන්නන් සඳහා පොදු පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් එහි වැසිකිළි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදු කරමින් පවතියි.

උද්‍යානයට පැමිණෙන අමුත්තන් සඳහා පොදු පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් ගම්පහ උද්භිද උද්‍යානයේ ගම්පහ - ජා-ඇල මාර්ගයේ පිහිටි නව ටිකට් කවුන්ටරයක් සහ ආරක්ෂක කුටියක් ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ස්ථාපිත කරමින් පවතියි.

මිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානයේ කාර්යාලය හා පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා මෙන්ම ආරෝපිත බැටරි කාර් සඳහා භාවිත කිරීමට සූර්ය විදුලි පද්ධතියක් ස්ථාපිත කරමින් පවතින අතර එමගින් උද්‍යානයේ මෙහෙයුම්වලට පුනර්ජනනීය බලශක්තිය සැපයීම, ආලෝකය ලබා දීම සහ නරඹන්නන්ගේ පහසුකම් වැඩිදියුණු කිරීම අරමුණු කර ඇත.

වගාකරුවන්ගේ මල්වගා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, මල් වගාව සහ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම, කැපූ මල් ආනයනය අඩු කිරීම සහ ජාතික මල්වගා කර්මාන්තය සවිමත් කිරීමේ අරමුණෙන්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ජාතික මල්වගා සංවර්ධන (සුවහස් මල්) වැඩසටහන යටතේ, බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල ලියාපදිංචි මල්වගා ව්‍යවසායකයින් 47 දෙනෙකු අතර පාරජම්බුල කිරණ ආලේපිත පොලිතීන් මීටර් 1966ක් සහ කෘමි ප්‍රතිරෝධී දැල් මීටර් 390ක් බෙදා හරින ලදී.

ඊට අමතරව, "සුවහස් මල්" ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන යටතේ, වගා සංවිධානවලට අනුබද්ධ වගාකරුවන්ගේ ආදායම තවදුරටත් වැඩිදියුණු සඳහා තෝරාගත් දිස්ත්‍රික්කවල විශාල ප්‍රදර්ශන 29 ක් සහ පැළ අළෙවි කිරීම සඳහා කුඩා ප්‍රදර්ශන 299 ක් සංවිධානය කරන ලදී.

2025 වසරේදී ද මල්වගා සහ මල්වගා පර්යේෂණ කටයුතු අඛණ්ඩව සිදු කරනු ඇති අතර ශාක සංරක්ෂණය, ශාක වර්ගීකරණය, ක්ෂුද්‍ර ප්‍රචාරණය, පළිබෝධ සහ රෝග කළමනාකරණය, පසු අස්වනු හැසිරවීම සහ අගය එකතු කිරීම, සස්‍ය විද්‍යාව යන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් පර්යේෂණ වැඩසටහන් 54 ක් පවත්වනු ලබයි.

උද්‍යාන පරිශ්‍රය තුළ නරඹන්නන්ගේ සංචලනය, සුවපහසුව සහ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා බැටරි බලයෙන් ක්‍රියාත්මක නව කාර් රථ 11ක් මිලදී ගැනීමට කටයුතු කරමින් පවතින අතර ටෙන්ඩර් ප්‍රදානයද සිදු කරන ලදී.

මූල්‍ය ප්‍රගතිය 2025.12.31

මූලාශ්‍රය	ප්‍රතිපාදන (රු.මිලි.)	වියදම (රු.මිලි.)	%
මුළු ප්‍රාග්ධනය	278.00	159.72	57
පුනරාවර්තන	834.00	785.32	94
මුළු එකතුව	**1112.00**	**945.04**	**85**

2.4.6 ජල සම්පත් මණ්ඩලය

ජල සම්පත් මණ්ඩලය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යභාරය වනුයේ භූ ගත ජලය කලමණාකරණය, නියාමනය හා සංරක්ෂණය වේ. ඒ අනුව ජල සම්පත් මණ්ඩලය මගින් වර්තමානයේ ශ්‍රී ලංකාවේ භූගත ජලයේ තිරසාර පැවැත්ම උදෙසා විවිධ පර්යේෂණ අධ්‍යයන කටයුතු, සමීක්ෂණ කටයුතු හා නියාමන කටයුතු සිදු කරනු ලබයි.

2025 වර්ෂය තුල ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා අදාල නියාමන ක්‍රමවේදයන් හා නීති රෙගුලාසි ඇතුලත් කරමින් මේවන විට කෙටුම්පත් සකස් කර ඇත.

සියලු ගංහා ද්‍රෝණීන්හි ආරම්භ ජල පෝෂක ප්‍රදේශවන මධ්‍යම කඳුකරය ආශ්‍රිත ජල උල්පත් ප්‍රමුඛතාවය පදනම්ව තෝරාගෙන එම ජල ප්‍රභවයන්හි ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා ජල සාම්පල 75 ක රසායනාගාර විශ්ලේෂණ කටයුතු මේ වනවිට සිදු කරගෙන යනු ලබන අතර සහ ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය සඳහා නිර්දේශයන් සහ සැළසුම් ක්‍රමෝපායන් සැකසීම ජල පෝෂක ප්‍රදේශ 05 ක මේ වනවිට සිදු කර ඇත.

රටෙහි මතුපිට ජල ප්‍රභවයන් ගංහා ඇල දොළ වැව් පද්ධතීන්හි රසායනික තත්වය නිර්ණය කොට එම තොරතුරු මධ්‍යම දත්ත ගබඩාවත් පවත්වා ගෙන යාම තුලින් සහ කාලානුරූපී සිතියම්ගත කිරීම මඟින් ජලයෙහි රසායනික වෙනස්කම් නිර්ණය සහ එමඟින් ජල ප්‍රභව ආරක්ෂා කිරීමට අවශ්‍ය ජල කළමනාකාරීත්වයක් සහ එයට අනුරූපි සැලසුම් සකස් කිරීම යටතේ වයඹ පළාතෙහි ජල ප්‍රභවයන් 256කින් 51ක විශ්ලේෂණ කටයුතු මේ වනවිට අවසන් කර ඇත.

ව්‍යාපෘතිය	කොන්ත්‍රාත් මුදල (TEC) (රු. මී)	ඇස්තමේන්තු ගත මුදල (රු. මී)	4වන කාර්තුව			
			මූල්‍ය (රු. මී)		භෞතික (%)	
			ඉලක්කය	31.12.2025 දිනට ප්‍රගතිය	ඉලක්කය	31.12.2025 දිනට ප්‍රගතිය
දීර්ඝ කාලීන භූගත ජල නියාමන ව්‍යාපෘතිය (LTGM): කොළඹ-මීගමුව, අම්පාර , මන්නාරම, වවුනියාව, කිලිනොච්චි, යාපනය, අනුරාධපුර, පොළොන්නරුව, මාතලේ, පුත්තලම.	5.00	5.00	5.00	5.586	100%	82%
භූගත ජල සම්පත් කෙරෙහි දේශගුණ විපර්යාස වල ඍජු හා වක්‍ර බලපෑම් පිළිබඳව අධ්‍යයනය (SICC)	1.00	1.00	1.00	0.969	100%	76%
භූගත ජල සම්බන්ධ පාරිසරික ගැටළු සඳහා සිදු කරන ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ (INSP)	1.00	1.00	1.00	1.151	100%	84%
මානව සම්පත් සහ ආයතනික සංවර්ධන කටයුතු	4.50	4.50	4.50	4.554	100%	102%
හදිසි ආපදා අවස්ථා වල අවශ්‍යතා සඳහා භූගත ජලය සංවර්ධනය (නියඟ, ගංවතුර, භූගත ජල සම්පත් දූෂණය වීම) (E-USE)	1.50	1.50	1.50	2.201	100%	102%
ශ්‍රී ලංකාවේ පවතින ස්වභාවික හා උණුදිය උල්පත් තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය (ANSP)	1.50	1.50	1.50	0.883	100%	71%
රටතුල මතුපිට ජල සම්පත් වල ජල තත්ත්ව තක්සේරු අදියර - I ව්‍යාපෘතිය (SWQA)	4.00	4.00	4.00	3.012	100%	75%
භූගත ජල කළමනාකරණ හා දේශගුණ විපර්යාස වල බලපෑම පිළිබඳ පවත්වනු ලබන සඳහා වන දැනුවත් වැඩසටහන (DFAT)	2.19	2.19	2.19	2.191	100%	98%
මුළු එකතුව	**20.69**	**20.69**	**20.69**	**20.559**		

2.4.7 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

විශේෂ ජයග්‍රහණ

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

- දිවිවා සුළිකුනාටුවෙන් විපතට පත් සත්ත්වයන් මුදා ගැනීම හා රක්ෂිත ප්‍රදේශ වලට සිදුවූ හානි කඩිනමින් පිළිසකර කර ගෙන කටයුතු කිරීමට හැකි වීම.
- වනජීවීන්ගේ වාසස්ථාන සුපෝෂණ කටයුතු වැඩිකිරීම හා සංරක්ෂණයට පියවර ගැනීම
- අධ්‍යාපන හා ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් මඟින් මහජනතාව තුළ සංරක්ෂණය සඳහා දක්වන දායකත්වය ඉහළ නැංවීමට හැකිවීම.
- CITES බලපත්‍ර නිකුත් කිරීමේ ඊ-සේවාව හා CITES, RAMSAR වැනි අන්තර්ජාතික සම්මුතින් ක්‍රියාත්මත කිරීම තුළින් ජාත්‍යන්තරය සමග කටයුතු කිරීම පහසුවීම.

අභියෝග

- තිරසර සංවර්ධන අභිමතාර්ථ සපුරාගැනීමට යාමේදී අවශ්‍ය මානව සම්පත් හා භෞතික සම්පත්වල හිඟකම.
- රජය හා පෞද්ගලික අංශ මගින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ස්වභාවික හා පෞව සම්පත්වල ආරක්ෂාවට හා පැවැත්මට තර්ජන ඇතිවීම. විදුලි වැට ඉදිකිරීමේදී ඉඩම් සම්බන්ධව ගැටළු ඇතිවීම හා මහජන විරෝධතා ඇතිවීම.
- ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමේදී ඊට සම්බන්ධවන (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව /දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වැනි) ආයතන අතර පවතින අන්තර් සම්බන්ධතාවයේදී මුහුණදීමට සිදුවන ගැටළු
- කාලගුණික හා දේශගුණික විපර්යාසයන් ජයගැනීම තුළින් අපේක්ෂිත මට්ටමට ළඟාවීමට ඇති නොහැකි වීම .

2.4.8 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

පාරිසරික සංචාරක ක්‍රියාකාරකම් වලින් 2024 වර්ෂයට වඩා වැඩි ආදායමක් 2025 වර්ෂයේ ඉපයීමට හැකිවීම. ඒ අනුව, 2024 වර්ෂයේ උපයා ඇති ආදායම රු. මි. 452 ක් වන අතර එය 2025 වර්ෂය වන විට රු.මි.557ක් දක්වා වැඩි වී ඇත. එය 2024 වර්ෂයට වඩා 23% ක වැඩි වීමකි. (2025 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවට බලපෑ දිවිවා සුළි කුණාටුව හේතුවෙන් නකල්ස් සංරක්ෂිත වනාන්තරයට බලපෑම් ඇති වූ හෙයින් එම සංචාරක ගමනාන්ත සංචාරකයන් සඳහා ඇතුළුවීම අඩු වීමට හේතු වී ඇත)

පාරිසරික සංචාරක ගමනාන්ත පවත්වාගෙන යාම සඳහා ප්‍රජා මූල සංවිධාන සමඟ සම්බන්ධ වී අදාළ සේවාවන් ලබා ගැනීම තුලින් වනාන්තර ආශ්‍රිතව ජීවත් වන ජනතාවට ජීවන තත්ත්වය ඉහල නැංවීමට දායකත්වය සැපයීම.

සිදු වූ ප්‍රයෝගික තත්වයන් මත හෙලීම් ප්‍රමාදය මත පූර්ණ හෙලීම් ඉලක්කය අඩු වූ බැවින් එම ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය යොදා ගනිමින් වන වගාවල අස්වැන්න ඉහල නැංවීමේ අරමුණින් අමතර ක්‍රියාකාරකම් වශයෙන් මාතර, හම්බන්තොට, වවුනියා, කිලිනොච්චිය, බදුල්ල, කුරුණෑගල යන දිස්ත්‍රික්ක තුල හෙක්ටයාර් 292.04 ක වල් නෙලීම, පොහොර යෙදීම, ගිනි වැලැක්වීම හා පාළු පැල සිටුවීම සිදු කරන ලදී.

කන්නෙලිය රක්ෂිත වනාන්තරයට අනුයුක්තව සේවය කරන මාර්ගෝපදේශකයන් සඳහා මාර්ගෝපදේශක පුහුණුව ලබා දීම සංචාරක සංවර්ධන මණ්ඩලයේ අනුග්‍රාහකත්වයෙන් කුඩව සිංහරාජ සංරක්ෂණ මධ්‍යස්ථානයට අනුයුක්ත මාර්ගෝපදේශකයන් සඳහා මාර්ගෝපදේශක පුහුණුව ලබා දීම.

අභියෝග

- වනාන්තර මායිම් නිරූපණයේදී හා ගැසට් කිරීමේදී විවිධ ආයතනයන්ගෙන් හා ප්‍රජාවන්ගෙන් නිසි සහයෝගයක් නොලැබීම හා ජාතික වශයෙන් වැදගත් වන කටයුත්තක් සේ නොසලකමින් එම කාර්ය

කෙරෙහි ඇතිවන ප්‍රතිරෝධතා

- වනාන්තර මායිම් මැනුම් කිරීම හා මායිම් කණු මගින් සලකුණු කිරීම දුෂ්කර කටයුත්තක් වන අතර එම කාර්ය සාර්ථකව ඉටු කිරීම සඳහා දැනට සේවයේ යෙදී සිටින සේවක මණ්ඩලයේ ඌණතාවය.
- වනාන්තර මායිම් නිරූපණය හා ගැසට් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන නිසි කලට හා නිසි ප්‍රමාණයෙන් නොලැබීම.

ඉදිරි ඉලක්ක

- වන ආරක්ෂණ කලාප කළමනාකරණය කිරීම.
- ස්වභාවික වනාන්තර 35ක් සඳහා නව වන කළමණාකරණ සැලසුම් සකස් කිරීම හා කළමණාකරණ සැලසුම් යාවත්කාලීන කිරීම
- වනාන්තර සංකීර්ණ සඳහා සාර්ව වන කළමනාකරණ සැලසුම් 01 ක් සකස් කිරීම
- වඳ වී යාමේ තර්ජනයට මුහුණ පා ඇති ශාක 05 ක් සංරක්ෂණය කිරීම.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඉඩම් අත්පත් කර ගැනීම.
- අත්පත්කර ගැනිමේ ක්‍රියාවලිය සම්බන්ධ වන්නා වූ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් ආයතන වල නිලධාරීන් සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීම වෙනුවෙන් ගෙවීම් සිදුකිරීම
- ඉහළ සංචාරක විභාවතාවයෙන් යුතු පාරිසරික සංචාරක කර්මාන්තයක් ඇති කිරීම.
- නව සංචාරක ක්‍රියාකාරකම් හඳුන්වා දීම.
- පවතින සංචාරක ගමනාන්ත වල පවතින අවිධිමත් සංචාරක කර්මාන්ත වැලැක්වීම සහ පාරිසරික සංචාරක කර්මාන්තය විධිමත් කිරීම.

2.4.9 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

- පසුගිය වසර 10 තුළ සත්වෝද්‍යානය වාර්තා කළ වැඩිම ආදායම 2025 වර්ෂයේදී වාර්තා වී ඇත. එය 2024 වර්ෂයේ වාර්තා කළ ආදායමට සාපේක්ෂව 6.5 % ක වැඩිවීමක් පෙන්නුම් කරයි.
- සත්ත්ව හුවමාරු ක්‍රමය ඔස්සේ වසර 20 කට ආසන්න කාලයකට පසුව හයිනා සහ දුඹුරු වලසුන් වැනි සතුන් දේශීය සත්වෝද්‍යාන වෙත ගෙන්වා ගැනීමට හැකි වීම.
- IUCN රතු දත්ත පොතට අනුව දැඩි ලෙස තර්ජනයට ලක්ව ඇති සත්ත්ව විශේෂ අභිජනනය හා නැවත ස්වාභාවික පරිසරයට මුදා හැරීමට කටයුතු කිරීම.
- දුර්ලභ හා වටිනා සත්ත්ව විශේෂයන් අභිජනනය කර ගැනීමට හැකි වීම.
- විදේශ සබඳතා ශක්තිමත් කරමින් සත්ත්ව හුවමාරු ක්‍රමය යටතේ විශේෂිත සත්ත්ව විශේෂ විදේශ රටවල් සමඟ හුවමාරු කර ගැනීම.
- දෙස් විදෙස් වශයෙන් ස්වේච්ඡා සේවක පැමිණීම වර්ධනය කර ගැනීමට හැකිවීම සහ සත්ත්ව සංරක්ෂණ ක්‍රමවේදයන් සමාජගත කිරීමට හැකි වීම.

අභියෝග

- ආවේණික හා වඳවීමේ තර්ජනයට ලක්ව ඇති සතුන් අභිජනනය කර නැවත ස්වභාවික පරිසරයට මුදාහැරීම.
- කාර්ය මණ්ඩලය විශ්‍රාම ගැනීම, උසස්වීම් ලැබීම හා විදේශ රැකියා සඳහා නිවාඩු ලබා යාම හා පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම හේතුකොටගෙන කාර්ය මණ්ඩල හිඟවීම.
- වෙනත් පෞද්ගලික ආයතන සමඟ පවතින තරඟකාරිත්වය ඉහළ යාම.
- දෛනිකව එක්රැස් වන සත්ත්ව අපද්‍රව්‍ය හා කසල කළමනාකරණයට මෙන්ම ප්‍රතිචක්‍රීකරණය කිරීමට නිසි ක්‍රමවේදයක් නොපැවතීම.
- සතුන් රඳවා තබාගැනීමට එරෙහිව විවිධ පාර්ශවයන් තුළින් එල්ල වන බලපෑම ප්‍රවණතාවය ඉහළයාම.

- අන්තර්ජාතික ප්‍රචාරණය ඉහළ නංවා ගැනීම.
- ඉලක්ක රාශියක් පැවතුනත් එම ඉලක්ක සපුරාගැනීම සඳහා සම්පත් හිඟකම.
- විතැන් සංරක්ෂණය සිදු කරන කොරල් පර නැවත සාගර සම්පතට එකතු කිරීම.
- දේශගුණ වෙනස්වීම් සත්ත්ව ජීවිත වලට තර්ජනාත්මක ලෙස බලපෑම.
- සත්ත්ව හුවමාරුව ඔස්සේ නඩු භාණ්ඩ වශයෙන් ලැබෙන බාහිර සතුන් නිරෝධායනයට සුදුසු නිරෝධායන මධ්‍යස්ථානයක් නොමැති වීම.

ඉදිරි ඉලක්ක

- අලින්ගේ සුබසාධනය හා රැකවරණය සහතික කරමින් අලි සංරක්ෂණ වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීම හා සංරක්ෂණ මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම.
- මාර්ගගත ප්‍රවේශපත්‍ර ක්‍රමය තවදුරටත් විධිමත් කිරීම.
- ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ඒකක වල සිදුකරන සංවර්ධන කටයුතු සම්පූර්ණ කිරීම.
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෘත්තීය නිපුණතා මට්ටම් 5 සහ 6 පිළිබඳ සහතිකපත්‍ර ලබාදීමේ ආයතනයක් බවට පත්කිරීම.
- අධ්‍යාපනික මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා නවීකරණය කිරීම.
- විධිමත් සහ අපද්‍රව්‍ය කළමණාකරණ ක්‍රම හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.
- තාක්ෂණික දැනුම ඇති කාර්යමණ්ඩලයක් බඳවා ගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කිරීම.
- ISO 9001 සහ ISO 14001 තත්ත්ව සහතිකය ලබාගැනීමට කටයුතු කිරීම.
- සත්වෝද්‍යාන පරිශ්‍රයෙන් බැහැර ස්ථානයක සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථානයක් ඉදි කිරීම.
- ගුණාත්මක සත්ත්ව හුවමාරු වැඩසටහනක් යටතේ අත්‍යාවශ්‍ය සතුන් ලබා ගැනීම.
- සත්ත්ව ජාන බැංකුවක් ස්ථාපිත කිරීම.
- විනය පරීක්ෂණ කඩිනමින් අවසන් කර සේවක විනය පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- සත්වෝද්‍යාන පනත යාවත්කාලීන කිරීම.

2.4.10 රාජ්‍ය දැව සංස්ථාව

රාජ්‍ය දැව සංස්ථාව රජය සතු ව්‍යාපාරයකි. ඒය 1968.04.04 දිනැති හා අංක 14796 දරණ ගැසට් පත්‍රය මගින් 1957 අංක 49 දරණ රජයේ කාර්මික සංස්ථා පනතේ බලතල ප්‍රකාරව පිහිටුවන ලද අතර වර්ෂ 55කට වැඩි අත්දැකීම් හා පළපුරුද්ද ඇති ආයතනක් ලෙස රාජ්‍ය දැව සංස්ථාව ඉහල ප්‍රමිතියෙන් යුතු ගෘහ භාණ්ඩ අවශ්‍යතා ඇති හෝටල් හිමිකරුවන්ගේ, රජයේ ආයතන වල සහ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ඇතුළු පෞද්ගලික ගැණුම්කරුවන්ගේ ප්‍රමුඛ තේරීමක් බවට පත්ව ඇත.

2026 වර්ෂය සඳහා සැලසුම් කර ඇති ක්‍රියාකාරකම්

- 2026 සඳහා විකුණුම් මිලියන 6500 ක් අපේක්ෂා කෙරේ.
- ප්‍රාග්ධන වියදම මිලියන 1200ක් පමණ (නව ඉදිකිරීම් සහ ස්ථාවර වත්කම් මිලදී ගැනීම).
- පාරිභෝගික පක්ෂපාතිත්වය වැඩි දියුණු කිරීම.
- නිරසාරභාවය ආමන්ත්‍රණය කරමින් පද්ධතිය සහ තාක්ෂණය උපයෝගී කර ගනිමින් ක්‍රියාවලියේ මෙහෙයුම් කාර්යක්ෂමතාව පවත්වා ගැනීම.
- සේවක කාර්යක්ෂමතාව, තෘප්තිය සහ ශ්‍රම බලකායේ ස්ථාවරත්වය පවත්වා ගැනීම සහ වැඩිදියුණු කිරීම.

ආයතන අරමුදල් ප්‍රගති සාරාංශය **2025.12.31** දිනට රාජ්‍ය දැව සංස්ථාව මූල්‍ය ප්‍රගතිය

2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා සමස්ත ප්‍රගතිය 94%ක් ලබාගෙන ඇත.

රාජ්‍ය දැව සංස්ථාවේ විකුණුම් ප්‍රගතිය

අයිතමය	විකුණුම් ආදායම් ඉලක්කය (රු.)	ප්‍රගතිය (රු.)	%
කඳුන්	3,992,984,299	3,904,270,679	98%
ඉරුදැව	398,505,782	357,623,608	90%
විදුලි කණු	52,050,000	92,689,989	178%
සිල්පර	598,747,204	648,085,348	108%
දර	67,776,645	77,708,562	115%
වැට කණු	8,601,690	14,453,746	168%
වටකණු	5,172,751	15,281,250	295%
අලිවැට කණු	5,100,000	119,156,655	2336%
ගෘහභාණ්ඩ	767,819,012	282,932,324	37%

රාජ්‍ය දැව සංස්ථාවේ නිෂ්පාදන ප්‍රගතිය

අයිතමය	නිෂ්පාදන ඉලක්කය	ප්‍රගතිය	%
කඳුන් (ඝ.මී.)	119,273	115,811	97%
ඉරු දැව (ඝ.මී.)	4,028	2,442	61%
විදුලි කණු	1,500	2,044	136%
සිල්පර	26,279	23,504	89%
දර (ඝ.මී.)	41,127	50,860	124%
වැට කණු	28,677	36,270	126%
වටකණු	18,810	46,626	248%
අලිවැට කණු	265	1,154	435%
ගෘහභාණ්ඩ	426	183	43%

2.5 ඉදිරියේ දී සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහන් හා ඉලක්ක

ස්වභාවධර්මය පදනම් කරගත් සංචාරක ව්‍යාපෘතිය

උරුමය, ප්‍රත්‍යාස්ථතාව, සමාජ ඇතුළත්භාවය සහ වටිනාකම් මත පදනම් වූ රැකියා ප්‍රවර්ධනය සඳහා සංචාරක කර්මාන්තය (THRIVE) - ස්වභාවධර්මය පදනම් කරගත් සංචාරක කර්මාන්තය ගෝලීය වශයෙන් ශීඝ්‍රයෙන් වර්ධනය වන ක්ෂේත්‍රයක් ලෙස සැලකෙන අතර, එහි පවතින විශාල විභවය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ ස්වභාවධර්මය පදනම් කරගත් සංචාරක කර්මාන්තය ශක්තිමත් කිරීම සඳහා මහා පරිමාණ ආයෝජන වැඩසටහනක් සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකාව සතුව පවතින සුවිශේෂී ජෛව විවිධත්වය, විවිධ පරිසර පද්ධති, සංයුක්ත භූගෝලීය ව්‍යාප්තිය මෙන්ම වනාන්තර, තෙත්බිම්, වනජීවී රක්ෂිත, සංස්කෘතික භූ දර්ශන සහ ප්‍රජා මූලික අත්දැකීම් ඉහළ වටිනාකමකින් යුත් සංචාරක විභවයන් සමඟ ඒකාබද්ධ කිරීමේ හැකියාව හේතුවෙන් මෙම ක්ෂේත්‍රය තුළ ශ්‍රී ලංකාවට සුවිශේෂී තරඟකාරී වාසියක් පවතී. එහෙත්, මෙම ශක්තීන් පැවතියද, රටේ ස්වභාවධර්මය පදනම් කරගත් සංචාරක නිෂ්පාදන සහ සේවා තවමත් ප්‍රමාණවත් ලෙස සංවර්ධනය වී නොමැත.

මෙම අභියෝගවලට විසඳුම් ලබාදෙමින් ක්ෂේත්‍රයේ පූර්ණ විභවය ප්‍රයෝජනයට ගැනීම සඳහා, ඇමෙරිකානු ඩොලර් මිලියන 1ක ප්‍රදානයක් ව්‍යාපෘතියේ මූලික සැලසුම් සකස් කිරීම සඳහා සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක ණය පහසුකමක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇතුළත් ලෝක බැංකු මූල්‍ය සහාය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ස්වභාවධර්මය පදනම් කරගත් සංචාරක ව්‍යාපෘතිය සකස් කිරීම අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇත.

ඒ අනුව, ව්‍යාපෘති යෝජනාව ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර, ව්‍යාපෘතියේ සකස් කිරීමේ කටයුතු ඉදිරියට ගෙන යාම සහ 2026/2027 කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබාගැනීමේ අරමුණින් ලෝක බැංකුවේ නියෝජිතයන් සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ අඛණ්ඩ සාකච්ඡා සහ තාක්ෂණික උපදේශන සිදු කරනු ලැබේ.

පරිසර අමාත්‍යාංශය සඳහා ඒකාබද්ධ පාරිසරික දත්ත පුවරුවක් (Environmental Data Dashboard) සංවර්ධනය කිරීම

වර්තමානයේ පාරිසරික දත්ත අමාත්‍යාංශයේ විවිධ අංශ සහ අනුබද්ධ ආයතන අතර විසිරී පවතින අතර, ඒවා බොහෝවිට ප්‍රමිතිගත නොවූ සහ එකිනෙකට අනුකූල නොවන ආකෘතිවල පවත්වාගෙන යනු ලැබේ. මෙම තත්ත්වය හේතුවෙන් දත්ත ඒකාබද්ධ කිරීම සහ අංශ අතර විශ්ලේෂණය සීමා වන අතර, ප්‍රගතිය කාර්යක්ෂමව නිරීක්ෂණය කිරීම, පවතින හිඩැස් හඳුනාගැනීම සහ මතුවෙමින් පවතින පාරිසරික ප්‍රමුඛතා සම්බන්ධයෙන් කාලෝචිතව ප්‍රතිචාර දැක්වීම අපහසු වේ.

මෙම අභියෝගයන්ට විසඳුමක් ලෙස, ආසන්න සජීවී (near real-time) දත්ත ප්‍රදර්ශනය කිරීමේ හැකියාවෙන් යුත් මධ්‍යගත පාරිසරික දත්ත ඒකාබද්ධ කිරීමේ පුවරුවක් (Environmental Data Integration Dashboard) සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත. මෙම පද්ධතියේ ප්‍රධාන කාර්යයන් ලෙස අංශ අතර දත්ත ඒකාබද්ධ කිරීම හා දෘශ්‍යකරණය, අංශ මට්ටමේ සහ අමාත්‍යාංශ මට්ටමේ ව්‍යාපෘති අධීක්ෂණ හා ඇගයීම් (Monitoring and Evaluation - M&E) කටයුතු නිරීක්ෂණය කිරීම, ජාතික වාර්තාකරණ අවශ්‍යතා සහ එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමු සම්මුතිය (UNFCCC) යටතේ වන වාර්තාකරණ අවශ්‍යතාවන්ට අනුකූල ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්ව (NDC) නිරීක්ෂණ පද්ධතියක්, අභිරුචි විශ්ලේෂණ (custom analytics), භූගෝලීය තොරතුරු සිතියම්කරණ (geospatial mapping) පහසුකම්, තීරණ ගැනීම සඳහා සහායක මෙවලම් සහ ප්‍රතිපත්ති සම්පාදකයින්, තාක්ෂණික නිලධාරීන්, සංවර්ධන හවුල්කරුවන් සහ මහජනතාව සඳහා ප්‍රවේශ පහසුකම් ඇතුළත් වේ.

මෙම පද්ධතිය, ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය (IWMI) විසින් සංවර්ධනය කර ඇති Climate Smart Dashboard පද්ධතිය මත පදනම්ව සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත. මේ සම්බන්ධයෙන් IWMI ආයතනය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විසින් ලබා දී ඇති නිරීක්ෂණ සහ අදහස් ද සැලකිල්ලට ගනිමින් දැනට සමාලෝචනය කරමින් පවතී.

දිට්වා සුළි කුණාටුව, ගංවතුර හා නායයාම ආපදා තත්ත්වය සඳහා පරිසර අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන පරිසර අංශයන්ගෙන් සිදු වූ හානි යතාවත් කිරීම

- 2025 නොවැම්බර් මාසයේදී ඇති වූ දිට්වා සුළි කුණාටුව, ගංවතුර හා නායයෑම් ආපදා තත්ත්වයන් හේතුවෙන් පරිසර ක්ෂේත්‍රයට සිදුවූ බලපෑම් හා හානි සම්බන්ධයෙන් පරිසර අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතන විසින් අවශ්‍ය තක්සේරු කිරීම් කටයුතු සිදු කරන ලදී.
- ඒ අනුව, පරිසර අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතනවල පරිසර ක්ෂේත්‍රයට සිදුවූ හානි, 2025 දෙසැම්බර් 31 දිනැති අංක 2469/09 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව තක්සේරු කරන ලද අතර, එම තක්සේරු කිරීම් මත පදනම්ව Rebuilding Sri Lanka වැඩසටහන යටතේ අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සඳහා වූ ඉල්ලීම් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන ලදී.
- වසර 24 කට පසු ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම, නිෂ්පාදකයාගේ විස්තීරණ වගකීම ක්‍රියාත්මක කිරීමට කටයුතු සුදානම් කිරීම, උපායමාර්ගික ඇගයීම් සිදු කිරීමට අවශ්‍ය රෙගුලාසි සැකසීම සහ රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය රෙගුලාසි කෙටුම්පත් කිරීම ඇතුළත් වන අතර, සංශෝධිත ජාතික පාරිසරික පනත ගැසට් කිරීම සඳහා රජයේ මුද්‍රණාලය වෙත භාර දී ඇත. පරිසර අමාත්‍යාංශය විසින් පාර්ශවකරුවන් සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ සම්බන්ධීකරණයෙන් ආපදා ආශ්‍රිත හානිවලින් යථා තත්ත්වයට පත් කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් සකස් කරමින් පවතින අතර එය පාඩු සහ හානි සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා වන අරමුදල (Fund for Loss and Damage) වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.
- 2025 දී ඉදිරිපත් කරන ලද ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් (NDC 3.0) ඉලක්කයන්ට අනුකූලව එහි ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කිරීමටත්, දේශගුණයට ඔරොත්තු දෙන ශ්‍රී ලංකාවක් ගොඩනැගීමේ දැක්ම සහිත ජාතික අනුවර්තන සැලැස්ම (NAP 2.0) 2026–2035 ,කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමටත් නියමිතය. තවද, NBSAP සහ CPP සැලසුම් යාවත්කාලීන කර කැබිනට් අනුමැතියට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන අතර, 2026 වසරේදී හරිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ESA ක්‍රියාත්මක කිරීමේ ජාතික මාර්ගෝපදේශ සැකසීම මෙන්ම ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමේ කටයුතු ද සිදු කෙරේ. 2026 වසරේ සිට දිවයිනේ සියලුම ජල මූලාශ්‍ර අධ්‍යයනය කර සිතියම් ගත කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමටත්, ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ දිය උල්පත් 362 ක් සංරක්ෂණය කිරීමටත්, දිවයින වටා වෙරළ උද්‍යාන 26 ක් ස්ථාපිත කිරීමටත් කටයුතු කෙරේ. තංගල්ල වෙරළ තීරයේ දෙස් විදෙස් සංචාරකයින්ට ආරක්ෂිතව මුහුදු දිය ස්නානය කරීම සඳහා අරක්ෂිත මුහුදු තටාකයක් (Ocen Pool)ඉදි කිරීමට කටයුතු කිරීමට නියමිතය.
- වනජීවී හා වන සංරක්ෂණ අංශය මඟින් යාල, උඩවලව සහ විල්පත්තු වැනි ජාතික උද්‍යානවල සංචාරක ආකර්ෂණය වැඩි කිරීමට ලෝක බැංකු හා ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සඳහා අවශ්‍ය වාහන (කැබ් රථ, මෝටර් බයිසිකල් සහ ට්‍රැක්ටර්) මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති අතර, අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා පුහුණුව ලත් සිවිල් ආරක්ෂක නිලධාරීන් 5,000ක් ස්ථිර පදනමින් බඳවා ගැනීමට ද පියවර ගෙන ඇත. තවද, පැය 24 පුරා ක්‍රියාත්මක "වන සුරැකුම" මධ්‍යස්ථානය මඟින් වනඅපරාධ විමර්ශනය කිරීම, සෆාරි උද්‍යාන සඳහා නව මාර්ග සිතියම් සකස් කිරීම, දිට්වා සුළි කුණාටුවෙන් හානි වූ විදුලි වැටවල් ප්‍රතිසංස්කරණය (කි.මී. 838) සහ 2026 වසරේ නව විදුලි වැටවල් (කි.මී. 1060) ඉදි කිරීම ද සැලසුම් කර ඇත. මීට අමතරව, තිරසර වනාන්තර කළමනාකරණය තුළින් ඉඩම් ගැටළු නිරාකරණය කිරීම සහ වනාන්තර සංරක්ෂණය සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු ද සිදු කරනු ලබයි.
- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව මඟින් පසුගිය වසරට (2025) සාපේක්ෂව 2026 වසරේදී උද්‍යානවලට පැමිණෙන නැරඹුනන්ගේ මුළු සංඛ්‍යාව සහ මුළු

ආදායම 10%කින් ඉහළ දැමීමට අපේක්ෂිතය.තවද උද්‍යානවල භාවිතය සහ අලෙවිකරණ අරමුණු සඳහා භාවිතා කරන අතරතුර, සංරක්ෂණය, අධ්‍යාපන පර්යේෂණ සහ මහජන ප්‍රදර්ශනය සඳහා සියලුම උද්‍යානවල ශාක 500,000ක් නිෂ්පාදනය කෙරෙනු ඇත.

- 2026 වසර සඳහා BG-BASE නැමති ජාත්‍යන්තර දත්ත සමුදාය සක්‍රිය කිරීම සිදු කිරීමට නියමිත වන අතර BG-BASE යනු උද්භිද උද්‍යාන විසින් සජීව එකතූන්, ශාකාගාර එකතූන්, ශාක විද්‍යා සහ නාමකරණය, සංරක්ෂණය සහ දත්ත හුවමාරුව, සිතියම්ගත කිරීම සහ ලේබල් කිරීම යනාදිය පිළිබඳ තොරතුරු ගබඩා කිරීම සහ සංවිධානය කිරීම සඳහා භාවිත කරන ජාත්‍යන්තර ශාක දත්ත කළමනාකරණ පද්ධතියකි.
- නකල්ස් සංරක්ෂණ ප්‍රදේශයේ සහ කුරුණෑගල ඇතුළු අනෙකුත් තෝරාගත් වන රක්ෂිතවල තර්ජනයට ලක්ව ඇති ශාක
- විශේෂ ගවේෂණය කිරීම සහ නිදර්ශක එකතු කිරීම සඳහා 2026 වසරේදී ද උද්භිද විද්‍යාත්මක සමීක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කෙරෙනු ඇත. මෙය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ශාක ගවේෂණ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වේ. එමෙන්ම, ජෛව විවිධත්ව සංරක්ෂණ පියවර සහ විතැන් සංරක්ෂණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීමට සහ විවිධ කර්මාන්තවල තිරසාර ආර්ථිකමය වටිනාකමක් ඇති විශේෂ හඳුනා ගැනීමට ද හේතු වේ.
- දේශීය හා විදේශීය කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් හරහා කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය සිදු කිරීමට අපේක්ෂා කරන අතර මල් වගාව පිළිබඳ ජාතික සමුලුව (NaSFlor) පැවැත්වීම.
- **ස්වාභාවික ජල උල්පත් සිතියම්ගත කිරීම හා සංරක්ෂණය (අදියර II – මධ්‍යම සහ උතුරු මැද පළාත් | රු. මිලියන 1.00):** රට තුළ පිහිටි ස්වාභාවික ජල උල්පත් සම්බන්ධ දැනට පවතින තොරතුරු හඳුනාගෙන, තෝරාගත් දිස්ත්‍රික්කයන්හි මූලික අධ්‍යයන සහ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කර ජල උල්පත්, සංවේදී කලාප සහ ජල පෝෂක ප්‍රදේශ හඳුනාගැනීම. ඒ අනුව සංරක්ෂණ නිර්දේශ හා කළමනාකරණ සැලසුම් සකස් කර අදාළ පාර්ශ්ව සහ ප්‍රජාවන් මගින් ක්‍රියාත්මක කිරීම.
- **භූගත ජල සම්පත් සිතියම්ගත කිරීම හා කළමනාකරණය (රු. මිලියන 7.50):** වාණිජ හා ජල සම්පාදන කටයුතු සඳහා භාවිත වන භූගත ජල මූලාශ්‍ර හඳුනාගෙන, දත්ත රැස් කිරීම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිතියම් සකස් කිරීම. එමඟින් නියාමන ක්‍රමවේදයක් සකස් කිරීම, ආරක්ෂිත ජල පරිමාවන් නිර්ණය කිරීම සහ කෙටි හා දිගු කාලීන තිරසාර ජල කළමනාකරණ සැලසුම් සකස් කිරීම.
- **ජල මූලාශ්‍රවල ගුණාත්මකභාවය අධ්‍යයනය හා දත්ත කළමනාකරණය (අදියර II – මධ්‍යම සහ උතුරු මැද පළාත් | රු. මිලියන 6.00):** ගංගා, ඇළ දොළ, වැව් පද්ධති සහ අනෙකුත් ජල සම්පත් පිළිබඳ ජල ගුණාත්මකභාවය අධ්‍යයනය කර මධ්‍යම දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම. කාලානුරූපී සිතියම්ගත කිරීම මගින් රසායනික වෙනස්කම් හඳුනාගෙන ජල මූලාශ්‍ර ආරක්ෂාව සඳහා අවශ්‍ය කළමනාකරණ හා දිගුකාලීන සැලසුම් සකස් කිරීම. සංවේදී ජල මූලාශ්‍ර හඳුනාගෙන ප්‍රදේශවාසී අවශ්‍යතා සහ හදිසි තත්ත්වයන් සඳහා සුදුසු කළමනාකරණ ක්‍රමවේද සකස් කිරීම.
- **භූගත ජල සම්පත් සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ වැඩසටහන් (රු. මිලියන 1.00):** භූගත ජල සම්පත් භාවිතයේදී ඇතිවන ගැටලු සඳහා තාක්ෂණික නිර්දේශ ලබාදීම, ජල හිමිකම් හා සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා 2026 වර්ෂය තුළ ක්ෂේත්‍ර පරීක්ෂණ වැඩසටහන් 300ක් ක්‍රියාත්මක කිරීම.

ඇමුණුම I

03 පරිච්ඡේදය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ -එෆ්

2025 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තත්‍ය වර්තමාන වර්ෂය රු.	- ඉකුත් වර්ෂය රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,100,223,397	855,972,416	ඒසීඒ-3
-	තැන්පතු		104,709,457	416,401,305	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		28,392,371	18,648,601	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		22,858,210	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,256,183,436**	**1,291,022,321**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,256,183,436**	**1,291,022,321**	

	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		64,038,512	52,612,734	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**1,192,144,923**	**1,238,409,587**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
686,050,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	657,397,080	489,232,749	**ඒසිඒ-2(ii)**
264,060,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	213,219,138	138,806,073	
1,838,322,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	1,697,479,117	955,669,836	
-	පොළී ගෙවීම්	**8**	-	-	
1,100,000	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	79,468		
2,789,532,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**2,568,174,801**	**1,583,708,657**	
	මූලධන වියදම්				
69,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	29,674,584	5,880,747	**ඒසිඒ-2(ii)**
33,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	29,893,117	61,566,504	
166,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	161,121,890	59,999,813	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
2,550,000	හැකියා වර්ධනය	**14**	2,505,046	754,810	
742,880,000	වෙනත් මූලධන වියදම්	**15**	413,258,887	286,100,410	
1,014,430,000	**මුළු මූලධන වියදම් (උ)**		**636,453,523**	**414,302,284**	
	තැන්පතු ගෙවීම්		110,080,155	436,786,143	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		62,670,496	28,392,734	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**172,750,651**	**465,178,876**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**3,377,378,975**	**2,463,189,818**	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**2,185,234,052**	**(1,224,780,231)**	

අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය	(2,185,234,052)	(1,225,863,559)	ඒසිඒ-7
දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		1,083,328	ඒසිඒ-3
	(2,185,234,052)	**(1,224,780,231)**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2025 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		තත්ය	
	සටහන	**වර්තමාන වර්ෂය**	**ඉකුත් වර්ෂය**
		රු.	**රු.**
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,966,475,342	1,673,362,730
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	75,859,376	41,581,251
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**2,042,334,718**	**1,714,943,981**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		52,509,451	23,411,219
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,966,475,342	1,673,362,730
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	23,349,925	17,086,704
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	1,083,328
මුළු වගකීම්		**2,042,334,718**	**1,714,943,981**

පිටු අංක 6 සිට 58 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 59 සිට 105 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** ඒකීභූතයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණකාධිකම් නිලධාරි නම : තනතුර : දිනය : 26/02/2026	ගණකාධිකම් නිලධාරි නම : තනතුර : දිනය :	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගිණුම්කාරිණි/ අධ්‍යක්ෂ (මූල්‍ය)/ සෙක්‍රෙටරීස් (මූල්‍ය) නම : දිනය : 2026/2/25

කේ.ආර්. උඩුවාවල
පරිපාලන නිලධාරී
පරිපාලන අමාත්‍යාංශය
"සොකොදම පියස", අංක 416/සී/1,
රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල.

එම්. ඒස්. පවිත්‍රන්ත
ප්‍රධාන මූල්‍ය නිලධාරි
පරිපාලන අමාත්‍යාංශය

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	වර්තමාන වර්ෂය රු.	ඉකුත් වර්ෂය රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	22,858,210	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	55,034,615	36,706,707
අග්‍රිම ලැබීම්	1,100,223,397	855,972,416
අත්තිකාරම් අයකර ගැනීම්	40,923,813	16,679,271
තැන්පතු ලැබීම්	104,709,457	416,401,305
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,323,749,493**	**1,325,759,698**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	650,007,217	439,359,135
සහනාධාර සහ මාරුකිරීම්	58,697,974	83,599,836
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	31,013,298	2,627,379
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	64,038,512	52,612,734
අත්තිකාරම් ගෙවීම්	57,440,669	22,030,622

තැන්පතු ගෙවීම්	110,080,155	436,786,143
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**971,277,825**	**1,037,015,848**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) =(අ)-(ආ)	**352,471,668**	**288,743,850**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	352,471,668	287,660,522
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**352,471,668**	**287,660,522**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(352,471,668)**	**(287,660,522)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	**1,083,328**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)		**1,083,328**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	**1,083,328**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2006-02-00	ප්‍රාග්ධන වත්කම් විකිණීම්	-	-	16,025,555.00	-
2002-01-01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී	-	-	311,350.05	-
2002-02-99	පොලිය- අනෙකුත්			1,666,762.22	
2003-02- 99	විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ	-	-	84,285.65	-
2003-99-00	විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම්	-	-	3,217,758.41	

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන අමාත්‍ය කාර්යාලය	80,000,000.00	68,080,000.00	62,539,106. 90	91.86%
පරිපාලන සහ ආයතනික සේවා (පරිසර අංශය)	737,000,000.00	756,370,000.00	737,390,285.66	97.49%
ප්‍රාග්ධන අමාත්‍ය කාර්යාලය	8,000,000.00	9,009,100.00	6,222,576.13	69.07%
පරිපාලන සහ ආයතනික සේවා (පරිසර අංශය)	42,000,000.00	41,540,900.00	25,877,396.07	62.29%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	-	-	-	-	-
2	ජනාධිපති කාර්යාලය	ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන	160,832,621.42	160,832,621.42	115,778,464.88	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2025** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2025** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ	-	-	-	-
9153	ඉඩම්	-	-		
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PSE/D/ME/01/25/01
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2026 මැයි 29 දින

ප්‍රධාන ගණකාන්දීමේ නිලධාරී
පරිසර අමාත්‍යාංශය

ශීර්ෂය 160 - පරිසර අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සමිති්ක්ෂණ වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තක්ත්වාංගණය කළ මණ්ඩලය

ශීර්ෂය 160 - පරිසර අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තක්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක හිඟුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ පොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වැවස්ථාවේ ඇතළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණකාන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු වාර්ෂික විත්තරාත්මික කළමනාකරණ විගණන වාර්තාව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වැවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පරිසර අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තක්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 3හි සඳහන් මූල්‍ය

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 73 31 info@audiogeneral.gov.lk www.naoal.gov.lk

ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකකාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීමේ උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් I කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය මිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව පරිසර අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නියෑ, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව පරිසර අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය මිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකකාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන සිදුකිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන සිදුකිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන සිදුකිරීමට හැකිවන පරිදි ප්‍රවේශිය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් සිදුවන්නේ හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සුදුසුකම් අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන

ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එම ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දූස්ඝන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී නඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණකාධිපතිගේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) පරිසර අමාත්‍යාංශය පවත්වා ගෙන යනු ලබන සොබාදම් පියස ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ නක්සේරු වටිනාකම් වූ රු.261,000,000 ක් මූල්‍ය නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කිරීමට හා ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතියට තාවකාලිකව අනුයුක්ත කර තිබූ වාහන 09 ක් පරිසර අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 26 දින කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය වෙත නීත්‍යානුකූලව පවරාදීමට තීරණය කර තෘතිකව අයිතිය ලබා දී තිබුණි. එසේ වුවද, උක්ත වාහන 09ට අදාළ රු. 16,800,000 ක වටිනාකම් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් අගය තුල දක්වා තිබුණි. එසේම කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති වාහන 03ක් වර්තමානයේදී අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලැබුවද එම වාහනවල අයිතිය පරිසර අමාත්‍යාංශය නමට පවරාගැනීමට කටයුතු සම්පූර්ණ කරගෙන නොතිබුණු අතර ඊට අදාල පිරිවැය වූ රු.12,400,000 ක් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් තුළ ඇතුළත් කර නොතිබුණි

තවද, අමාත්‍යාංශය විසින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට නීත්‍යානුකූලව අයිතිය පවරා තිබූ පිරිවැය රු.6,600,000 ක් වූ වාහන 03 ක් සහ 2025 දෙසම්බර් 16 දින ආගමන විගමන පාලන දෙපාර්තමේන්තුවට නීත්‍යානුකූලව අයිතිය පවරා තිබූ පිරිවැය රු.5,995,000 ක් වූ වාහනයේ වටිනාකම් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් අගය තුල දක්වා තිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1. (අ) (i)	පරිසර අමාත්‍යාංශය පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල පිණිවිඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට හා ඉඩමේ හා ගොඩනැගිල්ලේ නන්සේරු වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කිරීමට කටයුතු කිරීම.	1.6.1 (අ)
1.6.1. (අ) (iii)	උමංඩිය පහළ නිමින සංවර්ධන ව්‍යාපෘතියට තාවකාලිකව අනුයුක්ත කර තිබූ වාහන 09 පවරා දීමේ කටයුතු කඩිනම් කර ගිණුම් පොත්පත් නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය .	1.6.1. (ආ)
1.6.1. (අ) (iv)	KB-7120 සහ GW-1326 දරන වාහන නීත්‍යානුකූලව පැවරීමේ කටයුතු කඩිනම් කර වත්කම් නිසි පරිදි ගිණුම්ගත කල යුතුය.	
1.6.1. (අ) (vi)	KO-8812 දරන වාහනයේ නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු කඩිනම් කර වත්කම් නියමිත පරිදි ගිණුම්ගත කල යුතුය.	

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නැකිනාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව හා සකසුරුවම්කම් සහ කාර්යක්ෂමතාව ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු සම්පාදනය කර නිබෙන බවට ගණන්දීමේ නිලධාරියා විශේෂයෙන් වගබලාගත යුතු වුවත් ගිවිසුම් අත්සන් කිරීමේ ගැටලු, ව්‍යාපෘති සඳහා මුදල් ලැබීමේ ප්‍රමාදයන් ඉල්ලුම් නොකළ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලැබීම් සහ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම සඳහා ලද ඉල්ලීම් ප්‍රමාණයේ අඩුවීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයෙහි අමාත්‍යාංශයේ මූලධන වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු රු. 38,880,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉහිරී ම තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයෙහි නිශ්චිත කාල සටහනකට හා නිසි ක්‍රමවේදයකට අනුව කාර්යක්ෂමව කටයුතු කර නොතිබීම හේතුවෙන් මූලධන වැය විෂයයන් 07 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු. 145,387,000කින් රු. 118,245,255ක් ඉහිරිව තිබුණු අතර ඉහිරියේ ප්‍රතිශතය සියයට 65 ත් සියයට 96 ත් අතර පරාසයන් තුළ විය.

(ඇ) 160-2-3-149-2507 වැය විෂය යටතේ එක්සත් ජාතීන්ගේ කාන්තාරිකරණය වැළැක්වීමේ සම්මුතියේ අධීක්ෂණය හා වාර්තාකරණය වැඩිදියුණු කිරීමට යොමු කිරීම සඳහා පාර්ශවකාර ආයතන හා වෘත්තිකයන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘතිය සඳහා වාර්ෂික අයවැයගත ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු.4,000,000 ට මුදල් රෙගුලාසි 66/69 යටතේ රු.1,500,000 ක් මාරු කර තිබුණද පිරිවිතර අනුව සැලසුම් කළ ක්‍රියාකාරකම්වල අපේක්ෂිත මිලට වඩා මිල ගණන් වැඩිවීම් හා ව්‍යාපෘති අරමුදල් නොවැම්බර් අග ලැබීම් හේතුවෙන් එම මුළු මාරු කිරීම් ප්‍රමාණයම වියදම් නොකොට ඉහිරි වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ කඩොලානයන්හි මූලික කාබන් නිධි ගණනය කිරීම (වැය විෂය අංක 160-2-3-161-2509) හා කඩොලාන ප්‍රතිස්ථාපනය කිරීමෙදී මූල් සංක්‍රමණිකයන් පිළිබඳ අධ්‍යයනය කිරීම හා ඇටලයිට් හා ඩ්‍රෝන තාක්ෂණය ආධාරයෙන් කඩොලාන හා මුහුදු තෘණ අතරමැදි කලාපය සිතියම්ගත කිරීම (වැය විෂය අංක 160-2-3-162-2509) සඳහා පරිපූරක ඇස්තමේන්තු යටතේ ලබාගෙන තිබූ පිළිවෙලින් රු. 9,330,000 හා රු. 8,050,00 අදාල කාර්යයන් ඉටු නොකර සම්පූර්ණයෙන් ඉහිරි කර තිබුණි.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i. මුදල් රෙගුලාසි 104(1) (3)	හානියක් හෝ පාඩුවක් සිදුවී පූර්ණ වාර්තාවක් ලබා දීමට දින 07 කට වැඩි ප්‍රමාදයක් සිදු වෙයැයි අපේක්ෂා කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් වහාම ලබා දිය යුතු නමුත් 2025 ජනවාරි 01 දින සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා සිදුවී තිබුණු වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාවන් ලබා දී නොතිබුණි.
ii. මුදල් රෙගුලාසි 104 (1) (4)	හානිය සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය සතු වාහන 04 ක් සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවන් ලබා දීමේ ප්‍රමාද වීම මාස 05 ත් මාස 09 ත් අතර කාල පරාසයක විය.
(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ	
i. 2024 දෙසැම්බර් 18 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024 හි 02 (i) (ඇ) හා 02 (ii) ඡේදය	අමාත්‍යාංශ ලේකම් විසින් 2025 ජූනි 25 දින අපහරණය කිරීම සඳහා අනුමැතිය ලබා දුන් වාහන 03 ක වටිනාකම් නක්සේරු කිරීමට 2025 අගෝස්තු 07 දින කමිටුවක් පත් කර තිබුණද 2026 පෙබරවාරි 02 දින වන විටත් අදාල වාහන නක්සේරු කර අපහරණය සිදු කර නොතිබුණි.

ii.	විදේශ සමිපත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2013 ඔක්තෝබර් 24 දිනැති විදේශ සුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් වූ අංක TA Circular 2013/2014 (ii) දරණ චක්‍රලේඛය මඟින් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශ	i. කිසිදු රාජ්‍ය ආයතනයක් ද්වි පාර්ශවීය හා බහු පාර්ශවීය සංවර්ධන හවුල්කාරිත්ව ආයතන විසින් පිරිනමනු ලබන විදේශීය සම්මන්ත්‍රණ හා වැඩමුළුවල ඇතුළු විදේශ සුහුණු වැඩසටහන් විදේශ සමිපත් දෙපාර්තමේන්තුව හරහා සම්බන්ධීකරණය කර නොගෙන සංවර්ධන හවුල්කාර ආයතන සමඟ සෘජුව කටයුතු කිරීම පාලනය කළ යුතු බව දක්වා තිබුණද 2025 වර්ෂය තුළ අමාත්‍යාංශයේ නිලධාරීන් සහභාගී වී තිබූ විදේශ සුහුණු/වැඩමුළු හා සම්මන්ත්‍රණ 21 න් අතුරින් 18 න් එනම් සියයට 86 ක් චක්‍රලේඛ විධිවිධාන වලට අනුව විදේශ සමිපත් දෙපාර්තමේන්තුව හරහා සම්බන්ධීකරණය කරගෙන නොතිබුණි. ii. විදේශ ප්‍රදාන/දේශීය අරමුදල් අයවැය සම්බන්ධයෙන් නිසි ආකාරයට ගිණුම් පවත්වාගෙනයාම සඳහා විදේශ වැඩසටහන්වලට කෝරාගත් අයදුම්කරුවන්ගේ නම් විදේශ සමිපත් දෙපාර්තමේන්තුව හරහා සංවර්ධන හවුල්කාරිත්ව ආයතන වෙත සන්නිවේදනය කළ යුතු අතර රාජ්‍ය ගිණුම්කරණ හා මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා යටතේ සියළු විදේශ ප්‍රදාන පිරිවැය නිසි පරිදි වාර්තාගත කළ යුතු බව දක්වා තිබුණ ද අමාත්‍යාංශය සංවර්ධන හවුල්කාරිත්ව ආයතන සමඟ සෘජුව සම්බන්ධීකරණ කටයුතු කිරීම හේතුවෙන් එම විදේශ ප්‍රදාන පිරිවැය නිසි පරිදි වාර්තා කර නොතිබුණි.
iii.	2019 ජුනි 24 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2019	
	i. 12 වන වගන්තිය	අමාත්‍යාංශ ප්‍රධානියා විසින් අවුරුදු 58ට වැඩි රජයේ නිලධාරීන් විදේශ වැඩසටහන්වලට නිර්දේශ කිරීමෙදී අදාල අයදුම්පත සමඟ අවශ්‍යතාවය පිළිබඳ ඉහළ සාධාරණීකරණයක්ද ඉදිරිපත් කල යුතු බව දක්වා තිබුණද

අමාත්‍යාංශය විසින් නිලධාරීන් 06 දෙනෙකු සම්බන්ධයෙන් එම විධිවිධාන අනුව ක්‍රියාකර නොතිබුණි.

ii. 11 වන වගන්තිය

වයස අවුරුදු 55 ත් 58 ත් අතර නිලධාරීන් සති 02 කට අඩු විදේශ චාරිකාවන් සඳහා පමණක් නිර්දේශ කලයුතු අතර අදාල නිලධාරියාට තම නිල තනතුර මත රට හෝ ආයතනය නියෝජනය කිරීමේ අවස්ථා පමණක් සැලකිල්ලට ගත යුතු වුවද අමාත්‍යාංශයේ විධායක නිලධාරීන් දෙදෙනෙකුගේ සංචාර 03ක් සඳහා එම විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

3.3 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) ප්‍රකාරව කිසියම් විශේෂිත කාර්යයක් සඳහා ලබා දෙනු ලබන තත්කාර්යය අතුරු අග්‍රිමය රු.100,000 ඉක්මවන අවස්ථාවලදී ගණන්දීමේ නිලධාරියා විසින් එම අවශ්‍යතාවය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් කරුණු සමඟින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශයද සහිතව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් පූර්ව අවසරය ලබාගත යුතු වුවද එසේ අනුමැතිය ලබා නොගෙන ඉහත චක්‍රලේඛ ප්‍රතිපාදනවලට පටහැනිව අමාත්‍යාංශයෙන් පරිබාහිරව අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, සභාපති, මධ්‍යම පරිසර අධිකාරිය, නාවික හමුදාපති, වන සංරක්ෂණ ජනරාල් හා දිස්ත්‍රික් ලේකම් -මන්නාරම වෙත විවිධ වැඩසටහන් සඳහා අවස්ථා 05 කදී රු.28,533,455ක් ද ලබා දී නිබුණි.

3.4 නැන්පතු

(අ) 2024 සැප්තැම්බර් 10 දිනැති අංක අමප/24/1711/622/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ඉදිකිරීම් කර්මාන්තය සඳහා භාවිතා කරන බණිජ කැණීම්, ප්‍රවාහනය සහ වෙළඳාම පිළිබඳ කාර්යය සංග්‍රහයේ පරිවර්තේද අංක 06 හි සඳහන් ඒකීය ගාස්තු ක්‍රමය ක්‍රියාත්මක කිරීම 2024 අගෝස්තු 31 දින සිට වසර 2 ක කාලපරිච්ඡේදයක් සඳහා තාවකාලිකව අත්හිටුවා තිබුණි. මෙම අමාත්‍ය මණ්ඩල තීරණයෙහි 3.2 අනුව ඒකීය ගාස්තු ක්‍රමය ක්‍රියාත්මක වූ 2023 ජූනි 01 සිට 2024 අගෝස්තු 31 දින දක්වා කාලය තුල මුදල් අයකර ගැනීමේ ගැටලු නිවැරදි කිරීම, දෝෂ නත්වයන් සිදු වී ඇත්නම් ඒ සම්බන්ධයෙන් හැකි ඉක්මනින් කටයුතු කිරීම අපේක්ෂා කර තිබුනද, පරිසර අමාත්‍යාංශයේ 6000-0-0-13-0-74 දරන පොදු නැන්පත් ගිණුමෙහි 2024 සැප්තැම්බර් 24 දින

නැන්පත් කර තිබුණු රු.1,586,054 ක ශේෂයක් 2026 මාර්තු 24 දිනවන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ වැඩසටහනයේ (ESCAMP) යටතේ ඉහලමලුව පුහුණු මධ්‍යස්ථානයේ සහ තුවරළිය නිල නිවාස ඉදිකිරීම් වෙනුවෙන් ගෙවීම් කිරීමට 2023 දෙසැම්බර් 24 දින නැන්පත් කර තිබූ රු.9,873,566 ක ශේෂයක් ගැටළුකාරී තත්ත්වයන් මතුවීම හේතුවෙන් බිල්පත් නොගෙවීම මත 2026 මාර්තු 24 දින වනවිටත් නිරවුල් නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

ජාතික පරිසර ප්‍රතිපත්තියේ අරමුණු ක්‍රියාත්මක කිරීමට අදාලව සකස් කරන ලද ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම (NEAP 2022-2030) සඳහා 2022 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී ධීවර ඇමතිතුමාගේ නිරීක්ෂණ කෙරෙහි සැලකිල්ලක් දැක්වීමට උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව දේශගුණයට ඔරෝත්තු දෙන ඇඟිල්ලෝ මත්ස්‍යයින් හඳුනාගැනීමට වර්ෂ 05-10 වැනි දිගු කාලයක් අවශ්‍ය බව නිරීක්ෂණය කර තිබුණද සැලැස්ම අනුව එය වර්ෂ 1-2 ත් සහ 2-5 ලෙස කෙටි හා මධ්‍ය කාලීන කාල රාමුවක් හඳුනා ගෙන තිබුණි. තවද දේශගුණ විපර්යාස හේතුවෙන් දැඩි ලෙස අවධානමට ලක්විය හැකි කලපු 30 ක් ආශ්‍රිතව ධීවර හා ජලජ සම්පත් නිෂ්පාදන හැකියාවන් වර්ධනය කිරීම සමඟම එම කලපුවල ශෛව පද්ධතියට හා භූගෝලීය තත්ත්වයන්ට දේශගුණික විපර්යාස මඟින් වන බලපෑම් ද සැලකිල්ලට ගත යුතු බව එම නිරීක්ෂණ අනුව දක්වා තිබුණද එට අදාල වැඩසටහනක් සකස්කර නොතිබුණි. එසේම ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් දේශගුණික විපර්යාස සහ ධීවර හා ජලජ සම්පත් පිළිබඳව සැලකිය යුතු පර්යේෂණ ප්‍රමාණයක් සිදු කර ඇති බවත්, කාර්ය සාධන දර්ශක මැනීම සඳහා මූලික පදනමක් ලෙස මෙම පර්යේෂණය හඳුනාගත හැකි බවත් ප්‍රකාශ කළද, සැලැස්ම යටතේ කාර්ය සාධන දර්ශක මැනීම සඳහා මූලික පදනමක් ලෙස දේශගුණික විපර්යාස පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි.

4.2. විදේශ ආධාර ව්‍යාපෘති

4.2.1 විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

(අ) පාරිසරික සංවේදී ප්‍රදේශ සිතියම් ගත කිරීම, ඒකාබද්ධ ශෛව විවිධත්ව තක්සේරු මෙවලම් හා වෙබ් අඩවි යාවත්කාලීන කිරීම

පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශවල ශෛව විවිධත්වය සහ පරිසර පද්ධති සේවාවන්හි තිරසරභාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ වයඹ විශ්ව විද්‍යාලය හා පරිසර අමාත්‍යාංශය අතර 2021 ඔක්තෝබර් 22 දින අත්සන් කරන ලද ගිවිසුම් ප්‍රකාරව පාරිසරික සංවේදී ප්‍රදේශ සිතියම් ගත කිරීම, ඒකාබද්ධ ශෛව විවිධත්ව තක්සේරු මෙවලම් හා වෙබ් අඩවි යාවත්කාලීන කිරීම, වෙබ්අඩවිය ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කිරීම, වර්ෂ 05 ක කාලසීමාව සඳහා වෙබ් අඩවිය නඩත්තු කිරීම හා යාවත්කාලීන කිරීම, වෙබ් අඩවිය නඩත්තු කිරීම සඳහා සුදුසු අත්පොත් සකස් කිරීම හා නිලධාරීන් පුහුණුව වයඹ විශ්ව විද්‍යාලයට පැවරී තිබුණු අතර ඒ සඳහා වූ සමස්ථ වියදම රු.5,733,783 ක් වයඹ විශ්ව විද්‍යාලය වෙත ලබා දී තිබුණි.

2021 වර්ෂයේදී ගිවිසුම්ගත වුවද, අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිය අවශ්‍යව අධීක්ෂණය නොකිරීම සහ කාලානුරූපීව පරිපාලනමය කාර්යයන් සඳහා මැදිහත් නොවීම හේතුවෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු 2026 මාර්තු 31 දින වන විටත් සම්පූර්ණ කර නොනිබුණු අතර 2026 ඔක්තෝම්බර් 22 දින වන විට ගිවිසුමේ කාලය අවසන් වීමට නියමිතව ඇත.

(ආ) සෘජු විදේශාධාර ව්‍යාපෘති

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අංක ERD/AE/GEN/16 හා 2024 අප්‍රේල් 30 දිනැති ප්‍රදාන අරමුදල් යෙදීම ව්‍යාපෘති වල අරමුදල් සම්ප්‍රේෂණ යාන්ත්‍රණය සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද විධිමත් කිරීමේ චක්‍රලේඛය ප්‍රකාරව විදේශාධාර ව්‍යාපෘති 02ක විස්තරාත්මක වියදම් වාර්තා කාර්තුමය වශයෙන් රජයේ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොනිබුණි.

(ඇ) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ භාවිතා වන දිගුකල් පවතින කාබනික දූෂක සහ සෞඛ්‍ය සේවා අංශ වල භාවිතා වන රසදිය හා අපද්‍රව්‍ය කළමනාකරණය සහ ඒවා පරිසර හිතකාමී ලෙස බැහැර කිරීමේ ව්‍යාපෘතියේ 2025 වර්ෂයට අදාල ක්‍රියාකාරකම් වල 2025 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 40 ක් ව පැවතුණි.

(ඈ) අමාත්‍යාංශයේ විදේශාධාර ව්‍යාපෘති වලට අදාලව 2025 වර්ෂයට අදාල වාර්ෂික මූල්‍ය ප්‍රගතිය සියයට 52 ක් පමණක් වී තිබුණි.

4.2.2 ව්‍යාපෘති වත්කම් උණු උපයෝජනය/ නිෂ්ක්‍රියව පැවැතීම

(අ) ජාතික දේශගුණ විපර්යාස දත්ත හුවමාරු ජාලකරණ පද්ධතියේ ක්‍රියාකාරීත්වය

දේශගුණ විපර්යාස අවම කිරීමේ ක්‍රියාකාරී යහයෝගිතා ව්‍යාපෘතිය මඟින් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමට යෝජනා වූ ජාතික දේශගුණ විපර්යාස සඳහා වූ දත්ත හුවමාරු ජාලකරණ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා 2025 දෙසැම්බර් 31 වන විට රුපියල් මිලියන 45.986 ක් වැය කර තිබුණද අපේක්ෂිත අරමුණු ඉටුකරගත නොහැකිව පැවතුණි. 2021 නොවැම්බර් 19 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපවතින බව සඳහන් කර තිබුණු දෙපර අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ඇතිකර ගනිමින් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් පැවතිය යුතු බව හා මෙම පද්ධතිය දිගින් දිගටම පසුවිපරම් කිරීමේ අවශ්‍යතාවයද එහිදී අවධාරණය කර තිබුණි. පසුගිය විගණන වාර්තා මඟින් ද මේ පිළිබඳව නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණද 2026 මැයි 10 දිනවන විටද පද්ධතිය අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් ලබාගත් තොරතුරු අනුව පරිසර අමාත්‍යාංශය නමින් ලියාපදිංචිකර තිබුණු වාහන සංඛ්‍යාව 244 ක් වූ අතර පරිසර අමාත්‍යාංශය නමින් ලියාපදිංචිකර තිබුණු නමුත් භෞතිකව වාහන පරීක්ෂා කිරීමේදී අමාත්‍යාංශයේ දැනට භාවිතයේ නොමැති වාහන 198 ක් බව නිරීක්ෂණය විය. එම වාහන අතරින් වාහන 159 ක් පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය විසින් හඳුනාගෙන තිබූ අතර එයින් වාහන 04 ක පමණක් අයිතිය නිරවුල් කරගැනීමේ කටයුතු අවසන් කර තිබුණි. ඉතිරි වාහන 39 පරිසර අමාත්‍යාංශය යටතේ පැවති අනෙකුත් ආයතන වෙත පැවරීම් කල බවට හෝ අපහරණය කල බවට හෝ අතුරුදහන් වූ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

4.4 පාඩු හා හානි

